# පෙරදිග සංගීතය

## 8 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2017 සිට ක්‍රියාත්මක වේ)




සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

# 8 වන ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk  විද්‍යුත් තැපැල : info@nie.lk

**පෙරදිග සංගීතය**

**8වන ශ්‍රේණිය**

**ගුරු අත්පොත**

**ප්‍රථම මුද්‍රණය 2016**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් මඟින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක් වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය මඟින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාබුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය උපදේශනය | සුදත් සමරසිංහ අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| කපිල මැද්දෙගොඩ | මධ්‍යස්ථානාධිපති,<br>සම්පත් මධ්‍යස්ථානය, මීගොඩ |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | කථිකාචාර්ය, ගුරු විද්‍යාලය, ගිරාගම. |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| අමරසිරි වික්‍රමරත්න මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,<br>ඔළුවිල්. |

| | |
|---|---|
| **පරිගණක යතුරු ලියනය** | ඩබ්ලිව්. එම්. ධම්මිකා<br>ජයරාණි ගුණතිලක |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහාය** | ප්‍රේමරත්න පෙරේරා<br>එන්. දීපා ශිරෝමණී |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයයක් වශයෙන් හැදෑරීමෙන් දරුවාට පාසල් ජීවිතය තුළ පමණක් නො ව පසු කාලීන ව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවර ප්‍රධාන නිපුණතා 9ක් හඳුන්වා දී ඇති අතර එම නිපුණතා කරා ළඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත. එම නිපුණතා මට්ටම්වල ඉහළ නිපුණතා මට්ටම් කරා සිසුවා ළඟා කරවීම 11වන ශ්‍රේණියේ දී අපේක්ෂිත ය.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලවලින් ලබා ගත් දත්ත, ජාතික මට්ටමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කර ගන්නා ලදි. එසේ ම පළාත් බද සේවාස්ථ අධ්‍යයන සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයන්හි තූර්ය වාදක කණ්ඩායම්වල අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමවුපියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදි.

විෂය නිර්දේශය ප්‍රායෝගික නැඹුරුතාවකින් යුතු ව ගොඩනගා ඇති අතර ක්‍රියාකාරකම් සඳහා හඳුන්වා දී ඇති ගුණාත්මක යෙදවුම් හැකිතාක් යොදා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම ගුරුභවතාගේ වගකීම යි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ යටතේ හඳුන්වා දී ඇති නිදර්ශක ඇගයීම් උපකරණ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් දරුවන්ගේ ඇගයීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබට සක්‍රිය ව දායක වීමට සිදු වේ. එසේ ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු වන ආකාරයට ඉතා දක්ෂ ලෙස ප්‍රායෝගික කොටස්වල නිපුණත්වයට දරුවා ළඟා කරවීම ද, පෙලඹවීම ද ගුරුභවතාගේ වගකීම වේ.

ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හඳුන්වා දී ඇති ප්‍රවේශවලට අමතර ව වෙනත් සුදුසු ක්‍රමවේද නිර්මාණශීලී ව යොදා ගැනීමේ හැකියාව හා නිදහස ඔබට ඇත. ක්‍රියාකාරකමෙහි දක්වා ඇති ඉගෙනුම් පල ළඟා කර ගත හැකි වන අයුරින් වඩාත් ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීම තුළින් සාර්ථක ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ඔබට හැකි වනු ඇත.

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| හැඳින්වීම | v-vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x-xiii |
| වාර සටහන | xiv-xv |
| ක්‍රියාකාරකම් සන්තතිය | 01-89 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ආයතනය දේශයේ සමස්ත දරු කැල වෙනුවෙන් පාසල් පද්ධතිය වෙත 2015 සිට නිර්දේශ කරන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි දෙවන පියවර 2016 ක්‍රියාවට නැංවේ. ඒ අනුව මෙම වසරේ 7 සහ 11 ශ්‍රේණි සඳහා වූ නව විෂය නිර්දේශයන් නව්‍යකරණයන් සහිත ව හඳුන්වා දෙමින්, එහි ක්‍රියාත්මක භූමිකාව හිමි ගුරුවරයාට නිසි මඟ පෙන්වීම් ලබා දීම පිණිස මෙම ගුරු මාර්ගෝදේශය සකස් කොට ඇත.

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව වසර 8කට වරක් එළැඹෙන මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විසින් ජාතික ආධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා පාසල් පද්ධතියට ඒ ඒ විෂයයන් සඳහා නව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම ශිල්ප, සංකල්ප හඳුන්වා දෙනු ලබන අතර, සෞන්දර්ය විෂයයන්හි මෙතෙක් නිර්දේශිත ගී, කවි, කතා, සංස්කෘතිකමය කරුණු, තේමා, සම්ප්‍රදායයන්හි විවිධත්ව, ඇ සම කාලීන අවශ්‍යතා මත නව දේශීය දර්ශනයට අනුකූල ව අනාගතයට ගැළපෙන පරිදි ඉදිරිපත් කර ඇත.

අප විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී පළමු කොට ම හඳුනා ගන්නා ලද 6-13 තෙක් පුළුල් වූ විෂය සන්ධාරය (Curriculum Grid) නිපුණතා හා නිපුණතා මට්ටම් ලෙස දරුවාගේ වර්ධන හා චින්තන අවධීන්ට අනුව ක්‍රමික ව පෙළගස්වා ඇත. ඒ අනුව 6 හා 10 ශ්‍රේණි සඳහා නිර්දේශිත විෂය කරුණු සමඟ අවියෝජනීය සබඳතාවක් මෙන් ම ක්‍රමික වර්ධනයක් සිදු වන පරිදි 7 සහ 11 ශ්‍රේණි විෂය නිර්දේශ සැලසුම් කොට ඊට අනුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශය රචනා කොට ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය හරහා විෂය නිර්දේශ තුලනාත්මක ව දක්වා ඇති විෂය කරුණු පිළිබඳ සීමා නිර්ණයන් නිවැරැදි ව තෝරා බේරා ගැනීම, දරුවා තුළ සංකල්ප සාධනයෙහි ලා විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ හඳුනා ගැනීම, පාඩම දරුවාට පිළිගැන්වීමෙහි ලා යෝජිත සුවිශේෂ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම යන ශක්‍යතා ප්‍රමාණාත්මක ව ගුරුවරයා වෙත ලැබෙනු ඇත.

අප විෂයමාලා කමිටුව විසින් රචිත මෙම පොත පරිහරණය කරමින් ඔබ, විෂය කරුණුවල අවශ්‍ය මූලික දැනුම අත්පත් කර ගත්ත ද, යෝජිත විෂය කරුණුවල සමාජ භාවිතය පිළිබඳ ඔබගේ අවදිමත් බව වැදගත් ය. ඒ සඳහා විෂය භේදයකින් තොර ව සංගීත කෘතිවලට සවන් දීම, නර්තන, නාට්‍ය ප්‍රසංග හා චිත්‍රපට නැරඹීම, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම ආදිය ඉතා හොඳ ප්‍රබෝධවත් බවක් හා පෙලඹවීමක් ඔබ තුළ ජනිත කරනු ඇත.

ඒ අනුව ගුරු මාර්ගෝපදේශය ද, උදවු අත්පොත ද ඒවායේ ඇතුළත් පණිවිඩ, හැඳින්වීම් ඇතුළු සියල්ල සහිත ව පූර්ණ වශයෙන් ම කියවන්න. ඉන් ගුරුවරයකු ලෙස ඔබ සතු විය යුතු අත්‍යවශ්‍ය ගුණයක් වූ ''කියවීමේ පුරුද්ද'' ඔබට ලැබ ගන්නට හැකි වනු ඇත.

මේ සියලු ව්‍යායාමයන්හි, කර්තව්‍යයන්හි අග්‍ර ඵලය අපගේ දරු පරපුර වෙත ලබා දෙන්නට ඔබගේ ගුරු භූමිකාව ශක්තිමත් වේ වා! යන්න මාගේ ඒකායන පැතුම යි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ,
අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව),
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්පහා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවි ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස,සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජිවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

## (IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
- වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම

යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

## (V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

## (VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

## (VII) 'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# පෙරදිග සංගීත විෂයයේ අරමුණු

1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙළඹෙයි.

3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයින්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි.

4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ප්‍රබලතම අංගය ලෙසට අගය කරමින් සරල ගී සංකල්පයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි.

5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැළකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

6. දේශීය රංග සම්ප්‍රදායන් හා බැඳි රංග ශෛලීන් සහ සංගීත ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි.

7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි.

8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය මට්ටමට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ අභ්‍යාසයේ යෙදෙයි.

9. සංගීතයේ ජීව විද්‍යාත්මක, භෞතික විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම පිළිබඳ අත්හදා බැලීම් කරයි.

10. සංගීත විෂය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගිකව හඳුනා ගනියි.

11. නූතන වෙළඳපොළට ගැලපෙන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙළඹෙයි.

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

ශිෂ්‍යයාගේ විචාර ශක්තිය වර්ධනය කිරීම සඳහා ගණිතය, විද්‍යාව, භාෂාව ආදි විෂයයන් අවශ්‍ය වන්නා සේම ඔවුන්ගේ වින්දන හා නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීම සඳහා සෞන්දර්ය විෂයයන් ඉගැන්වීම අත්‍යවශ්‍ය වේ. නිපුණතා පාදක ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයාගේ සංගීත විෂය හා බැඳි ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම මෙන් ම යහපත් ආකල්ප වර්ධනයෙන් සුසමාහිත පෞරුෂයක් ගොඩනැගීම අපේක්ෂා කෙරේ.

මෙම කාර්යයෙහිලා විවිධ ප්‍රායෝගික අත්දැකීම් ලැබිය හැකි පහත සඳහන් විෂය සමගාමී ක්‍රියාකාරකම්හි සිසුන්ට යෙදීමට අවශ්‍ය අවකාශ සැලසීම ඉතා වැදගත් වේ.

1. ළමා ගීත ගායන වාදන තරග
2. ළමා නාට්‍ය තරග
3. ගායන, වාදන ප්‍රදර්ශන
4. සෞන්දර්ය කලා සංගම් පිහිටුවීම
5. පන්ති මට්ටමේ කෙටි විවිධ ප්‍රසංග
6. වාර්ෂික විවිධ ප්‍රසංග
7. නව නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් ආදේශ භාණ්ඩ නිර්මාණ
8. බැති ගී ප්‍රසංග
9. පරිගණක තාක්ෂණය ඇසුරෙන් නිර්මාණ
10. උදෑසන රැස්වීම ආශ්‍රිතව කරනු ලබන ගායන වාදන ක්‍රියාකාරකම්
11. පාසල අවට ප්‍රදේශයේ පැවැත්වෙන විශේෂ සංගීත උත්සව හා ශාන්තිකර්ම
12. රාජ්‍ය උත්සව හා බැඳි ගායන වාදන අංග
13. පාසල් තූර්ය වාදන කණ්ඩායම්

මෙම ක්‍රියාකාරකම් නිර්දේශිත විෂය කරුණු හා බද්ධ කිරීම තුළින් පන්තිකාමරය තුළ ලද නොහැකි සුවිශේෂ ඉගෙනුම් අත්දැකීම් ලැබීමට සිසුන්ට ඉඩකඩ ලැබේ. එම නිසා සිසුන්ගේ සාමාන්‍ය අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාකාරිත්වය හා විශේෂයෙන්ම ඉගෙනුමට අවශ්‍ය මානසික සූදානම ප්‍රවර්ධනය කර ගැනීමට හැකි වේ.

## තක්සේරුව හා ඇගයීම

පෙරදිග සංගීත විෂය තක්සේරුව හා ඇගයීම සිදුවන්නේ පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සිදුවන අවස්ථාවේදීම ය. අදාළ ක්‍රියාකාරකමට සුදුසු නිර්ණායක භාවිත කරමින් සිසුන් ඇගයීමට ලක් කළ යුතු ය. සිසුන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවාට අවශ්‍ය උපස්ථම්භන ලබාදීමත් සුදුසු ප්‍රතිපෝෂණ ලබාදීමත් මෙහි දී සිදු විය යුතු ය.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමක දී ම තක්සේරුව හා ඇගයීම සිදුකිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථා, තක්සේරවටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදා ගත හැකි වේ.

සිසුන් ක්‍රියාකරකම්වල යෙදෙන අවස්ථාවල දී ඔවුන්ට සමීපව නිරීක්ෂණය කිරීමෙන් ඔවුන්ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයෙකුම අවම ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරයා කටයුතු කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුව නම් වේ. එසේම සිසුන් ස්වයං අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවලදී ඔවුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කරමින් හා විශ්ලේෂණය කරමින් ඇගයීම ක්‍රියාත්මක කළ හැකි වේ.

සිසුන් කණ්ඩායම් සමස්ත පන්තිය හමුවේ සාමූහික ව ඉදිරිපත් කරන අදහස්, ඇගයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිලි වේ. එම අදහස් නිවැරදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමටත් කරණු ලබන ප්‍රයත්න ඇගයීම සඳහා පාදක වන දෙවන අංගය වේ.

# 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන /වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.<br><br>1.2 මිශ්‍ර මත්කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | • බිලාවල් භූපාලි, කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත, සිරිසාර අති ශාන්ත/ ඇහැළ මහට/ සිරස නමමු<br><br>• ජප්තාලය සහ දීප්චන්දි යන හින්දුස්ථානී, තාලපද දෙතිතට අයත් දේශීය තාලපද<br>• හින්දුස්ථානී තාලයක කොටස් (මාත්‍රා විභාග, තාලස්ථාන, ආවර්ත) ($\frac{6}{8}$ Rhythm) | 1.බිලාවල්, භූපාලි, කාෆි, රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත ගායන හැකියා ප්‍රදර්ශනය කරයි.<br><br>2. නිර්දේශිත තාලපද අතින් නිරූපණය කර වෙන්කොට දක්වයි.<br><br>3. හින්දුස්ථානී තාලයක කොටස් හඳුනා ගනියි. | 20 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | • ස්වර පුවරුව සඳහා කෝමළ ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් ගීත<br>• ස්වර පුවරුව මඟින් ළමා ගීත වාදනය<br>• ස්වරවාද්‍ය භාණ්ඩ සඳහා කෝමල ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් ගීත<br>• හස්ත සාධන අභ්‍යාස<br>• සිතාර් එස්රාජ් භාණ්ඩවල ස්වභාවය, ස්වර පිහිටීම, සහ ඉතිහාසය | 1. ස්වර වාද්‍ය භාණ්ඩ මඟින් වාදන හුරුව ලබයි.<br><br>2. සිතාර් එස්රාජ් භාණ්ඩවල මූලික හුරුව ලබයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 3.1 සරල ගීත රසාස්වාදනයේ යෙදෙයි.<br>3.2 භාරතීය ගීත ශෛලීන් රසාස්වාදනයට හුරු වෙයි.<br>3.3 කිතුනු බැති ගී රසාස්වාදනයේ යෙදෙයි.<br>3.4 වාර්ෂික විවිධ ප්‍රසංගය | • සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය<br>• භජන්, රවීන්ද්‍ර ගී ගායනය<br>• භජන්, රවීන්ද්‍ර ගී ශෛලීන්හි විශේෂතා සහ<br>• කිතුනු බැති ගී ගායනය (දෙවන් පහන් මිණි නගා)<br>ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | 1. සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය පැහැදිලි කරයි.<br>2. භජන්, රවීන්ද්‍ර ගී, කිතුනු බැති ගී ගායනයට පෙලඹෙයි.<br>3. මෙතෙක් උගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි. | 11 |
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | • ගැමි ගීයේ විශේෂ ලක්ෂණ<br>• ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී | 1. ගැමි ගී නිර්වචනය කරමින් ඒවා නිර්මාණ -යට බලපෑ හේතු සාධක විමසයි.<br>2. වී ගොවිතැන හා සම්බන්ධ ගැමි ගී ගායනය කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 දමිළ බසින් රචිත ගීතයක් ගායනය<br><br>5.2 මවුපිය ගුණ වරුණ ගීයක් ගායනය | • දමිළ ගීතයක්<br><br>• පියාණනි මා නැවත උපන්නොත්<br>• අම්මා සඳකි<br>• පිතු සෙනෙහේ පිදූ | 1. දමිළ ගී ගයමින් අගය කරයි.<br><br>1. ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මවුපිය ගුණ ඇතුළත් ගී ගයමින් අගය කරයි. | 01<br><br>03 |
| 6.0 රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි. | • නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායයන්හි ශෛලිය, සංගීතය හා විශේෂතා<br>• නාඩගම් සහ නූර්ති ගීත ගායනය<br>• මද්දලය හා පද<br>නව නාට්‍ය ගී ගායනය කරයි.<br>• මූදු පතුල<br>• අන්න බලන් සඳ<br>• දීකිරි දීකිරි<br>• සත්සියක් කපුමල්<br><br>නූර්ති ගී ගායනය කරයි.<br>• ලෝනා මුනි රාජගේ<br>• බෝ දොස් කියා<br>• සිරි ලංකා රජින්දා<br>• සිරිසංඝබෝධි | 1.නාඩගම් සහ නූර්ති රංග ශෛලියේ වෙනස පිළිබඳව අදහස් දක්වයි.<br><br>2. නූර්ති නාඩගම් ගී ගයා වයා අගය කරයි.<br><br>3. නව නාට්‍ය ගී ගයයි .<br><br>ප්‍රචලිත නූර්ති ගී ගයමින් රස විඳියි. | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 1.1 ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි. | • රිද්ම රටාවකට ස්වර යෙදීම<br>• පද කොටස්වලට තනු යෙදීම | 1. තනු නිර්මාණයේ සරල අවස්ථාවක යෙදී අත්දැකීම් ලබයි.<br>2. ගීතයකට තනු නිර්මාණය කිරීමේ මූලික කුසලතා වර්ධනය කර ගනී. | 05 |
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 1.1 ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.<br><br>1.2 බටහිර සංගීත ප්‍රස්තාර කරණයේ මූලිකාංග විමසයි. | • සඳැස්මත් සහ ගීමත්<br>• යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාර<br><br>• රේඛා මණ්ඩලය සහ ඒ මත ස්වර පිහිටීම<br><br>• ප්‍රස්තාරයක දී ස්වර සඳහා යොදා ගනු ලබන විවිධ සංකේත සහ වටිනාකම් | 1. පද ප්‍රස්තාර කිරීමේදී අවශ්‍ය සංකල්ප අධ්‍යයනය කරයි.<br><br>2. බටහිර ප්‍රස්තාරකරණයේ මූලික කුසලතා ලබයි. | 05 |

# 8 ශ්‍රේණිය- පෙරදිග සංගීතය

## වාර සටහන

| පළමු වාරය | | | |
|---|---|---|---|
| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව /ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | 01 | • බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත, ( සිරස නමමු මව් පොළොවට) | 03 |
| 1.2 මිශ්‍ර මත්කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | 02<br>03 | • තාලයක කොටස් (මාත්‍රා විභාග, තාලස්ථාන, ආවර්ථ)<br>• ඣප්තාලය සහ දීප්චන්දි යන හින්දුස්ථානී, තාලපද | 02<br>02 |
| 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | 04<br>05<br>06<br>07<br>08 | • ස්වර පුවරුව මගින් ශුද්ධ ස්වර ඇතුළත් ගීත වාදනය<br>• ස්වරවාද්‍ය භාණ්ඩ සඳහා හස්ත සාධන අභ්‍යාස<br>• ස්වරවාද්‍ය භාණ්ඩ මගින් ශුද්ධ ස්වර ඇතුළත් ගීත වාදනය<br>• සිතාරයේ ස්වභාවය, ස්වර පිහිටීම, සහ ඉතිහාසය<br>• එස්රාජයේ ස්වභාවය, ස්වර පිහිටීම, සහ ඉතිහාසය<br>• ගොයම් ගී ගායනය | 02<br>03<br>03<br>02<br>02 |
| 1.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි | 09 | • නූර්ති ගීත ගායනය ( බෝ දොස් කියා, ලෝනා මුනි රාජගේ ) | 01 |
| 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි | 10<br>11 | • නව නාට්‍ය ගී ගායනය ( මුදු පතුල, අන්න බලන් සඳ යන ගී අතරින් එකක් ) | 01<br>01 |
| දෙවන වාරය | | | |
| 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | 12 | • භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත, (ඇහැල මහට ඇහැල ගහක ) | 03 |
| 1.2 මිශ්‍ර මත්කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | 13 | • ඣප්තාලය සහ දීප්චන්දි තාල පද අතින් නිරූපණය හා බැඳි තාල ක්‍රියාකාරකම් | 02 |

# 8 ශ්‍රේණිය- පෙරදිග සංගීතය
## වාර සටහන

| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව /ක්‍රියාකාරකම | කාල ඡේද |
|---|---|---|---|
| 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | 14<br>15 | • ස්වර පුවරුව මඟින් කෝමල ගනි ස්වර ඇතුළත් ගීත වාදනය<br>• ස්වරවාද්‍ය භාණ්ඩ මඟින් කෝමල ග නි ස්වර ඇතුළත් ගීත වාදනය | 02<br>03 |
| 3.1 සරල ගීත රසාස්වාදනයේ යෙදෙයි.<br>3.2 භාරතීය ගීත ශෛලීන් රසාස්වාදයට හුරුවෙයි. | 16<br>17 | • සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය<br>• භජන්, ගී ගායනය | 01<br>01 |
| 1.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | 18<br>19<br>20 | • නෙළුම් ගී ගායනය<br>• කමත් ගී ගායනය<br>• ගැමි ගීයේ විශේෂ ලක්ෂණ | 02<br>01<br>02 |
| 5.1 දමිළ බසින් රචිත ගීතයක් ගායනය.<br>5.2 මවුපිය ගුණ වරුණ ගීයක් ගායනය | 21<br>22 | • දමිළ ගීයක් ගායනය<br>• පියගුණ වරුණ ගී ගායනය(පියාණනි මා නැවත උපන්නොත් ) | 01<br>01 |
| 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි. | 23<br>24<br>25 | • නූර්ති ගීත ගායනය ( සිරි ලංකා රජින්දා )<br>• නාඩගම් ගී ගායනය<br>• නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායන්හි ශෛලිය, සංගීතය හා විශේෂතා | 01<br>01<br>02 |
| 8.1 ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.<br>8.2 බටහිර සංගීත ප්‍රස්තාර කරණයේ මූලිකාංග විමසයි. | 26<br>27<br>28<br>29 | • සඳැස් මත් සහ ගී මත්<br>• යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාර<br>• රේඛා මණ්ඩලය සහ ඒ මත ස්වර පිහිටීම<br>• බටහිර ප්‍රස්තාරයක දී ස්වර සඳහා යොදා ගනු ලබන විවිධ සංකේත සහ වටිනාකම් | 01<br>01<br>01<br>02 |
| | | | |

| තෙවන වාරය | | | |
|---|---|---|---|
| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව/ක්‍රියාකාරකම් | කාල ඡේද |
| 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | 30 | • කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත, (සිරිසාර, අතිශාන්ත ) | 03 |
| 1.2 මිශ්‍ර මත්කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | 31<br>32 | • දෙතිතට අයත් දේශීය තාලපද<br>• ($6_8$ Rhythm) | 01<br>01 |
| 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | 33<br>34 | • ස්වරවාද්‍ය භාණ්ඩ මඟින් විවිධ ස්වර ඇතුළත් ගීත වාදනය<br>• ස්වර පුවරු භාණ්ඩ මඟින් ළමා ගීතයක් වාදනය | 03<br>03 |
| 3.2 භාරතීය ගීත ශෛලීන් රසාස්වාදනයට හුරුවෙයි.<br>3.3 කිතුනු බැති ගී රසාස්වාදනයේ යෙදෙයි. | 35<br>36<br>37 | • රවීන්ද්‍ර ගී ගායනය<br>• රවීන්ද්‍ර ගී සහ භජන් ගී ශෛලීන්හි විශේෂතා<br>• කිතුනු බැති ගීයක් ගායනය (ලෙවන් පහන් මිණි නගා) | 01<br>01<br>01 |
| 5.2 මවුපිය ගුණ වරුණ ගීයක් ගායනය | 38 | • මවුගුණ වරුණ ගී ගායනය (අම්මා සඳකි, පිතු සෙනෙහේ පිදූ යන ගී අතරින් දෙකක්) | 02 |
| 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි. | 39<br>40<br>41 | • නූර්ති ගීත ගායනය ( සිරි සංඝබෝධි )<br>• මද්දලය හා පද<br>• නව නාට්‍ය ගී ගායනය ( දීකිරි දීකිරි, සත්සියක් කපුමල් යන ගී අතරින් එකක් ) | 01<br>01<br>01 |
| 7.0 ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි. | 42<br>43 | • රිද්ම රටාවකට ස්වර යෙදීම<br>• පද කොටස්වලට තනු යෙදීම | 02<br>03 |
| 3.4 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසාංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | 44 | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 06 |

ක්‍රියාකාරකම 1

# බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 03

**ඉගෙනුම් පල** :

- බිලාවල් රාගයේ යෙදෙන ස්වර හඳුනා ගනියි.
- ස්වරස්ථාපන ගී ගායන ආධුනිකයකුට වැදගත් වන බව පිළිගනියි.
- බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.
- බිලාවල් රාගයේ ස්වර නිවැරදිව ගයයි.
- රාගධාරී සංගීතය හැදෑරීමට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- ''සිරස නමමු මවු පොළොවට'' ගීතය ප්‍රස්තාර කොට දක්වන ලද දෘශ්‍ය උපකරණය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

8 ශ්‍රේණියට පිවිසෙන සිසුන් මේ වන විට ස්වර ස්ථාපන ගීත රාශියක් අධ්‍යයනය කර ඇත. පාසල් සංගීත අධ්‍යාපනයේ දී රාගධාරී සංගීත අධ්‍යාපනයට පිවිසෙන්නේ 8 ශ්‍රේණියේ දී ය. පාසල් අධ්‍යාපනයේ නිර්දේශිත රාග පදනම් කරගෙන ඩබ්ලිව්. බී. මකුලොලුව සූරීන්ගේ මග පෙන්වීම් අනුව වින්සන්ට් සෝමපාල, ආනන්ද ජයසිංහ, පියසේන ප්‍රේමකීර්ති, රත්න දිසානායක, සුගතදාස මලල්ගොඩ. ඇම්. ජී. සුගතදාස, සුමනදාස නන්දසේන, සිරිල් පෙරේරා, වැනි සංගීත වියතුන් මීට පෙර සංගීත අධ්‍යාපනයට එක් කර ඇති විවිධ ස්වරස්ථාපන ගීත අදත් පාසල් සංගීත අධ්‍යාපනයේ භාවිත ව පවතී. එකවර මධ්‍යලය ගීත යොදා ගැනීම වෙනුවට පාසල් අධ්‍යාපනයේ පැවති එවැනි රාගධාරී පසුබිම සහිත සරල, කුඩා ගීත මුලින් ම යොදා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත. ඒ අනුව බිලාවල් රාගයේ ස්වර ස්ථාපනය සඳහා ''සිරස නමමු මවු පොළොවට'' යන ගීතය මෙම ශ්‍රේණියට යොදා ගත හැකි ය. මීට අමතර ව ප්‍රමාණවත් කාලයක් ඉතිරි ව ඇත්නම් ගුරුවරයා වශයෙන් ඔබට ද, බිලාවල් රාගධාරී පසුබිම සහිත ව නිර්මාණය කරගත් ගීත බිලාවල් ස්වර ස්ථාපනය සඳහා යොදා ගත හැකි ය.

පාඩම සංවර්ධනය

පියවර 01 :

- අඩවන් වූ දෙනෙතින් ගලනා ගීතය ගයා රස විඳිමින් පාඩමට පිවිසෙන්න. මීට පෙර පන්තිවල දී අධ්‍යයනය කළ ශුද්ධ ස්වරස්ථාපන ගීතයක් සිසුන් සමඟ ගායනය කරන්න. එහි ස්වර ප්‍රස්තාරය ද ගයන්න.
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. එම ගීතයේ පද පිළිවෙළින් උච්චාරණය කරන්න.

(මිනිත්තු 10)

පියවර 02 :

- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති ස්ථායි අන්තරා පද සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරමින් ගායනයට හුරු කරන්න.

(මිනිත්තු 30)

- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති ස්ථායී අන්තරා ස්වර ප්‍රස්තාරය සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරමින් ගායනයට හුරු කරන්න.
  (ඔබ නිර්මාණය කර ගත් බිලාවල් රාගාශ්‍රිත ස්වරස්ථාපන ගීතය ද හුරු කළ හැකි ය.)

(මිනිත්තු 40)

**පියවර 03 :**

- බිලාවල් රාගයේ ස්වර ස්ථාපනය වී ඇත් ද යි විමසීමට විවිධ ක්‍රියාකාරකම්වල යොදවන්න. අධ්‍යයනය කළ ගීතයෙන් තෝරාගත් විශේෂ ස්වර සංගති කොටස් වෙන් කර ගනිමින් එම ස්වර සංගති ගායනයට හුරු කරවන්න. (මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පුහුණු කළ ගීතය කුඩා කණ්ඩායම් වශයෙන් ගෙන ගායනයට සලස්වා සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :**

- නිදහස් කාලවල දී බිලාවල් ස්වර ගායනය කිරීමට යොමු කරන්න. ක්‍රමයෙන් එය වේගවත් ගායනයක් දක්වා යොමු කර ස්වර වේගවත් ව ගයවන්න.

ඇමුණුම

ස්ථායි

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | ම | ප | ග | ම | රි | ස | රි | ග | රි | ස | ස |
| සි | ර | ස | න | ම | මු | ම | වි | පො | ළො | ව | ට |
| ස | ග | ග | ග | ම | රි | ග | ම | ධ | ප | - | - |
| දෑ | S | අ | හි | මා | S | නෙ | න් | අ | පී | S | S |

අන්තරා

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | · | | · | · | · | |
| ප | - | ප | නි | ධ | නි | ස | - | ස | ස | ස | - |
| ආ | S | දි | සී | හ | ල | සි | ං | හ | ල | ලේ | S |
| නි | ධ | නි | ස | රි | - | නි | ස | ධ | ප | - | - |
| නෑ | S | හැ | ඬු | වේ | S | බි | ය් | වෙ | ලා | S | S |
| ප | ධ | නි | ස | - | රි | නි | ස | ධ | ප | ග | ග |
| ඒ | S | උ | දා | S | ර | ලෙ | යි | න් | උ | ප | න් |
| ම | රි | ග | ම | ප | ප | ග | ම | රි | ස | - | - |
| අ | පි | ම | වි | බි | ම | ර | ක් | නෙ | මූ | S | S |

මහනුවර මුල් ගම්පොළ එම්. ජී. පී. කලායතනාධිපති ඩබ්. සිරිල් පෙරේරා ගුරුතුමන් අතින් පද හා තනු නිර්මිත බිලාවල් රාගාශ්‍රිත ගීතයක් පහත දැක්වේ. (අල්හයියා බිලාවල් අංග ඇත.)

| | | | |
|---|---|---|---|
| ස නි ධ | ප ම ග | ම රි ග | ම ප ප |
| පෙ ර දි | ග අ ඹ | රේ S නැ | ග එ න |
| ග ම රි | ග ම ප | ග ම රි | ස - - |
| දි න ක | ර රැ ස් | වි හි දු | මා S S |
| ග ප ප | නි ධ නි | ස - ස | ස ස ස |
| මි හි ක් | ත ස න | සා S ලො | ව න වි |
| ස රි ග | රි ස නි | ධ <u>නි</u> ධ | ප - - |
| දි න් ය් | ක් ක ර | මි න් උ | දා S S |
| ග රි ස | රි ස නි | ධ ප ම | ග ම ප |
| තු රු ලි | ය ම ල් | ප ල බ | ර අ තු |
| ග ම රි | ග ම ප | ග ම රි | ස - - |
| සි ය ආ | S සි රි | ඉු ද දෙ | ති S S |

# තාලයක කොටස්

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02

**ඉගෙනුම් පල** :
- මාත්‍රා,විභාග, තාලස්ථාන,ආවර්ත යන පාරිභාෂික පද පැහැදිලි කරයි.
- එම කොටස් තාලයක පිහිටන අයුරු විස්තර කරයි.
- තාල හා සම්බන්ධ ප්‍රායෝගික අවස්ථාවල දී එක් එක් කොටසේ ඇති වැදගත්කම පිළිබඳ තර්ක කරයි.

**ගුණාත්මක යෙදවුම්**
- තාල පදයක කොටස් වෙන් කර දැක්වූ දෘශ්‍ය උපකරණයක්.
- ඇමුණුමේ දක්වා ඇති දෘශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මූලික තාල පද පිළිබඳ මීට පෙර පන්තිවල දී සිසුන් අධ්‍යයනය කර ඇති අතර, හින්දුස්ථානි තාල පද හා සම්බන්ධ සිද්ධාන්තමය විෂය කරුණු අධ්‍යයනය ආරම්භ කරනුයේ මෙම වර්ෂයේ සිට ය. මිශ්‍ර තාල පද පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය ද මෙම ශ්‍රේණියට නියමිත අතර තාල පදයක ඇති කොටස් පිළිබඳ අධ්‍යයනය කිරීම ද යෝජනා කර ඇත. ඒ අනුව මාත්‍රා, විභාග, තාලස්ථාන, ආවර්ත යන පාරිභාෂික පද පිළිබඳ සරල ව අධ්‍යයනයට යොමු කිරීම අපේක්ෂිත ය.

පාඩම සංවර්ධනය

**පියවර 01 :**
- සිසුන් මීට පෙර අධ්‍යයනය කර ඇති තාල පදයක් තෝරා ගන්න. එය සිසුන්ට ප්‍රදර්ශනය කර වාදනය කර පෙන්වන්න. නැතහොත් ශ්‍රව්‍ය පටයකින් ශ්‍රවණයට යොමු කරන්න. එසේ කිරීමට කුසලතා හා පහසුකම් නොමැති නම් තෝරාගත් තාල පදය අතින් නිරූපණය කර පෙන්වන්න. (මිනිත්තු 10)

**පියවර 02 :**
- තාල පදයක කොටස් නම් කර ඇති දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. කියවීම සඳහා සකස් කර ගෙන ඇති පත්‍රිකාව සිසුන්ට සපයන්න. දෘශ්‍ය උපකරණයේ දක්වා ඇති තාල පදයේ කොටස් පිළිබඳ විස්තරයක් කිරීම සඳහා සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව හෝ සූදානම් කරන්න.

(මිනිත්තු 30)

**පියවර 02 :**
- එක් එක් කොටස පිළිබඳ කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව හෝ සිසුන්ගෙන් තොරතුරු විමසන්න. සාකච්ඡා කරන්න. ඔබගේ අදහස් එක් කරන්න.

(මිනිත්තු 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සියලු ම විෂය කරුණු ආවරණය වන සේ සකස් කර ගත් ප්‍රශ්නාවලියක් මගින් සිසුන් අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :
- නිර්දේශිත සියලු ම තාල පදවල මෙම පාඩමෙන් අධ්‍යයනය කළ පාරිභාෂික පද හා බැඳි කොටස් යෙදෙන අයුරු සෙවීමට යොමු කරන්න.


**ඇමුණුම**

දෘශ්‍ය උපකරණ අංක 1 ( ත්‍රි තාලය )

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| ඨේකාව | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| තාලසංඥා | X | | | | 2 | | | | 0 | | | | 3 | | | |
| | සමග්‍රහය | | | | 2 වන අනුතාලය | | | | ඛලිය | | | | තුන්වන අනුතාලය | | | |
| | විභාග | | | | විභාග | | | | විභාග | | | | විභාග | | | |

ආවර්තන 01

දෘශ්‍ය උපකරණ අංක 2 ( ආවර්තය )




**කියවීමේ පත්‍රිකාව**

මාත්‍රා : තාලයක කුඩා ම ඒකකය මාත්‍රාවයි. මාත්‍රාවක් යනු තාලයේ දී කාලය මනින ඒකකය යි. ලය අනුව මාත්‍රාවක් සඳහා ගත වන කාලය අඩු හෝ වැඩි හෝ වේ.

විභාග : මාත්‍රා කිහිපයක් එක් වීමෙන් විභාගයක් සෑදේ. බටහිර සංගීතයේ මෙය හඳුන්වන්නේ BAR යන නමිනි.

ඨේකා : තාලයක අවනද්ධ පදය මේ නමින් හැඳින්වේ. උදා - දාදාරා තාලයේ ඨේකාව ධධින/ධතුන

සමග්‍රහ: තාලයක ආරම්භක ස්ථානයේ යොදන තාල සංඥාව X ලකුණින් ලියා දක්වේ. තාලයකට ඇත්තේ එක් සමග්‍රහයක් පමණි. මෙය තාලයේ ප්‍රබලතම ස්ථානය ලෙස හැඳින්වේ. මෙය විභාගයේ පළමු මාත්‍රාව මත යෙදේ. අතින් තාල දැමීමේ දී ඒ මත අත්පුඩියක් ගසයි.

බලිය : තාලයක දුර්වලතම ස්ථානය ලෙස හඳුන්වයි. කිසියම් තාලයක බලිස්ථාන එකකට වඩා තිබිය හැකිය. එය ලියා දැක්වීමේ දී '0' ලකුණ භාවිත වේ. බොහෝ විට තාලය මධ්‍යයේ මෙම සංඥාව පිහිටයි. බොහෝ විට බලිස්ථානයේ යෙදෙන්නේ තිං/ති වැනි අක්ෂර වේ. අත්තල යෙදීමේ දී අත්පුඩි නොගසා අත ඉවතට යොදා පෙන්වයි.

අනුතාලː තාලයක සමග්‍රහය හා බලිය හැරුණු විට සෙසු තාල ස්ථාන හඳුන්වනු ලබන්නේ අනුතාල නමිනි. ලියා දැක්වීමේ දී 2, 3, 4 ආදි වශයෙන් ඉලක්කම් යෙදේ. ඒ ඒ විභාගයේ පළමු මාත්‍රාව මත යෙදේ. අතින් තාල දැමීමේ දී අත්පුඩියක් ගසයි. මෙය තාලයක සමග්‍රහය තරම් ප්‍රබල නොවූව ද බලියට වඩා ප්‍රබල ය.

ආවර්තන : තාලපදයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව තෙක් සම්පූර්ණ කොටස ආවර්තයක් ලෙස හැඳින්වේ. තාලපදයක් එක් වරක් වැයීම එක් ආවර්තයකි. 2 වරක් වැයීම ආවර්ත 2කි.

## හින්දුස්ථානි තාල පද (ඣප්තාල් - දීප්චන්දි)

**ක්‍රියාකාරකම 3**

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02

**ඉගෙනුම් පල** :
- මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානි තාල පද නම් කරයි.
- එම තාල පද හඳුන්වයි.
- ඣප්තාල්, දීප්චන්දි තාල අතින් නිරූපණය කරයි.
- නියමිත තාල පද වෙන් කොට දක්වයි.
- තාල අතින් නිරූපණය කර පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්**
- තාල පද ප්‍රස්තාර කර දැක්වූ දෘශ්‍ය උපකරණයක්.
- තබ්ලාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මූලික තාල පද පිළිබඳව මීට පෙර පන්තිවල දී සිසුන් අධ්‍යයනය කර ඇත. මිශ්‍ර මත් කැටි සහිත තාල පද පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය මෙම පාඩමින් අපේක්ෂිත ය. ශිෂ්‍යයා ශ්‍රවණය කරන ගීතයකට අදාළ තාලය තමාට ම හඳුනා ගත හැකි වන අයුරින් තාල අවබෝධය ලබා දීම මෙම පාඩම ඉගැන්වීමෙන් අපේක්ෂිත ය.

ඣප්තාලයේ සහ දීප්චන්දි තාලයේ තාල පද හඳුනා ගැනීමටත්, එම තාල පද මත අත්තැළීමටත් හුරු කරන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 01 :
- දාදා රා හෝ කෙහෙර්වා හෝ තාලයකට නිර්මාණය වී ඇති සිසුන් දන්නා ගීතයක් රසවත් ව ඉදිරිපත් කරන්න. එම ගායනයට අත්තැළීමට යොමු කරන්න.
  අත්පුඩි දෙකක් අතර ඇති මාත්‍රා සංඛ්‍යාවන් සාකච්ඡා කරන්න.
  (මිනිත්තු 10)

පියවර 02 :
- ඇමුණුමේ දක්වා ඇති සරල ගී අතරින් ඣප්තාලයට සහ දීප්චන්දි තාලයට වර්ග වන ගීත දෙකක් තෝරා ගන්න. එම ගීතවල කොටස් ගායනය කර අතින් තාල තැබීමට යොමු කරන්න. මුල දී ඉදිරිපත් කළ ගීතයේ තාලයට වඩා මෙම ගීතයේ තාලයේ ඇති වෙනස සාකච්ඡා කරන්න.
- ඇමුණුමේ දක්වා ඇති සරල ගී පාද ප්‍රදර්ශනය කරන්න. ඒවා ඣප් තාලයට සහ දීප්චන්දි තාලයට වෙන් කරවන්න. ඣප්තාලයට සහ දීප්චන්දි තාලයට වෙන් කළ ගීතවල නිවැරදිතාව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (මිනිත්තු 30)

පියවර 03 :
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එක් එක් තාල පදය නිවැරදි ව ප්‍රස්තාර කිරීමට යොමු කරන්න. තාල පද කියමින් අත්පුඩි ගැසීමට යොමු කර තාලය නිවැරදි ව ග්‍රහණය කර ගැනීමට උපකාරී වන්න.
  (මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- ඔබ දන්නා ගී පද හෝ නිර්මාණය කරගත් ගී පද හෝ ගායනය කර පෙන්වා ඒවායේ තාලය විමසන්න. නිවැරදි පිළිතුරු අගයන්න.
  (මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :
- ඣප්තාලය හා දීප්චන්දි තාල පද මත නිර්මාණය වූ ගීත එක්රැස් කිරීමට යොමු කරන්න.

ඇමුණුම 01

**උපදෙස් පත්‍රිකාව**

## හින්දුස්ථානි තාල

| නම | සංඥාව | අත්තල යෙදීමේ දී කළ යුතු දේ |
|---|---|---|
| සමග්‍රහය | X | මෙම සංඥාව යොදා ඇති ස්ථානයේ දී අත්පුඩියක් ගසන්න. |
| ඛලිය | O | මෙහි දී අත ඉවතට යොදන්න. (අත්පුඩි නොගසා) |
| අනුතාල | 2 3 | මෙහි දී අත්පුඩියක් ගසන්න |
| මාත්‍රා | 1 2 3 4 | සංඥාවක් යොදා නොමැති ඉලක්කම්වල දී වම් අතේ අත්ල මත දකුණතේ සුළැඟිල්ල, වෙදඟිල්ල, මැදැඟිල්ල යන අනුපිළිවෙළට ඇඟිලි තුඩු තබන්න. (එක් අක්ෂරයකට එක බැගින්) |

**ඇමුණුම 02**

ගුරුවරයා ගයා වයා ඉදිරිපත් කරන විට ශ්‍රවණය කර පහත දැක්වෙන ගී පාද ඣප් තාලයට සහ දීප්චන්දි තාලයට වෙන් කරන්න.

1. රන්වන් කරල් සැලෙයි සන්සුන් කමින් බරව.
2. ලෝකයක් නසන්නට රුදුරු අවි අත දරා සැරසෙමු ද
3. ඇසේ මතු වන කඳුළු බිඳු ගෙන
4. මොකද මැණිකේ හණික යන්නේ
5. සැඳෑ කළුවර කුරගගා විත්
6. සිනහවෙන් හෝ කතාවෙන් බෑ මනින්නට මිනිසා.
7. සිරි සාර අතිශාන්ත රමණීය හෙළ දීප

**ඇමුණුම 03**

ඣප්තාලය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා: | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| ථේකාව: | ධි | න | ධි | ධි | න | ති | න | ධි | ධි | න |
| තාල සංඥා: | X | | 2 | | | 0 | | 3 | | |

දීප්චන්දි තාලය

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා: | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ථේකාව: | ධ | ධිං | s | ධ | ධ | ධිං | s | ත | තිං | s | ධ | ධ | ධිං | s |
| තාල සංඥා: | X | | | 2 | | | | 0 | | | 3 | | | |

**ක්‍රියාකාරකම 4**

# ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.1** : ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය කරයි.
- තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳ ප්‍රායෝගිකව අත්දැකීම් ලබා ගනී.
- ගීත වාදනය කිරීමේ හැකියාව ලැබීමෙන් තම ජීවිතයට වටිනාකම් ලැබුණු බව දැන සතුටු වේ.
- තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම 1 හි සඳහන් ගීත අතරින් ශුද්ධ ස්වර යෙදෙන ගීත කීපයක ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා.
- ස්වර පුවරු වාදන ඇතුළත් DVD VCD PEN ආදී උපකරණ
- DVD VCD PEN ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර පුවරු වාදනයේ සතත අභ්‍යාසයේ යෙදුනු සිසුවකුට මේ වන විට තරමක් සංකීර්ණ ගීතයක් වුව වාදනය කිරීමේ හැකියාව තිබිය හැක. එහෙත් පොදුවේ සලකා ගීත තෝරා ගැනීම කළ යුතු ය. ඇමුණුම 01 හි සඳහන් ගීත ලැයිස්තුව අතරින් ඔබගේ පන්ති කාමරයේ සිටින සිසුනට ගැළපෙන ගී දෙකක් තෝරා ගන්න. සිසුනගේ දක්ෂතාවය අනුව ගීත දෙකකට වඩා වාදනය කරවීමේ නිදහස ඔබ සතු ය. ස්වර පුවරුව තම ජීවිතයට බද්ධ කර ගැනීමට සිතෙන අයුරින් පාඩම මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- පෙර පන්තිවල දී වැයූ ස්වර රටා ආදිය නැවත වාදනය කරමින් පාඩමට පිවිසෙන්න.
- ස්වර පුවරු වාදනයක් නැරඹීමට සලස්වා එහි අගය හා වටිනාකම පහදා දෙන්න.
- දක්ෂ ලෙස වාදනය කිරීම සඳහා සතත අභ්‍යාසයේ ඇති වටිනාකම හා වාදන හැකියාව මගින් ජීවිතය අරුත් ගන්වා ගත හැකි ආකාරය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ශුද්ධ ස්වර සහිත ගීතයන්හි ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා. සිසුන් අතට පත් කොට හෝ ප්‍රදර්ශනය කොට වාදනය කිරීමට පොළඹවන්න.
- එක් එක් සිසුවාගේ ස්වර පුවරු භාණ්ඩයන් මගින් විවිධ සංගීත භාණ්ඩයන්ගේ හඬ (වයලින්/සිතාර්/බටනලා ) භාවිත කරමින් ගීතයේ කොටස් වෙන් වෙන්ව වාදනය කරවන්න.

(මිනිත්තු 10)

**පියවර 03**

- සිසු සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර හෝ තනිතනි ව වාදනය කිරීමට සලස්වන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කොට ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි වාදනයක තිබිය යුතු ගුණාංග සියල්ල නිරීක්ෂණය වන සේ ඇගයීම් සැලසුම සකසා ගන්න.

(මිනිත්තු 20)

**පැවරුම** : නිවසේ දී අභ්‍යාස කිරීම සඳහා වෙනත් ගී කිහිපයක ස්වර ප්‍රස්තාර ලබා දෙන්න. මේ සඳහා ඔබගේ නිර්මාණ ද භාවිත කළ හැකි ය.

**අතිරේක උදව්** : ගී ප්‍රස්තාර ඇතුළත් ගී පොත්

ඇමුණුම 01 - **ගීත ලැයිස්තුව**

1. ලංකා ලංකා පෙම්බර ලංකා
2. ලලිත කලා ඔප කරනා
3. අඩවන් වූ දෙනෙතින් ගලනා
4. **වෙර වීරිය ඇතත් පුතේ**
5. නිල් අහස් තලේ
6. **මල් පිබිදී ගෙන එන්නේ**

**ක්‍රියාකාරකම 5**

# ස්වර වාද්‍ය සඳහා හස්ත සාධන අභ්‍යාස

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.1** : ස්වර වාද්‍ය භාණ්ඩ සඳහා හස්ත සාධන අභ්‍යාස

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :
- ස්වර වාද්‍ය භාණ්ඩයන්හි ස්වර ඉපදවීම පිළිබඳ ව හුරුව ලබා ගනියි.
- තමා වයන වාද්‍ය භාණ්ඩයේ හස්ත සාධන ක්‍රම හඳුනා ගනියි.
- හස්ත සාධන අභ්‍යාස වාදනය කිරීම මගින් වාදන හැකියාවන් දියුණු කර ගනියි.
- වාදන හැකියාව මගින් තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම 1හි සඳහන් ඒ ඒ වාද්‍ය භාණ්ඩයන්ට අදාළ හස්ත සාධන අභ්‍යාස ඇතුළත් පත්‍රිකා.
- වාදන ඇතුළත් DVD VCD PEN DRIVE ආදී උපකරණ
- DVD VCD PEN DRIVE ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ඔබ ඉදිරියේ සිටින 8 ශ්‍රේණියේ සිසුන් මේ වන විට ස්වර අභ්‍යාස ස්වර ස්ථාපන ගීත සරල ගීත ආදිය වාදනය කර ඇත. මෙම පාඩමේ අභිප්‍රායය වනුයේ ඔවුන් සතු හැකියාවන් වාද්‍ය භාණ්ඩයන්ගේ අනන්‍යතා ලක්ෂණයන්ට අනුකූල ව වර්ධනය වන පරිදි සැකසූ හස්ත සාධන අභ්‍යාස වාදනය කරවීම ය. තෝරා ගත් වාද්‍ය භාණ්ඩයේ හසුරු කුසලතා වර්ධනය කරනු ලබන අභ්‍යාසය ම මේ සඳහා යොදා ගත යුතු ය. උදාහරණයක් ලෙස වයලින් එස්රාජ් වැනි භාණ්ඩයන්හි බෝව භාවිතයේ ශිල්ප ක්‍රම, එමෙන් ම සිතාරයේ මිස්රාබය හැසිරවීමේ ශිල්ප ක්‍රම යනාදී වශයෙනි. ස්වර වාදනය දියුණු කළ යුත්තේ ඉහත පෙන්වා දුන් පරිදි ආවේණික ශිල්ප ක්‍රම ද සමගම ය.

ඇමුණුම 01හි දී ඇති ස්වර අභ්‍යාස මේ සඳහා භාවිත කරන්න. ඒවා ඇසුරින් නව අභ්‍යාස නිර්මාණය කර වාදනයට සලස්වන්න. කෝමල ග හා කෝමල නි සහිත අභ්‍යාස මෙම අභ්‍යාස ඇසුරින් ගොඩනගා වාදනයට සලස්වන්න. මෙම පාඩම සඳහා ශුද්ධ ස්වර අභ්‍යාස මෙන් ම කෝමල ග හා කෝමල නි සහිත අභ්‍යාස ද සම සම ව භාවිත කළ යුතු ය.

භාණ්ඩ රැගෙන ඒම සඳහා නියමිත දිනට සතියකට පෙර වත් දැනුම් දීමෙන් මෙම පාඩම වඩාත් සාර්ථක කර ගත හැකි වනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- පන්තියේ වයන භාණ්ඩයන්ට අදාළ වාදන කීපයක් කෙටියෙන් හෝ නැරඹීමට සලස්වන්න.
- දිනට නියමිත පාඩමට අදාළ විශේෂ ශිල්ප ක්‍රම වීඩියෝ දර්ශන මගින් නැවත නැවත උපුටා දක්වමින් ඒවා පිළිබඳ ව සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.
- අවශ්‍ය සම්පත් නොමැති නම් ඔබට වාදනය කරමින් අදාළ සාකච්ඡාව මෙහෙයවිය හැකි ය.

(මිනිත්තු 15)

**පියවර 02**
- භාණ්ඩ අනුව කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 01හි සඳහන් අභ්‍යාස භාණ්ඩ අනුව බෙදා දෙන්න.
- නිරන්තරයෙන් ම කියා දීමට නොපෙලඹී සිසුනට උපදෙස් අවශ්‍ය වූ තැන දී පමණක් සහාය වන්න. (පළමු කාලච්ඡේදයෙන් මිනිත්තු 15/ දෙවන කාලච්ඡේදයෙන් මිනිත්තු 40)

**පියවර 03**
- භාණ්ඩ අනුව හෝ තනි තනි ව හෝ වාදනය කිරීමට සලස්වන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කොට ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

භාණ්ඩය නිවැරදි ඉරියව්වෙන් වැයීම, ස්වර ස්ථානයන්ගේ නිවැරදි බව, ආවේණික ශිල්ප ක්‍රම හඳුනා ගෙන නිවැරදි ව වාදනය කිරීම ආදිය ඇගයීමට ලක් කළ හැකි වන පරිදි ඇගයීම සකසා ගන්න. ඇගයීම අවසානයේ දී සිදු කරනු ලබන ප්‍රතිපෝෂණයෙන් පසු සිසුවාට නිවැරදි ව වාදනය කිරීමේ හැකියාව ලැබිය යුතු ය.

(මිනිත්තු 20)

**පැවරුම** : නිවසේ දී අභ්‍යාස කිරීම සඳහා වෙනත් ස්වර අභ්‍යාස ලබා දෙන්න.

**අතිරේක උදව්** : ඔබ සපයාගෙන ඇති DVD සහ PEN DRIVE ඇතුළත් වාදන කොටස් සිසුන්ට නැරඹීමට සලස්වන්න.

# ස්වර වාද්‍ය භාණ්ඩය මගින් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.1** : ස්වර වාද්‍ය භාණ්ඩය මගින් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :
- ස්වර වාද්‍ය භාණ්ඩයෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය කරයි.
- ස්වර වාද්‍ය භාණ්ඩයෙන් ශුද්ධ ස්වර නිවැරදි ව වාදනය කිරීමට පුහුණු වෙයි.
- තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනියි.
- ගීත වාදනය කිරීමේ හැකියාව ලැබීමෙන් ජීවිතයට වටිනාකම් ලබා ගනියි.
- තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ශුද්ධ ස්වර සහිත ගීතයන් කීපයක ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා.
- ස්වර පුවරු වාදන ඇතුළත් DVD, VCD, PEN DRIVE ආදි උපකරණ
- DVD, VCD, PEN DRIVE ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

6 ශ්‍රේණියේ සිට වාද්‍ය භාණ්ඩ වාදනයේ යෙදුණු සිසුනට තම භාණ්ඩයට අයත් ශිල්ප ක්‍රම සුළු වශයෙන් හෝ භාවිත කරමින් වාදනය කරවීමට හැකි වන සේ මෙම පාඩම සැලසුම් විය යුතු ය. ඇමුණුම 01හි යෝජිත ගීත එකක් හෝ භාවිත කරන්න. වෙනත් සුදුසු ගීත ද භාවිත කිරීමේ නිදහස ඇත. අවම ගීත දෙකක් වාදනය කරවිය යුතු ය. සිසුනගේ දක්ෂතාව අනුව විවිධ සරල ශිල්ප ක්‍රම (මධ්‍ය සප්තකයෙන් හා තාර සප්තකයෙන් ) අනුගමනය කරමින් වාදනය කරවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- පෙර පන්තිවල දී වැයූ ස්වර රටා ගීත ආදිය නැවත වාදනය කරමින් පාඩමට පිවිසෙන්න.
- දක්ෂ ශිල්පීන්ගේ වාදනයක් නැරඹීමට සලස්වා එහි අගය හා වටනාකම පහදා දෙන්න.
- දක්ෂ ලෙස වාදනය කිරීම සඳහා සතත අභ්‍යාසයේ ඇති වටිනාකම හා වාදන හුරුව තුළින් ජීවිතය අරුත් ගන්වා ගත හැකි ආකාරය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- වත්මන් ශ්‍රී ලංකාව තුළ වෘත්තීය වාදකයකු වීමේ සාපල්‍යතාව පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 15)

**පියවර 02**
- ඇමුණුම 1හි සඳහන් ශුද්ධ ස්වර සහිත ගීත 3ක ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා. ඉන් එක් ගීතයක ප්‍රස්තාරයක් සිසුන් අතට පත් කොට හෝ ප්‍රදර්ශනය කොට හෝ වාදනය කිරීමට පොලඹවන්න.
- භාණ්ඩ අනුව වර්ග කොට ඒ ඒ භාණ්ඩයන්ට කොටස් වෙන් කර දී වාදනය කරවන්න.
- ඉතිරි ගීත දෙකේ ස්වර ප්‍රස්තාර ද ලබා දී වාදනය කරවන්න. ගුරු මඟ පෙන්වීම ලබා දෙන්න. (මිනිත්තු 25)

පියවර 03

- සිසු සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර හෝ තනි තනි ව හෝ වාදනය කිරීමට සලස්වන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කොට ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

භාණ්ඩය නිවැරදි ඉරියව්වෙන් වැයීම, ස්වර ස්ථානයන්ගේ නිවැරදි බව, ආවේණික ශිල්ප ක්‍රම හඳුනා ගෙන නිවැරදි ව වාදනය කිරීම ආදිය ඇගයීමට ලක් කළ හැකි වන පරිදි ඇගයීම සකසා ගන්න. ඇගයීම අවසානයේ දී සිදු කරනු ලබන ප්‍රතිපෝෂණයෙන් පසු සිසුවාට නිවැරදි ව වාදනය කිරීමේ හැකියාව ලැබිය යුතු ය.

(මිනිත්තු 10)

පැවරුම : ඇමුණුමට අදාළ ඉතිරි ගීතවල ප්‍රස්තාර ලබා දෙන්න. විවේක අවස්ථාවන්හි දී පුහුණු වීමට කටයුතු කරන්න. මේ සඳහා ඔබගේ නිර්මාණ ද භාවිත කළ හැකිය.

**අතිරේක උදවු** :

- ගීත ප්‍රස්තාර සහිත ග්‍රන්ථ
- ඔබ සපයා ගෙන ඇති DVD, VCD, සහ PEN DRIVE ඇතුළත් වාදන කොටස් සිසුන්ට නැරඹීමට සලස්වන්න.

ඇමුණුම 01

01. මල් පිබිදී ගෙන එන්නේ
02. නිල් අහස් තලේ අගේ
03. අද වෙස්සන්තර රාජ පුතා
04. ලලිත කලා ඔප කරනා
05. ඕළු පිපීලා වෙල ලෙළ
06. ආදරේ ඇයි පොඩි හඳ මාමේ

# සිතාරයේ ස්වභාවය හා ස්වර පිහිටීම

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.1** : සිතාරයේ ස්වභාවය හා ස්වර පිහිටීම

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- සිතාරයේ ව්‍යුහය පිළිබඳ ව අවබෝධ කර ගනියි.
- සිතාරයේ ස්වර පිහිටීම හඳුනා ගනියි.
- මිහිරි නාදයක් නිපදවන භාණ්ඩයක් බව වටහා ගනියි.
- සිතාරය අධ්‍යයනය කිරීමට කැමැත්ත පළ කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම 1, ඇමුණුම 2, ඇමුණුම 3
- සිතාරයක්
- වාදන ඇතුළත් DVD VCD PEN ආදී උපකරණ
- DVD VCD PEN ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සිතාරය අපට ඉන්දියාවෙන් උරුම වූ සංගීත භාණ්ඩයක් වුවත් අද වන විට එය ලාංකේය සංගීතයේ අනන්‍යතාව පිළිබිඹු කරන තරමේ සංගීත භාණ්ඩයක් බව ට පත්ව ඇත. එහි ව්‍යුහය, ස්වර පිහිටීම පිළිබඳ ව අවබෝධ කරදීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

ඇමුණුම 1 භාවිතයෙන් එහි කොටස් හඳුන්වා දෙන්න. ඒ සමගම ඇමුණුම 2 ඉදිරිපත් කොට සිතාරය පිළිබඳ අවශ්‍ය තොරතුරු සපයන්න. රූප සටහන් හා විස්තර සිසුනගේ සටහන් පොතෙහි සටහන් විය යුතු ය. ඇමුණුම 2 තොරතුරු පත්‍රිකාව සැකසීමේ දී පසු ගිය 8 ශ්‍රේණියේ 69 පිටෙහි සඳහන් තොරතුරු ගුරු කොට ගන්න.

ඇමුණුම 3 භාවිතයෙන් ස්වර පිහිටීම පිළිබඳ ව සිසුනට ම අධ්‍යයනය කිරීමට උපදෙස් දෙන්න. (මෙම ඇමුණුම් සඳහා මීට වඩා සුදුසු යැයි හැඟෙන ඇමුණුම් භාවිත කිරීමේ නිදහස ඔබට ඇත.) ඇමුණුම 3 භාවිතයෙන් ස්වර පිහිටීම ලකුණු කිරීමට මඟ පෙන්වීමේ දී 7 වසරේ ස්වර පාඩමේ ස්වර 12 පිහිටීම නැවත මෙනෙහි කොට සිතාරයේ ස්වර ලකුණු කිරීම සිසුන් විසින් ම සිදු කිරීමට ඉඩ හරින්න. කෝමල ඍෂභය හා කෝමල ධෛවතය සඳහා පර්දා නොමැති බව සිසුනට පවසන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- රවි ශංකර්, නිකිල් බෙනර්ජි වැනි දක්ෂ ශිල්පීන්ගේ නිර්මාණ නැරඹීමට සලස්වන්න.
- පාඩමට අදාළ විශේෂ ශිල්ප ක්‍රම වීඩියෝ දර්ශන මඟින් නැවත නැවත උපුටා දක්වමින් සිතාර් වාදනයේ ඇති මිහිරියාව පිළිබඳ ව සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඇමුණුම 1 සමග සිතාරය සංසන්දනය කරමින් සිතාරයේ කොටස් හඳුනා ගැනීමට සලස්වන්න.
- ඇමුණුම 2 තොරුතුරු පත්‍රිකාව ඇසුරින් සිතාරය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරමින් සටහන් පොතෙහි සටහනක් ගොඩ නඟන්න.

- ඇමුණුම 3 ප්‍රදර්ශනය කර ස්වර පිහිටීම අධ්‍යයනයට පොලඹවන්න.
- එහි ෂඩ්ජය වාදනය කරනු ලබන ස්ථානය පෙන්වා සෙසු ස්වර පිහිටීම පිළිබඳ ව ඔවුන්ගේ දැනුම අනුව සිතා බැලීමට යොමු කරන්න.
- ස්වර දොළහේ පිහිටීම සිහිපත් කරන්න.
- කෝමල ඍෂභය හා කෝමල ධෛවතය සඳහා පර්දා නොමැති බව පෙන්වා දෙන්න
- තනි ව ම ස්වර පිහිටීම ලකුණු කිරීමට යොමු කොට නිරන්තරයෙන් ම අධීක්ෂණය කරන්න.

(මිනිත්තු 40)

**පියවර 03**

- සිතාරයේ කොටස් පෙන්වා ඒවා පිළිබඳ ඇති මතකය පිරික්සන්න.
- සෑම සිසුවකු විසින් ම සටහන් කරන ලද ස්වර පුවරුව බලා නිවැරදි කරන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**


ඉගෙනුම් ඵලයන් ලෙස අපේක්ෂිත සියල්ල ඇගයීමට ලක්වන සේ ඇගයීම් සැලසුම සකසා ගන්න.

(මිනිත්තු 10)

**පැවරුම** : සිතාරය පිළිබඳ ව කුඩා පොත් පිංචක් සැකසීමට යොමු කරන්න.


**අතිරේක උදවු** : සිතාරය පිළිබඳ ව ලියැවී ඇති පොතපත.

**ඇමුණුම 1** – මේ සඳහා 2008 ගුරු මාර්ගෝපදේශයෙහි 67-71 පිටුවල ඇමුණුම් ද භාවිත කළ හැකි ය.







මිස්රාබය



**ඇමුණුම 2**

තොරතුරු පත්‍රිකාව (පසුගිය 8 ශ්‍රේණිය පොතෙහි 69 පිට බලන්න.)

**ඇමුණුම 3**



# එස්රාජයේ ස්වභාවය හා ස්වර පිහිටීම

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.1** : එස්රාජයේ ස්වභාවය හා ස්වර පිහිටීම

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- එස්රාජයේ ව්‍යුහය පිළිබඳ ව අවබෝධ කර ගනියි.
- එස්රාජයේ ස්වර පිහිටීම හඳුනා ගනියි.
- බෝවෙන් වයන සෙසු වාද්‍ය භාණ්ඩයන්ට වඩා මිහිරි හඬක් ඇති බව හඳුනාගෙන පවසයි.
- එස්රාජය අධ්‍යයනය කිරීමට කැමැත්ත පළ කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම 1, ඇමුණුම 2, ඇමුණුම 3
- එස්රාජයක්
- වාදන ඇතුළත් DVD VCD PEN ආදී උපකරණ
- DVD VCD PEN ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

එස්රාජය ද ඉන්දියාවෙන් උරුම වූ සංගීත භාණ්ඩයක් වුවත් එය ද ශ්‍රී ලංකාවේ භාවිත භාණ්ඩයක් බවට පත් ව ඇත. භාරතයේ ශාන්ති නිකේතනයේ වඩාත් ප්‍රචලිත භාණ්ඩයකි එස්රාජය. එහි ව්‍යුහය ස්වර පිහිටීම පිළිබඳව අවබෝධ කර දීම මෙම පාඩමෙන් අපේක්ෂිත යි.

ඇමුණුම 1 භාවිතයෙන් එහි කොටස් හඳුන්වා දෙන්න. ඒ සමගම ඇමුණුම 2 ඉදිරිපත් කොට එස්රාජය පිළිබඳ අවශ්‍ය තොරතුරු සපයන්න. රූප සටහන් හා විස්තර සිසුන්ගේ සටහන් පොතෙහි සටහන් විය යුතු ය. ඇමුණුම 2 තොරතුරු පත්‍රිකාව සැකසීමේ දී පසු ගිය 8 ශ්‍රේණියේ 70 පිටෙහි සඳහන් තොරතුරු ගුරු කොට ගන්න.

ඇමුණුම 3 භාවිතයෙන් ස්වර පිහිටීම පිළිබඳ ව සිසුනට ම අධ්‍යයනය කිරීමට උපදෙස් දෙන්න. (මෙම ඇමුණුම් සඳහා මීට වඩා සුදුසු යැයි හැඟෙන ඇමුණුම් භාවිත කිරීමේ නිදහස ඔබට ඇත.) ඇමුණුම 3 භාවිතයෙන් ස්වර පිහිටීම ලකුණු කිරීමට මඟ පෙන්වීමේ දී 7 වසරේ ස්වර පාඩමේ ස්වර 12 පිහිටීම නැවත මෙනෙහි කොට එස්රාජයේ ස්වර ලකුණු කිරීම සිසුන් විසින් ම සිදු කිරීමට ඉඩ හරින්න. මේ සඳහා පසුගිය 8 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයෙහි 68 පිට ද ආදර්ශයට ගත හැකි ය. කෝමල ඍෂභය හා කෝමල ධෛවතය සඳහා පර්දා නොමැති බව සිසුනට පවසන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- එස්රාජ් වාදනයක් නැරඹීමට සලස්වන්න.
- පාඩමට අදාළ විශේෂ ශිල්ප ක්‍රම වීඩියෝ දර්ශන මගින් නැවත නැවත උපුටා දක්වමින් එස්රාජ් වාදනයේ ඇති මිහිරියාව පිළිබඳ ව සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඇමුණුම 1 සමඟ එස්රාජය සංසන්දනය කරමින් එස්රාජයේ කොටස් හඳුනා ගැනීමට සලස්වන්න.
- ඇමුණුම 2 තොරතුරු පත්‍රිකාව ඇසුරින් එස්රාජය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරමින් සටහන් පොතෙහි සටහනක් ගොඩ නගන්න.

- ඇමුණුම 3 ප්‍රදර්ශනය කර ස්වර පිහිටීම අධ්‍යයනයට පොලඹවන්න.
- සිතාරයේ ස්වර පිහිටීම පිළිබඳ ව සිසුන් ලද දැනුම අනුව එස්රාජයේ ස්වර පිහිටුවීමට සිසුන් යොමු කරන්න.
- කෝමල ඍෂභය හා කෝමල ධෛවතය සඳහා පර්දා නොමැති බව පෙන්වා දෙන්න
- තනි ව ම ස්වර පිහිටීම ලකුණු කිරීමට යොමු කොට නිරන්තරයෙන් ම අධීක්ෂණය කරන්න.

(මිනිත්තු 40)

**පියවර 03**

- එස්රාජයේ කොටස් පෙන්වා ඒවා පිළිබඳ ඇති මතකය පිරික්සන්න.
- සෑම සිසුවකු විසින් ම සටහන් කරන ලද ස්වර පුවරුව බලා නිවැරදි කරන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඉගෙනුම් ඵලයන් ලෙස අපේක්ෂිත සියල්ල ඇගයීමට ලක්වන සේ ඇගයීම් සැලසුම සකසා ගත යුතුය.


(මිනිත්තු 10)

**පැවරුම** : එස්රාජය පිළිබඳ ව පුවත්පතකට ලිපියක් සැකසීමට සිසුන් පොලඹවන්න.

**අතිරේක උදව්** : එස්රාජය පිළිබඳ ව ලියැවී ඇති පොතපත.

**ඇමුණුම 1** – මේ සඳහා 2008 ගුරු මාර්ගෝපදේශයෙහි 68 පිටුවෙහි ඇමුණුම් ද භාවිත කළ හැකි ය.


# Esraj



**ඇමුණුම 2**

තොරතුරු පත්‍රිකාව (පසුගිය 8 ශ්‍රේණිය පොතෙහි 70 පිට බලන්න.)

**ඇමුණුම 3**



# ගොයම් ගී ගායනය

**නිපුණතාව 1.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 1.1** : කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : ගොයම් ගී ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- ගොයම් ගීත ගායනය කරයි.
- දේශීය අනන්‍යතාව පැහැදිලි වන මෙම ගීතවල වටිනාකම අගය කරයි.
- සාමූහික බව දනවන ගීත විශේෂයක් බව පිළිගනියි.
- ගොයම් කැපීමේ දී ගයන ගීත විශේෂයක් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට, බටනළාව
- ගොයම් ගීතයක් ලියූ දෘශ්‍යාධාරයක්
- ''..සිරිසරු සාර කෙතේ ගොයම් පැසීලා මහිමේ...'' , ගොයම් පැසීලා කුඹුරේ, කහවන් ගොයමට යන ගීතවලින් එකක් ලියූ දෘෂ්‍යාධාරකයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ගොයම් ගී යනු ගොයම් කැපීමේ දී ගයන ගීත විශේෂයක් බවත්, සාමූහික බව දනවන, සරල නාද රටාවලින් යුක්ත වූ, මෙහෙ ගී විශේෂයක් බවත්, සිසුන්ට පහදා දෙන්න. සාම්ප්‍රදායික නාදමාලාවන්ට අනුව ගොයම් ගීයක් ගායනය කිරීමට ප්‍රායෝගික ව පුහුණු කිරීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ.

පහත සඳහන් ගොයම් ගීතවලින් ගුරුවරයා කැමති ගීතයක් ඉගැන්විය හැකි ය.

- රිදියෙන් තනලා රත්රන් ඔපලා - කැරලි කෙටුවයි දැකැත්තේ
- උදයට පායන හිරු දෙවියන්ටයි
- රන් දෑ කැති ගෙන
- සිටිති පෙළින් පෙළ රන්තරු විලසට

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ''සිරිසරු සාර කෙතේ'' ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා මෙම ගීතය මිහිරි ව ගායනා කළ යුතු ය.
- ගැයූ ගීතයේ වචනවලින් ප්‍රකාශ වන අර්ථයට අනුව පැහැදිලි වන්නේ කුමන පසුබිමක් ගැනදැ යි සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ගොයම් ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය ගායනා කරන විට, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සාම්ප්‍රදායික නාද මාලාවට අනුව පාදයෙන් පාදය ගායනා කරවන්න.
- උචිත තිතට තාල තබමින් ගායනය කරවන්න.
- ගොයම් ගීතවල ලක්ෂණ පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 25)

පියවර 03 • උගත් ගොයම් ගීය කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත්ම මිහිරි ව හා නිවැරදි ව ගායනය කළ කණ්ඩායම හෝ කේවල ව ගැයූ සිසුන් තෝරා පන්තිය ඉදිරියට කැඳවා අගය කරන්න.

(මිනිත්තු 5)

**පැවරුම** : නිදහස් කාලවල දී ගොයම් ගීත ගායනයට පුහුණු වන්න.

**අතිරේක උදව්** : 2010, 9 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශය
සිංහල ජනකවි සංග්‍රහය

ගීතය :- සිරිසරු සාර කෙතේ ගොයම් පැසීලා මහිමේ
පිසගෙන එන සුළඟේ කරල් නැමී නැමී දිලේ
හා හා ඇසේ ඇසේ - හා හා ඇසේ ඇසේ

ගොවි දන තුති නද දී
කපති ගොයම් තොසේ තොසේ
යමු යමු හණික නගෝ
අපි ද ගොයම් කපන ලෙසේ
හිමිදිරියේ - හිමිදිරියේ
හිමිදිරි සිරිය ළඟා වේ

පාමින තුටු කොමල සිනා
දිනරද අඹරේ නැගෙනා
කොවුලන් ගී හඬ ඇසෙනා
ලක් මව සැනසේ නිතිනා
හිමිදිරියේ - හිමිදිරියේ
හිමිදිරි සිරිය ළඟා වේ

**ගායනය :- ආනන්ද සමරකෝන් / ස්වර්ණා ද සිල්වා**
**රචනය - සංගීතය :- ආනන්ද සමරකෝන්**

(1) රිදියෙන් තනලා රත්රන් ඔබලා කැරලි කෙටූවයි දැකැත්තේ
සුරතට රන්වන් විලි පාහාලා කදිමට දිලිසෙහි දැකැත්තේ
අඩියෙන් අඩියට තාල තියන්නට සබයෙන් අවසර ලැබ ගත්තේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන් ගොයම් කපමු අපි දැකැත්තේ

(2) උදයට පායන හිරු දෙවියන්ටයි
සවසට පායන සඳ දෙවියන්ටයි
සතර වරම් දෙවි සතර දෙනාටයි
වැඳලා ගුරුවර අවසර ගන්ටයි

(3) රන් දෑකැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉණවට දිලිසෙනවා
රිවිඳුටු පිනි බිඳු ලෙස පහවෙනවා
දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

(4) සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එම විට
දමති එරන් කැති මාරුව අහසට
කපති ගොයම් අඟනෝ බැස කුඹුරට

# නූර්ති ගීත ගායනය

**නිපුණතාව 1.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 1.1** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : නූර්ති ගීත ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ශෛලිය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි.
- නූර්ති ගීත ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලබා ගනියි.
- නූර්ති ගීත ශ්‍රවණය කිරීමට කැමැත්ත දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ගීත ලියූ දෘශ්‍යාධාර
- සර්පිනාව, තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

රාමායණය, විධුර, ශ්‍රී වික්‍රම රාජසිංහ, වෙස්සන්තර, දුටුගැමුණු, නූර්තිවලට අදාළ ගීත 6, 7 ශ්‍රේණිවල දී අධ්‍යයනය කර ඇත. එම ගීත පන්ති කාමරයේ දී මිහිරි ව ගායනය කළ ආකාරය මතක් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- බෝ දොස් කියා - වෙස්සන්තර නූර්තිය
- ලෝනා මුනි රාජගේ - හේමමාලි නූර්තිය

යන ගීත දෙකින් ගුරුවරයාට අභිමත ගීතයක් ඉගැන්වීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- මීට පෙර පන්තිවල දී උගත් නූර්ති ගීතවලින් කැමති ගීත කිහිපයක් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ ගීත පිළිබඳ ව අදහස් දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 08)

**පියවර 02**
- ගීතය ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා සර්පිනාව වාදනය සමඟ ගීතය ගායනා කරමින් ශ්‍රවණයට සලසන්න.
- කොටසින් කොටස ගායනයට හුරු කරවන්න.
- කණ්ඩායම් මාරු කරමින්, විවිධ ක්‍රම ශිල්ප යොදා ගනිමින් ගීතය තහවුරු වන සේ නැවත නැවත ගායනය කරවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කේවල ව හා කණ්ඩායම් වශයෙන් ගීතය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගායනය හා රංගනයන් සමඟ ඉදිරිපත් වීමට කැමති සිසුන්ට ද අවස්ථාවක් ලබා දෙන්න.
- සිසුන් ගායනය කරන විට ගුරුවරයා වාදනයෙන් සහාය වන්න.
- සිසු අභ්‍යාස පොතේ ගීතය ලියා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 08)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ගායනය සමඟ රංගනය ද දක්ෂ ලෙස ඉදිරිපත් කළ සිසුන් කැඳවා අගය කරන්න.

(මිනිත්තු 04)

**පැවරුම** : 6, 7 ශ්‍රේණිවල දී ඉගෙන ගත් ගීත සමඟ මෙම ගීතය ද නිදහස් කාලච්ඡේදවල දී පුහුණු වන්න. ගීත එකතු කර පොත් පිංචක් සකස් කර ගැනීම ඵලදායී වන බව පහදා දෙන්න.

**අතිරේක උදව්** :

නාට්‍ය - වෙස්සන්තර

රචක - ජෝන් ද සිල්වා

ගීතයට අදාළ චරිතය - ජූජක බමුණා

බෝ දොස් කියා මාගෙ බෝ දොස් කියා

සිවි දේසේ වැසියො කිපී//

පන්නා මා ලූ ය මෙවන //

බෝ දොස් .............................

දාසින් ලබා ගෙනා - සම්බ වෙන්ට සුන්දරී //

යන්නටා හැකී වේ දෝ //

දානෙ දෙයි ද වෙස්සන්තර //

බෝ දොස් ............................

නාට්‍ය - හේමමාලි

රචක - චාල්ස් ඩයස්

ගීතයට අදාළ චරිතය - හේමමාලී කුමරිය

ලෝනා මුනි රාජාගේ ශ්‍රී දළදා පෙන්වමී //

මාගේ හිසකේ ගර්භයෙහී // සඟවා ගෙන ආ සාදරෙන් - ලෝනා මුනි.......

අත්ලට ස්වාමී ගේ වඩවමී // - දාඨා දා අප දිය නාගේ - ලෝනා මුනී ...........

# නව නාට්‍ය ගී ගායනය

**නිපුණතාව 1.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 1.1** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : නව නාට්‍ය ගී ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** : නව නාට්‍ය ගීත ගායනය කරමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** : මූදු පතුල හා අන්න බලන් සඳ ගීත පටිගත කළ CD හෝ VCD පට හා එම යන්ත්‍ර, තෝරා ගත් ගී පද ලියන ලද දෘශ්‍ය පත්‍රිකාවක්, 2007 ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය, ස්වර පුවරුවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

නාඩගම් හා නූර්ති නාට්‍ය ගීත ගායනය කර ඇති සිසු දරුවන් මේ වන විට රූපවාහිනියෙන් හෝ අන්තර්ජාලයෙන් හෝ විවිධ නාට්‍ය ගීත නරඹා අසා හුරු පුරුදු නිසා සිසුනට නව නාට්‍ය ගීතයක් ගායනයට හුරු කිරීම එතරම් අපහසු නොවේ. මේ සඳහා නිර්දේශිත වන්නේ

| | | | |
|---|---|---|---|
| **කුණ්ඩලකේශී නාට්‍යය** | | **මූදු පුත්තු නාට්‍යය** | |
| නිෂ්පාදනය: | පී. වැලිකල | නිෂ්පාදනය: | ගුණසේන ගලප්පත්ති |
| සංගීතය: | සෝමදාස ඇල්විටිගල | සංගීතය: | ලයනල් අල්ගම |
| ගී පද: | මහගම සේකර | ගී පද: | මහගම සේකර |

මේ පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න. ඉහත සඳහන් ගී දෙක අතුරෙන් ගායනය පුහුණු කිරීම සඳහා එක් ගීතයක් තෝරා ගන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- තෝරා ගත් ගීතය ශ්‍රවණය කිරීමට හෝ රූප රාමු සහිත නම් නැරඹීමට හෝ සලස්වන්න. ගීතය අයත් නාට්‍ය, පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. ඒ සඳහා දායකත්වය සැපයූවන් පිළිබඳ ව විස්තර කරන්න. ගීතය හොඳින් ශ්‍රවණය කිරීමෙන් අනතුරු ව ස්වර පුවරුව හෝ වෙනත් සංගීත භාණ්ඩයක් හෝ ආධාරයෙන් රසවත් ව ගායනය කරන්න.

(මිනිත්තු 05)

පියවර 02
- පන්තිය කොටස් තුනකට බෙදන්න. එක් කණ්ඩායමක් ගායනය සඳහාත්, දෙවෙනි කණ්ඩායම රංගනය සඳහාත්, ගුරුවරයා සමඟ සහාය වාදනයේ යෙදිය හැකි සිසුවකු හෝ කිහිප දෙනෙකු හෝ තුන්වැනි කණ්ඩායම සඳහාත් බෙදා ගන්න.
- සමස්ත පන්තියට ම ගුරුවරයා විසින් ගායනය පුහුණු කරන විට රංගනය සඳහා තෝරාගත් කණ්ඩායමට ගී පද අරුතට ගැළපෙන ලෙස අංග චලන සකසා ගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20)

පියවර 03
- එක් එක් කණ්ඩායමට පැවරූ කාර්ය පිළිබඳ ව ඔවුන්ගේ අත්දැකීම් සමස්ත පන්තියට ම ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ව හා මිහිරි ව ගායනය කළ කණ්ඩායම් හා තනි තනි ව ගායනය කළ සිසු/සිසුවියන් පන්තියට හඳුන්වා දී අගයන්න.

(මිනිත්තු 05)

පැවරුම :

- වාර අවසාන විවිධ ප්‍රසංගය සඳහා මෙය යොදා ගැනීමට සිසුන් මෙහෙයවන්න.
- මේ ගීතය ගායනයේ සුවිශේෂී දක්‍ෂතා දැක්වූ ළමයි හඳුනා ගෙන ඔවුන් සංගීත තරග සඳහා යොදා ගැනීමට කටයුතු කරන්න.

**අතිරේක උදව් :**

**පි. වැලිකල - කුණ්ඩලකේෂී**

අන්න බලන් සඳ රන් තැටියෙන් සුදු සීත ගඟුල් ගලනා
හද සෝක තැවුල් නිවනා
චන්දන පල්ලව කෝකිල කූජන සංගීතයේ පැටලී
සුන්දර මේ වන ගුල්ම යහන් ගැබ ආදර බස් කියනා
අත් පසුරෙන් තුරු පෙම්බරයන් බඳ බන්දා සෙනේ සිතිනී
ලියවැල් පැටලී ගොසිනී
පුෂ්ප පිපී මකරන්ද ගලා එයි මාරුතයේ හැපිලා
මන්මද රංගන මණ්ඩපයේ මෙම මන්ද බලා හිඳිමිනේ
තව පෙම්බර මා ස්වාමිනේ

**ගුණසේන ගලප්පත්ති - මූදුපුත්තු නාට්‍යය**

මූදු පතුල යට ඉඳලා - මුතු කැටයක නිදි කරවා
පෙණ කැටියක පා කරලා - මගේ දෝතට පුතු ආවා
සුදු පාටින් පහන් තරුව - දුර අහසේ දිලිසෙනවා
සුදු පාටින් ටිකිරි සිනා - පුතුගේ මුවින් ගිලිහෙනවා
වෙරළෙන් කිරි කවඩි සොයා - කෙනෙක් පුතුට ගෙන එනවා
තවත් කෙනෙක් පාට පාට - පබළු කඩෙන් ගෙන එනවා
ඒ කවඩියි මේ පබුළුයි - එක නූලේ අමුණනවා
ඒවායින් හවඩි සදා - පුතුගෙ ඉණේ පලඳිනවා

# භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 03

**ඉගෙනුම් පල** :
- භූපාලි රාගයේ යෙදෙන ස්වර හඳුනාගනියි.
- සංගීත අධ්‍යාපනයේ ආධුනිකයකු ලෙස ස්වර ස්ථාපන ගී ගායනයේ වටනාකම පිළිගනියි.
- භූපාලි රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.
- භූපාලි රාගයේ ස්වර නිවැරදි ව ගයයි.
- රාගධාරී සංගීත අධ්‍යාපනයට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**
- ''ඇහැළ මහට ඇහැළ ගහක'' ගීතය ප්‍රස්තාර කොට දක්වන ලද දෘශ්‍ය උපකරණය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

8 ශ්‍රේණියේ සිසුන් පළමු වාරයේ දී බිලාවල් රාගශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් අධ්‍යයනය කර ඇත. මෙම වාරයේ දී භූපාලී රාගයේ ස්වර ස්ථාපනය සඳහා **''ඇහැළ මහට ඇහැළ ගහක''** යන ගීතය මෙම ශ්‍රේණියට යොදා ගත හැකි ය. මීට අමතර ව ප්‍රමාණවත් කාලයක් ඉතිරි ව ඇත්නම් ගුරුවරයා වශයෙන් ඔබට ද, භූපාලි රාගධාරී පසුබිම සහිත ව නිර්මාණය කරගත් ගීත භූපාලි රාගයේ ස්වර ස්ථාපනය සඳහා යොදා ගත හැකි ය.

**පාඩම සංවර්ධනය**

**පියවර 01**
- මීට පෙර අධ්‍යයනය කළ බිලාවල් ස්වර ස්ථාපන ගීතයක් සිසුන් සමඟ ගායනය කරන්න. එහි ස්වර ප්‍රස්තාරය ද ගයවන්න.
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. බිලාවල් රාගයේ යෙදෙන ස්වර සහ භූපාලි රාගයේ යෙදෙන ස්වර අතර වෙනස පැහැදිලි කරන්න.
- භූපාලි ගීතයේ පද පිළිවෙළින් උච්චාරණය කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති ස්ථායී අන්තරා පද සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරමින් ගායනය හුරු කරන්න.

(මිනිත්තු 30)
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති ස්ථායි අන්තරා ස්වර ප්‍රස්තාරය සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරමින් ගායනය හුරු කරන්න.
(ඔබ විසින් නිර්මාණය කර ගත් භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතය ද හුරු කළ හැකි ය. )

(මිනිත්තු 40)

**පියවර 03**

භූපාලි රාගයේ ස්වර ස්ථාපනය වී ඇත් දැයි විමසීමට විවිධ ක්‍රියාකාරකම්වල යොදවන්න. අධ්‍යයනය කළ ගීතයෙන් තෝරාගත් විශේෂ ස්වර සංගති කොටස් වෙන් කර ගනිමින් එම ස්වර සංගති ගායනය හුරු කරවන්න.

(මින්ත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පුහුණු කළ ගීතයේ තෝරා ගත් කොටස් ගායනයට සලසා සදොස් තැන් නිදොස් කරන්න. (විනාඩි 10)

**පසු අභ්‍යාස** :

- නිදහස් කාලවල දී භූපාලි ස්වර ගායනය කිරීමට යොමු කරන්න.
- ස්වර වේගවත් ව ගායනයට යොමු කරන්න.
- නිදහස් කාලවල දී භූපාලි රාගාශ්‍රිත සරල ගීත ගායනයට යොමු කළ හැකි ය.
  (සටනෙකි ජීවිතේහි දූන්, කුණ්ඩුමණී)

**අතිරේක උදවු :**

ඇමුණුම

ස්ථායි

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස̇ | ස̇ | ධ | ප | ග | ග | රි | ග | රි | ස | ස | රි |
| ඇ | හැ | ල | ම | හ | ට | ඇ | හැ | ල | ග | හ | ක |
| ස | ස | ධ̣ | ස | ස | - | රි | ස | රි | ග | - | - |
| කො | ළ | ස | ශ | වා | s | ම | ල් | පි | පී | s | s |
| ස | රි | ග | රි | ග | ප | ග | ප | ධ | ස̇ | - | - |
| නි | කි | ණී | ම | හ | ට | පි | ය | වි | ළී | s | s |
| ස̇ | ධ | ප | ධ | ප | ග | ප | ග | රි | ස | - | - |
| බි | ම | ට | හෙ | ළ | යි | පෙ | ති | හැ | ළී | s | s |

අන්තරා

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | - | ග | ප | ග | ග | ප | ධ | ප | ස̇ | - | - |
| යා | s | ය | ඇ | ස | ළ | ස | ඳ | ගෙ | වී | s | s |
| ස̇ | රි̇ | ග̇ | රි̇ | ස̇ | රි̇ | ස̇ | ධ | ප | ග | - | - |
| ප | රි | ස | ර | ය | ම | අ | ඹු | රු | වී | s | s |
| ස | - | රි | ග | ප | ධ | ස̇ | - | - | - | - | - |
| පෑ | s | ත | කු | ස | ස | රේ | s | s | s | s | s |
| ස̇ | - | ධ | ප | ග | රි | ස | - | - | - | - | - |
| ඒ | s | සි | රි | ඇ | ස | ළේ | s | s | s | s | s |

# ඝඩප්තාල් - දීප්චන්දි තාල හා බැඳි නිර්මාණාත්මක ක්‍රියා

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2 :** මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** : ශුද්ධ ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානී තාල පද නම් කරයි.
- තාල සහ රිද්ම රටා මඟින් ද රස ජනනය වන බව පිළිගනියි.
- ඝඩප්තාල්, දීප්චන්දි තාල රටා නිර්මාණාත්මක ව අතින් නිරූපණය කරයි.
- මිශ්‍ර මත් කැටි සහිත රිද්ම රටා ගොඩ නඟයි.
- එම රිද්ම රටා/තාල රටා විවිධ උපකරණ සහ භාණ්ඩ මඟින් වයා පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මිශ්‍ර මත් කැටි සහිත තාල පද අනුව විවිධ රිද්ම රටා ප්‍රස්තාර කර දැක්වූ දෘශ්‍ය උපකරණයක්.
- හඬ නිපදවිය හැකි උපකරණ කිහිපයක් (උණ බෙර, ලී කැබලි වැනි) තබ්ලාව තම්මැට්ටම වැනි අවනද්ධ භාණ්ඩ කිහිපයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මීට පෙර පාඩම්වල දී මිශ්‍ර මත් කැටි සහිත තාල පද සිසුන් අධ්‍යයනය කර ඇත. **ඝඩප්තාල්** සහ **දීප්චන්දි** තාල හා බැඳි නිර්මාණාත්මක රිද්ම රටා ප්‍රායෝගික ව යොදා ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

ශිෂ්‍යයාට ශ්‍රවණය වන ගීතයකට අදාළ, ගැළපෙන තාල රටාවක් උපකරණයකින් හෝ අවනද්ධ භාණ්ඩයකින් හෝ වැයීමත්, සුදුසු තාල රටා ගොඩ නඟමින් සාමූහික ව කණ්ඩායම් වශයෙන් කොටස් බෙදා ගනිමින් වාදනය කිරීමත් මෙම පාඩමේ තවත් අරමුණකි. හින්දුස්ථානී ක්‍රමයේ තාල නිරූපණයට අමතර ව අත, අතැඟිලි යොදා ගනිමින් විවිධ තාල රටා නිරූපණයටත් මෙම පාඩමින් මඟ පෙන්විය හැකි ය.

පාඩම ආරම්භයේ දී මුලින් අධ්‍යයනය කළ **ඝඩප්තාල්** සහ **දීප්චන්දි** තාල යළි සිහිපත් කරවන්න. මී ළඟට එක් එක් තාලය හා බැඳි ගීත කිහිපයක් ගුරුවරයා ගයන වයන විට ඊට ගැළපෙන ලෙස තෝරාගත් අවනද්ධ භාණ්ඩයකින් හෝ උපකරණයකින් තාල රටා වැයීමට යොමු කරන්න. මී ළඟට **ඝඩප්තාලය** හා **දීප්චන්දි** තාලය මත රිද්ම රටා කිහිපයක් නිර්මාණය කරවන්න. පසු ව ඒවා සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදා දෙමින් අලංකාර රිද්ම වාදනයක් ලෙසට වාදනය කරවන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- **ඝඩප්තාලයට** හෝ **දීප්චන්දි** තාලයට හෝ නිර්මාණය වී ඇති සිසුන් දන්නා ගීතයක් රසවත් ව ඉදිරිපත් කරන්න. එම ගායනයට අත්තැළීමට යොමු කරන්න. කුමන තාලයකට අයත් දැයි විමසන්න. විවිධ රිද්ම රටා මතු වන අයුරින් එම ගීතයට අත, අතැඟිලි යොදා ගනිමින් විවිධ තාල රටා නිරූපණයට පොලඹවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- තාල පිළිබඳ මුල් පාඩමේ දී භාවිත කළ සරල ගී අතරින් ඛඩප්තාලයට සහ **දීප්චන්දි** තාලයට විභාග වන ගීත දෙකක් තෝරා ගන්න. එම ගීත ගුරුවරයා ගයන/වයන විට ඊට ගැළපෙන තාල රටාවක් නැතහොත් රිද්ම රටාවක් සිසුන් ලවා වාදනය කරවීමට යොමු කරන්න. විවිධ රිද්ම රටා භාවිත කිරීමට මඟ පෙන්වන්න.

(මිනිත්තු 30)

- රිද්ම රටා සහිත දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. ඒ අනුව යමින් ඛඩප්තාලයට සහ දීප්චන්දි තාලයට ගැළපෙන විවිධ රිද්ම රටා ගොඩ නැඟීමට පොලඹවන්න. නිර්මාණය කළ රිද්ම රටා ඇසුරින් රිද්ම රටා ලැයිස්තුවක් සිසුන් සමඟ පිළියෙළ කරන්න. සුදුසු පරිදි එක් එක් උපකරණයට සහ අවනද්ධ භාණ්ඩයට කොටස් වෙන් කරන්න.

(මිනිත්තු 20)

**පියවර 03**

- සාමූහික ව වාදනය කරවන්න. වාදනය කරනු ලබන රිද්ම රටාවල අලංකාර බව අනුව අගයමින් සාකච්ඡා කරන්න. අවනද්ධ භාණ්ඩයකින් **ඛඩප්තාලයට** හා **දීප්චන්දි** තාලයට ගැළපෙන තාල රටාවක් නැතහොත් රිද්ම රටාවක් තනි තනි ව වාදනය කළ හැකි වන අයුරින් කණ්ඩායම් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**ඛඩප්තාලයට** සහ **දීප්චන්දි තාලයට** අයත් ගී පද ගායනය කර පෙන්වා ඊට අදාළ රිද්ම රටා හෝ තාල රටා හෝ වාදනයට යොමු කර අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :** **ඛඩප්තාලය** හා **දීප්චන්දි** තාල පද මත නිර්මාණය කළ විවිධ තාල රටා නිර්මාණය කරමින් ඒවා වාදනයට යොමු කරන්න.

**අතිරේක උදවු :**

**ක්‍රියාකාරකම 14**

# ස්වර පුවරුව මඟින් කෝමල ග නි සහිත ගීත වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.14** : ස්වර පුවරුව මඟින් කෝමල ග නි සහිත ස්වර ස්ථාපන ගීත වාදනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර පුවරුවෙන් කෝමල ග නි සහිත ගීත වාදනය කරයි.
- ශුද්ධ ස්වර හා කෝමල ස්වර අතර ඇති වෙනස ප්‍රායෝගික ව අත්දකියි.
- කෝමල සහිත ගීත මිහිරි බව පිළිගනී.

**ගුණාත්මක යෙදවුම්:**
- කෝමල ග නි සහිත ගීතයන් කීපයක ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා.
- ස්වර පුවරු වාදන ඇතුළත් DVD VCD PEN DRIVE ආදි උපකරණ
- DVD VCD PEN DRIVE ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයෙහි කෝමල ස්වර පිහිටි යතුරු හඳුනා ගෙන කෝමල ග නි සහිත ස්වර ස්ථාපන ගීත වාදනය කරවීම අපේක්ෂිත ය. ශුද්ධ ග, නි ස්වරයන්ගේ හා කෝමල ග, නි යන ස්වරයන්ගේ හඬෙහි වෙනස හඳුනා ගැනීමට මඟ පෑදීම අත්‍යවශ්‍යය.

සරුංගලේ - රජ මැඳුරක ඉපදී සිටියා නම් - ඇත එපිට ගම්මානෙන් නැඟ එන වැනි ගීත භාවිත කළ හැකි ය.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- 6 ශ්‍රේණියේ දී වැයූ කෝමල ස්වර සහිත පාඩම් නැවත වාදනය කරමින් පාඩමට පිවිසෙන්න.
- දක්ෂ ශිල්පීන්ගේ වාදනයක් නැරඹීමට සලස්වා එහි අගය හා වටිනාකම පහදා දෙන්න.
- දක්ෂ ලෙස වාදනය කිරීම සඳහා සතත අභ්‍යාසයේ ඇති වටිනාකම හා වාදන හුරුව තුළින් ජීවිතය අරුත් ගන්වා ගත හැකි ආකාරය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- වත්මන් ශ්‍රී ලංකාව තුළ වෘත්තීය වාදකයකු වීමේ සාඵල්‍යතාව පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- කෝමල ග නි සහිත ස්වර ස්ථාපන ගීතයන්හි ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා. සිසුන් අතට පත් කොට හෝ ප්‍රදර්ශනය කොට හෝ වාදනය කිරීමට පොලඹවන්න.
- අවශ්‍ය උපදෙස් ලබා දෙමින් නිවැරදි ව වාදනය කිරීමට මඟ සලසන්න.
- සිසුනට උපදෙස් අවශ්‍ය වූ තැන දී පමණක් සහාය වන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- සිසු සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර හෝ තනි තනි ව හෝ වාදනය කිරීමට සලස්වන්න.

- සදොස් තැන් ඇතොත් නිදොස් කොට ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ː**

කෝමල ස්වර නිවැරදි ව වැයීම, නිවැරදි ව වැයූ, ප්‍රස්තාරය කියවීම හා තාලය නිවැරදි ව පවත්වා ගනිමින්, වාදනය කළ සිසුන් තෝරා අගයන්න. ප්‍රතිපෝෂණය කළ යුතු සිසුන්ට උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** ː නිවසේ දී අභ්‍යාස කිරීම සඳහා වෙනත් ස්වර ස්ථාපන ගී ප්‍රස්තාර ලබා දෙන්න. මේ සඳහා ඔබගේ නිර්මාණ ද භාවිත කළ හැකි ය.

**අතිරේක උදව්** ː

• •

# වාද්‍ය භාණ්ඩ මඟින් කෝමල ග නි සහිත ගීත වාදනය

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : ස්වර වාද්‍ය භාණ්ඩ මඟින් කෝමල ග නි සහිත ගීත වාදනය

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :
- වාද්‍ය භාණ්ඩ මඟින් කෝමල ග නි ගීත වාදනය කරයි.
- තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනියි.
- ශුද්ධ ස්වර හා කෝමල ස්වර අතර ඇති වෙනස ප්‍රායෝගික ව අත්දකී.
- ශුද්ධ ස්වරයන්ට වඩා වෙනස් වූ රසයක් කෝමල ස්වරයන්හි ඇති බව හඳුනාගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම්:**
- කෝමල ග නි සහිත ගීත කීපයක ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා.
- සිසුන් විසින් සපයා ගත් වාද්‍ය භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ශුද්ධ ස්වරයන්ගේන් උත්පාදනය වන රසයට හාත්පසින් ම වෙනස් වූ රසයක් කෝමල ස්වර මඟින් උත්පාදනය වනු ඇත. එය සිසුන්ට අවබෝධ වන අයුරින් මෙම පාඩම සැලසුම් කර ගත යුතු ය. ස්වර පුවරු වාදනයේ දී යොදා ගත් ගීත මේ සඳහා ද යොදා ගත හැකි ය.. එම ප්‍රස්තාර කියවීමේ හැකියාව සිසුන්ට ලැබී ඇති බැවින් එම ගීත ම යොදා ගැනීමෙන් පාඩම වඩාත් සාර්ථක වනු ඇත. සිසුන්ගේ අවධානය ද නිවැරදි ස්වර උත්පාදනය සඳහා ම යොමු කළ හැකි ය. කාලච්ඡේද 03 තුළ ගීත දෙකක් වාදනය කිරීම අපේක්ෂිත ය.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- කිසියම් භාණ්ඩයකින් ශුද්ධ හා කෝමල (ග හා නි ) ස්වර වෙන් වෙන් ව වාදනය කර සිසුනට හඳුනා ගැනීමට සලස්වන්න.
- ශුද්ධ හා කෝමල ස්වර වෙන් කර හඳුනා ගැනීමට සිසුන් තුළ ඇති දක්ෂතාව පිරික්සමින් පාඩමට පිවිසෙන්න.
- ස්වර වෙන් කර හඳුනා ගැනීම පුහුණුවෙන් ම දියුණු කර ගත යුත්තක් බව පහදන්න. වත්මන් ශ්‍රී ලංකාව තුළ වෘත්තීය වාදකයකු වීමේ සාපල්‍යතාව පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 20)

**පියවර 02**
- කෝමල ග නි සහිත ගීතයන්හි ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකා. සිසුන් අතට පත් කොට හෝ ප්‍රදර්ශනය කොට හෝ වාදනය කිරීමට පොලඹවන්න.
- කෝමල ස්වර නිවැරදි ව වාදනය කරන තුරු සහාය වන්න.
- ඔබට වාදනය කළ හැකි භාණ්ඩකින් සිසුන් සමඟ වාදනය කරමින් ආදර්ශ සපයන්න.

(මිනිත්තු 40)

**පියවර 03**

- භාණ්ඩ අනුව කණ්ඩායම් කර හෝ තනි තනි ව හෝ වාදනය කිරීමට සලස්වන්න.
- ගීතයේ කොටස් භාණ්ඩ අනුව වෙන් කර දී සමූහ වාදනයක ස්වර අභ්‍යාස වාදනය කරවන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කොට ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ස්වර ස්ථානයන්ගේ නිවැරදි බව මැනීමට හැකිවන පරිදි ඇගයීම සකසා ගන්න.
(මිනිත්තු 20)

**පසු අභ්‍යාස** : නිවසේ දී අභ්‍යාස කිරීම සඳහා වෙනත් ගී ප්‍රස්තාර ලබා දෙන්න. මේ සඳහා ඔබගේ නිර්මාණ ද භාවිත කළ හැකි ය.

**අතිරේක උදව්** : ගීත ප්‍රස්තාර පොත්

1. තැන තැන රවුමට ඉඳගෙන
2. සරුංගලේ වරල් සැලේ
3. මගෙ පුතු හරි හපනා
4. ඇත එපිට ගම්මානෙන්
5. රජ මැදුරක ඉපදී සිටියානම්

# සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 3.1** : සරල ගීත රසාස්වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : ස්වර වාද්‍ය භාණ්ඩ මඟින් කෝමල ග නි සහිත ගීත වාදනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- සරල ගීතයක බස හා ආකෘතිය පිළිබඳ අදහස් දක්වයි.
- සරල ගීතයක අන්තර්ගත කොටස් හඳුන්වයි.
- ශ්‍රවණය මඟින් සරල ගීතයක කොටස් වෙන්කර ගැනීමේ හැකියාව ලබයි.
- එකිනෙක කොටස් අතර සම්බන්ධතා දකිමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දක්වා ඇති පරිදි 8 ශ්‍රේණියට ගැළපෙන සරල ගීතයක කොටස් වෙන් කර ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණයක්.
- සර්පිනාවක් වැනි ස්වර වාද්‍ය භාණ්ඩයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සරල ගීතය අද සමාජය තුළ බෙහෙවින් ප්‍රචලිත කලා අංගයකි. එය ඉතා කෙටි කාලයක් තුළ ශ්‍රවණය කර රස විඳිය හැකි නිසා වේගයෙන් ජනප්‍රිය වී ඇත. සෑම තරාතිර ක ම අයකුට ගැළපෙන හා රස විඳිය හැකි සරල ගීත භාවිතයේ ඇත. විවිධ මාතෘකා ඔස්සේ විවිධ ශෛලීන් අනුගමනය කරමින් නිර්මාණය වී ඇති බොහෝ සරල ගී අද සමාජය තුළ පවතී. එක් එක් කාල වකවනුවල දී සරල ගීතය විවිධ හැඩයන්ගෙන් යුක්ත විය. ග්‍රැමෆෝන් තැටි යුගයේ සරල ගී, මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී, 60-70 දශක තුළ සරල ගී, නූතන සරල ගී ආදි වශයෙන් විවිධ හැඩයන්ගෙන් සහ නිර්මාණාත්මක බවින් එකිනෙකට වෙනස් සරල ගීත රාශියක් සමාජය තුළ පිරී පවතී. මේ සෑම එකක ම පාහේ දක්නට ඇත්තේ එක ම ආකෘතියක කොටස් ය.

මේ එකිනෙක කොටස් පිළිබඳ හා සංක්ෂිප්ත සරල අවබෝධයක් ලබා දීම මෙම ශ්‍රේණියට ප්‍රමාණවත් ය. එක් කාලච්ඡේදයක දී පහත දැක්වෙන කොටස් පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පදමාලාව - ගීතයේ අදහස ශ්‍රාවකයාට ඍජු ව ම ලැබෙන්නේ පදමාලාව මඟින් ය. ගී පද රචනය, කාව්‍ය රචනයට වඩා වෙනස් ය. කවියක් ගීතයක් ලෙස නිර්මාණය වූ අවස්ථා ද ඇත. ගී පද රචනාවක බස හැසිරවීම පහසු කාර්යයක් නොවේ. මිනිත්තු තුනක වැනි කෙටි කාලයක දී රසයක්, අදහසක් සහ පණිවිඩයක් ලබා දිය හැකි පද මාලාවක් ගීතයකට අවශ්‍ය ය. කවියක දී මෙන් උපමා රූපක ආදිය ද පදමාලාව තුළ ගැබ් ව පවතී.

**දුනුකෙයියා මලක් වගේ - දුරට පෙනෙන වා**
**වැටකෙයියා මලක් වගේ - සුවඳ හමන වා.**
**පසළොස්වක හඳ වාගේ එළිය ගෙනෙන වා**
**මගෙ අම්මා මට ජීවන සුවය සදන වා.**

ගැමි බස් වහර ම සරල ගීතයක අපේක්ෂා නොකරන අතර සිංහල, සංස්කෘත, හා ද්‍රවිඩ බස මිශ්‍ර වූ සංකීර්ණ ගැඹුරු බසින් යුතු ගීත ද නිර්මාණය වී ඇත.

**කම්පිත කංචන මාලා කූජිත - කිංකිණි නූපුර ජාලා**
**පාද සරෝජේකටී තටාකේ - චංචල නර්තන ලීලා**
- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයෝ-

හොඳ සරල ගීතයක සරල සුගම වචන අන්තර්ගත ය. නිදසුන් ලෙස සිසුන් සමඟ එවැනි ගීත කිහිපයක් සාකච්ඡා කළ හැකි ය. පහත දක්වෙන නාමාවලිය දෘශ්‍ය උපකරණයක් ලෙස සකසා ගෙන ප්‍රදර්ශනය කර සාකච්ඡාවට යොදා ගත හැකි අතර එම ගීත ශ්‍රවණයට යොමු කිරීම සහ සුභාවිත ගීත රචකයන් හඳුනා ගැනීමට පසු වැඩක යොදවන්න.

**තනුව** - පදමාලාව ගායනය කළ යුතු ආකාරය දක්වෙන්නේ තනුවෙන් ය. තනු නිර්මාණය ද ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. පදමාලාවේ අර්ථයට ගැළපෙන ලෙස තනුව නිර්මාණය විය යුතු ය. සරල ගීතයක් සමාජය තුළ ජනප්‍රිය වීමට බලපාන්නේ තනුවේ නිර්මාණාත්මක බව සහ රිද්මය යි. තනුව Melody නමින් ද ව්‍යවහාරයේ භාවිත ව පවතී.

**පෙරවාදනය** - ගීතය ආරම්භයට පෙර සංගීත ඛණ්ඩයක් වාදනය කෙරේ. මෙය පෙර වාදන කොටස යි. හොඳ ගීතයක තනුව සමඟ පෙර වාදනය හොඳින් බැඳී පවතී. මෙය INTRO (Introdution) නමින් ව්‍යවහාරයේ පවතී.

**ස්ථායී කොටස** - ගීතයේ මුල් කොටස ස්ථයී නම් වේ. උත්තර භාරතීය රාගධාරී සංගීතයේ මෙන් මෙම ස්ථායී කොටස ද වැඩි වශයෙන් ඇසුරු කරනුයේ මන්ද්‍ර මධ්‍ය සප්තකවල ස්වරය. සරල ගීතයක මුල් පද කොටස ස්ථායී නම් වේ. මෙය ප්‍රස්තාරයක දී SONG නමින් ව්‍යවහාරයේ භාවිත ව පවතී.

**අතුරු වාදනය** - ගීතයේ මුල් කොටස හා දෙවන කොටස අතර සම්බන්ධ කරනුයේ අතුරු වාදනයකින් ය. ගීතයේ දෙවන කොටසට පහසුවෙන් අවතීර්ණය වීමට අතුරු වාදනය උපකාරී වේ. මෙය INTERLUDE නමින් ද ව්‍යවහාරයේ භාවිත ව පවතී.

**අන්තරා කොටස** - ගීතයේ දෙවන පද කොටස මේ නමින් හැඳින්වේ. මධ්‍ය උච්ච ස්වර ඇසුරු කරයි. බොහෝ විට සරල ගීතයක අන්තරා කොටස් දෙකක් වත් පවතී. මෙය VERSE නමින් ද ව්‍යවහාරයේ පවතී.

**බිට්ස්** - ගීතයේ පද අග හෝ මැද ඇති ඇදෙන ස්ථාන නැතහොත් වචන රහිත හිස්තැන් සංගීත ඛණ්ඩ මඟින් පුරවනු ලැබේ. ඒවා ඉතා කෙටි ය. එවැනි සංගීත කොටස් බිට්ස් (BIT) නමින් ව්‍යවහාරයේ භාවිත ව පවතී.

**කවුන්ටර්** - ගායකයා/ගායිකාව ගීතයේ පද ගයන අතරතුර එම පද යටින් සංගීත ඛණ්ඩ ගලායන ලෙස සමහර ගීත නිර්මාණය කෙරේ. යටින් ඇසෙන සංගීත වාද්‍ය ඛණ්ඩ කවුන්ටර් (COUNTER) නමින් ව්‍යවහාරයේ භාවිතව පවතී. මේවා ගීතයේ විචිත්‍ර භාවය ඇති කිරීමට හේතුවේ. සරල ගීතයට වැඩි වශයෙන් කවුන්ටර් යෙදීමේ ගෞරවය හිමි වන්නේ ආචාර්ය වික්ටර් රත්නායකයන්ට ය. 1973 ජනවාරි 11 දින තිරගත කළ ''මාතර ආච්චි''

චිත්‍රපටයට කලාසූරි වොලී නානායක්කාරයන් විසින් රචිත ''සඳකඩ පහණක කැටයම් ඔපලා'' නම් ගීතය සිසුන්ට ශ්‍රවණයට සලසා එහි අඩංගු කවුන්ටර් නම් විශේෂය හඳුනා ගැනීමට උපකාරී වන්න. මෙම ගීතය ගායක සුනිල් එදිරිසිංහයන්ගේ පළමු ගීතය වන අතර වික්ටර් රත්නායකයන් ද, පළමුවෙන් සංගීතවත් කළ චිත්‍රපටයට අයත් වෙයි.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- **දුනුකෙයියා මලක් වගේ** ගීතය සහ **ජගන් මෝහිනී** ගීතය ලියූ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර ඉන් කැමති කොටසක් ගයා වයා ශ්‍රවණයට සලසන්න.
- ගීතයක ප්‍රධාන කොටස් දෙක එනම් පද මාලාව සහ තනුව පිළිබඳව කෙටියෙන් පහදන්න.
- එම ගීත දෙකේ බස පිළිබඳ ව සිසුන් සමඟ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- මෙහි අවසානයේ අමුණා ඇති ගීත ප්‍රස්තාරය හෝ මෙම ශ්‍රේණියට සුදුසු සිසුන් දන්නා ගීතයක ප්‍රස්තාරයක් හෝ ප්‍රදර්ශනය කරන්න.
- එම ප්‍රස්තාරයේ ස්වර ගයා වයා පෙන්වන්න. හැකි නම් සිසුන් එකතු කරගන්න.
- එහි ඇති පෙර වාදන, ස්ථායී, අතුරු වාදන, අන්තරා කොටස්, බිට්ස්, කවුන්ටර් ආදිය පිළිබඳ ව විස්තර කරන්න.
- ඒ එක් කොටසට ප්‍රස්තාරයක දී භාවිත කරන ඉංග්‍රීසි වදන් පැහැදිලි කරන්න.

(මිනිත්තු 15)

**පියවර 03**

- සරල ගීතයක භාෂාව, හා අන්තර්ගත කොටස් පිළිබඳ සිසුන් විමසන්න. එක් එක් කොටස් පිළිබඳ සිසුන්ගේ ස්වාධීන අදහස් එක් කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සිසුන්ගෙන් තමන් වඩාත් ප්‍රිය කරන සරල ගීතය විමසන්න. කැමති සිසුවකු ලවා තමන් ප්‍රිය කරන ගීතයේ අන්තර්ගත කොටස් පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න. එක් එක් කොටස ගායනයට මඟ පෙන්වන්න. අගයන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :**

සුභාවිත ගීත රචකයන් හඳුනා ගැනීමට, පහත සඳහන් ගීත රචකයන්ගේ ගීත අතරින් වඩාත් ජනප්‍රිය ගීතයක් නිදහස් කාලවල දී ශ්‍රවණය කිරීමට උපදෙස් දෙන්න. ඒවායේ පෙර වාදනය, අතුරු වාදනය, ස්ථායී, අන්තරා, කවුන්ටර්ස්, බිට්ස් ආදි කොටස් හඳුනා ගැනීමට උපදෙස් දෙන්න. පාසලේ පහසුකම් ඇත්නම් එම ගීත උදෑසන පාසල ආරම්භ වන තුරු ශ්‍රවණයට සලස්වන්න. එම ගීතවල පදරචනය, සංගීත නිර්මාණය හා ගායකයා සමඟ අර්ථය තනුව සුවිශේෂ කොටස් පිළිබඳ ශබ්ද විකාශන පද්ධතිය මඟින් සිසුන් සාකච්ඡාවක මෙහෙයවන්න. සුදුසු ලෙස සටහනක් ගොඩනංවන්න.

ජනප්‍රිය සුභාවිත ගීත රචනා කළ නිර්මාණකරුවන් අතරින් කිහිප දෙනකු පිළිබඳ ව ඔවුන් කළ නිර්මාණයක් බැගින් පහත දක්වේ. මෙම තොරතුරු

ඇතුළත් දෘශ්‍ය උපකරණයක් පාඩම ආරම්භයේ සිට පන්තියේ ප්‍රදර්ශනයට තබන්න. කල් වේලා ඇත්නම් මුල්පද ගයා වයා පෙන්වන්න.
(පහත නම් ලැයිස්තුවට අමතර ව ඔබ විසින් හඳුනා ගන්නා ලද ගීත රචකයෝ ඇත්නම් ඇතුළත් කරන්න )

වක්කඩ ළඟ දිය වැටෙන තාලයට - මහගම සේකර
එන්න මදනලේ - කරුණාරත්න අබේසේකර
සසර වසන තුරු නිවන් දකින තුරු - ඩෝල්ටන් අල්විස්.
ස්වර්ණ විමානෙට එහා ලෝකයෙන් - මඩවල එස් රත්නායක
වැලිතල අතරේ- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
තොටු පොළ අයිනේ - මහාචාර්ය සුනිල් ආරියරත්න
අඩවන් වූ දෙනෙතින් - ඩබ්. ඒ. අබේසිංහ
ගිලෙම් ඔබේ ගුණ මූදේ - අරීසෙන් අහුබුදු
ආදරයේ උල්පත වූ අම්මා - ප්‍රේමකීර්ති ද අල්විස්
බුදු හාමුදුරුවො අපිත් දකින්නැති- රඹුක්කන සිද්ධාර්ථ හිමි
කොළොම් තොට නැත මහලු වී - ලූෂන් බුලත්සිංහල
නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන් - ආචාර්ය අජන්තා රණසිංහ
වලා තීරයෙන් එහා - කුලරත්න ආරියවංශ
රෑ වැඩමුරය - බන්දුල නානායක්කාරවසම්
මාරම්බරී කෝල වී පෑ මුවේ- කුමාරදාස සපුතන්ත්‍රි
ඔබෙ නිල නුවන් තලාවේ - කරුණාරත්න අබේසේකර
ආදරේ රන් බිඟුන් නැසූ - කේ.ඩී.කේ ධර්මවර්ධන
පවන් සුසුම් දූලින් වෙළී - ධර්මසිරි ගමගේ
අන්න බලන් ඉදිකඩ ළඟ - බණ්ඩාර ඇහැලියගොඩ
නවාතැනින් ඇය යනවා - සුනිල් සරත් පෙරේරා
බිම්බරක් සෙනඟ ගැවසුණ - රත්න ශ්‍රී විජේසිංහ
දවසක් පැල නැති හේනේ - අධිනීතිඥ රන්බණ්ඩා සෙනෙවිරත්න
ගමට කලින් හිරු - සුනිල් දයානන්ද කෝනාර
කවිය ඔබ - සුනිල් ආර් ගමගේ
වෙරළු ගෙඩිය හරි අටකට - වසන්ත කුමාර කොබවක

**අතිරේක උදවු**

- ලාංකික සංගීතයේ රෝහණ ලකුණ - රවි සිරිවර්ධන / සමුද්‍ර වෙත්තසිංහ
- ගී තනු උල්පත - මහාචාර්ය සුනිල් ආරියරත්න
- මාරම්බරී - එඩ්වඩ් ජයකොඩි ප්‍රතිභාවලෝකන - දයානන්ද රත්නායක
- නන්දා මාලිනී ගී තනු නිර්මාණ - නන්දා මාලිනී
- සුළකල් මියුරු ගැයුම් - සිංහල සංගීතයේ වික්ටර් රත්නායක
- අත්දැකීම් ගීතය හා රත්න ශ්‍රී විජයසිංහ - අරුණ වේරගල
- ගී ප්‍රස්තාර ශතකය - 1,2,3,4 - අනුර වන්නිආරච්චි
- වික්ටර් අනුපමේය වින්දන ධර්මය - බණ්ඩාර සෙනෙවිරත්න
- රත්න ශ්‍රී උල්පත පාමුල - සංස්: පමිත ආර්. ලියනගේ
- රත්න ශ්‍රී නව කවියේ චන්ද්‍රෝදය - සංස්කරණය - සමුද්‍ර වෙත්තසිංහ

ලිපිය - ''රත්න ශ්‍රී නිර්මාණ හා ජන ශ්‍රැතික සමරූපතා'' - අමරසිරි වික්‍රමරත්න

**ඇමුණුම**

**මෙහි දැක්වෙන ගීතය ගුණදාස කපුගේ සූරීන් විසින් සංගීත නිර්මාණය කර ගායනය කරනු ලබයි. එහි පද රචනය අධිනීතිඥ රන්බණ්ඩා සෙනවිරත්නයන්ගෙනි. මෙහි මුල් ගායනයේ ශ්‍රැතිය D Minor වේ. එම ස්කේලය 8 ශ්‍රේණියේ සිසුන්ට ග්‍රහණය කර ගැනීම අපහසු නිසා C Minor ස්කේලයට පෙරළා ප්‍රස්තාර කර ඇත.**

## දවසක් පැල C Minor 4/4

INTRO : ( Introduction ) පෙරවාදන කොටස

ගු - - / රි - - / ස - ප / නි ස රි /
ගු - - / රි - - /ස - -/ ප --
ප ගු රි/ ස - - /සස රි ස/ නි - - /
නිස රි රි/සරි ගු ගු/රිගු රි ස/ස--
ප නි රි / ම ප ධ / ප ම ගු/ ස - - /

SONG ස්ථායි කොටස

+ පස ස/ - ස රි / ගු ගුම රි/ - රි සනි/
+ නිනි - / නි ස රි/ ගු රි ස / ස ස - /
+ මම ම / - ම ම / පම ගුම ග/ ගු රි ස /
+ නි -නි /ස රි ම / මප ම ගු / - - - /
+ ම -ම / ම ම ම / පම ගුප මගු / ගු රි ස /
+ නි -නි / ස රිගු ගු / රිගු රි ස / - - - /

INTER : ( Interlude ) අතුරු වාදන කොටස

ප ගු රි / ස - - / සස රි ස / නි - - /
නිස රි රි / ස රි ගුගු / රිගු රි ස / ස - - /
ප නි රි / ම ප ධ / ප ම ගු/ ප - - /

VERSE : අන්තරා

+ පප ප / ධ නි නි / ධ නි ධ / ප ප ප /
ග ග ග / ම ප ධ / ප ම ම / ම ම - /
ග ග ග / ග ග ම / ම ප ප / ප ධප මග /
+ ග -ග / ම ම නි / ධ - ප / - - - /
+ රි -රි / - රි රි / ම - ම / ගු රි - /
+ නි -නි / සරි රිගු ගු / රි - ස / - - - /
+ නිනි නි / ස රි රි / ම - ම / ගු රි - /
+ නි -නි / ස රි ගු / රි - ස / - - - /

**ක්‍රියාකාරකම 17**

# භජන් ගී ගායනය

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ලබා ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 3.1** : භාරතීය ගීත ශෛලීන් රසාස්වාදයට හුරු වෙයි.

**ක්‍රියාකාරකම 3.1.1** : භජන් ගී ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- භජන් ගී ගායනය කරයි.
- භජන් ගී ශ්‍රවණයට කැමැත්තක් දක්වයි.
- විවිධ ශිල්පීන්ගේ භජන් ගී එකතුවක් කිරීමට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ගීතය පටිගත කළ CD/VCD /DVD /PEN DRIVE
- ගීතය ලියූ දෘශ්‍යාධාරය
- ස්වර වාද්‍ය භාණ්ඩයක් හාර්මෝනියම්, තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

හින්දුස්ථානි රාගධාරී සංගීතයට අයත් සරල ශාස්ත්‍රීය අංගයක් වශයෙන් භජන් ගී නම් කළ හැකි ය. සිසුන්ගේ රසාස්වාදනය වැඩි දියුණු කිරීමටත් ගායනයට ඇති කැමැත්ත වැඩි කිරීමටත් මෙම ගීත ගායනය උපයෝගී කොට ගත යුතු ය. නිර්දේශ කර ඇති ගීත හෝ වෙනත් සුදුසු ගීතයක් හෝ මේ සඳහා යොදා ගන්න.

- රාධේ ගෝවින්ද
- ජය ගණේශ
- පායෝ ජී මෛනේ
- රඝුපති රාඝව රාජා රාම්

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- පාඩමට අදාළ භජන් ගීතය ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය ගයා වයා ශ්‍රවණයට සලස්වන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- සිසුන් සමඟ ගායනය කරන්න.
- කොටසින් කොටස ගායනය හුරු කරන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩයක් හා තාල වාද්‍ය භාණ්ඩයක් සමඟ ගායනයට හුරු කරවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව හෝ ගීතය ගායනයට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ඒකල ව හා සාමූහික ව ගායනය කළ සිසුන් ඇගයීමට ලක් කරන්න

**පසුවැඩ** : නිදහස් කාලච්ඡේදවල දී භජන් ගීත ගායනයට යොමු කරවන්න. (මිනිත්තු 05)

**අතිරේක උදව්** : අන්තර්ජාලය ඇසුරෙන් භජන් ගී ශ්‍රවණයට සලස්වන්න.

ඇමුණුම අංක 01

**භජන් ගීතය (සායි බජන්)**

රාධේ ගෝවින්ද රාධේ ගෝපාල  සයිරාමා
බංසී දරා බංසී දරා
හෙචිත චෝරා
හෙ නටවරා හෙ නටවරා
හෙ නටවර නන්ද කිශෝරා
ඝණ ශ්‍යාම සුන්දර මෙඝ ශ්‍යාම සුන්දර සයිරාමා

රාධෝ ගෝවින්ද  ස්වර ප්‍රස්තාරය

ස්ථායී

/ + + ග ප /
ස් - - නි / ධ ප ග ප / නි - - ධ / ප ග ග ප /
රි ග ග රි / ස - ග ප / ස් - - නි / ධ ප ග ප /
නි - - ධ / ප ග ග ප / රි ග ග රි / ස - - - /

රි ග ග ප / රි ග - - / රි ග ග ප / රි ග - - /
ග ප ධ නි / ප ධ ධ ප / ප - - - / - - ග ප /
ස් ස් නි ස් / - - ග ප / ස් ස් නි ස් / - - ග ප /
ස් ස් නි ස් / නි - ස් රි් / ස් - නි - / - - නි ස් /
ධ නි නි ධ / ප ප නි නි / ධ නි නි ධ / ප ප ග ප /
රි ග ග රි / ස - - - / - - - - / - - ග ප /

**ක්‍රියාකාරකම 18**

# නෙළුම් ගී ගායනය

**නිපුණතාව 1.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 1.1** : කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : නෙළුම් ගී ගායනය කරමු.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- නෙළුම් ගීත ගායනය කරයි.
- නෙළුම් ගීත පිළිබඳ විස්තර කරයි.
- නෙළුම් ගී සංස්කෘතික අංගයක් ලෙස අගය කරයි.
- නියමිත ලය පවත්වා ගනිමින් ගයයි.

**ගුණාත්මක යෙදවුම්:**
- නෙළුම් ගීත ලියූ දෘශ්‍යාධාර
- සර්පිනාව, උඩැක්කිය, තාලම්පොට, බටනළාව, ගැටබෙරයක්
- සුනිල් සාන්ත මහතාගේ ''තෙල් ගාලා හිස පීරන් නැනෝ'' ගීතය සම්පූර්ණයෙන් හෝ මුල් කොටස පමණක් හෝ ලියූ දෘශ්‍යාධාරයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- කුඹුරේ වල්පැළ ගැලවීම, අඩුතැන්වලට පැළ සිටුවීම හා ගොයම් පැළ සිටුවීමේ දී ගයන ගීත නෙළුම් ගීත වේ. නෙළීමේ දී කාන්තාවන්ට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. අඩු ලයකින් ඇද පැද ලෙළවා ගයනු ලැබේ. මෙහෙ ගී විශේෂයකි. පහත දැක්වෙන නෙළුම් ගීත දෙක, සාම්ප්‍රදායික නාදමාලාවන් අනුව ගායනය කිරීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ.
- බාල ළමාවරු නෙළුමට කැන්දන ඔමරි කතාවෙන් පසුවන්නේ
- ඉපල් පිටින් ගහන අව්ව

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ''තෙල් ගාලා හිස පීරන් නැනෝ'' (සුනිල් සාන්ත මහතාගේ) ගීතය ලියූ දෘශ්‍යාධාරයක්
- ගුරුවරයා ගීතය ගායනය කරන්න.
- ගායනය කළ ගීතයෙන් ප්‍රකාශ වන පද මාලාවන් පැහැදිලි වන, පසුබිම පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- නෙළුම් ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය ගායනා කරන්න.
- සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පාදයෙන් පාදය නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.
- තාල තබමින් ගායනය කරවන්න.
- නෙළුම් ගීතවල ලක්ෂණ පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න.
- දෙවන නෙළුම් ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- පළමු ගීතය ඉගැන්වීමට යොදා ගත් ක්‍රියා පිළිවෙළ මේ සඳහා ද යොදා ගන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- නෙළුම් ගීත දෙක ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයාගේ සහාය වාදනය අනුව නිවැරදි නාද මාලාවන් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව හෝ ගායනයට අවස්ථාව ලබා දෙන්න.
- සාම්ප්‍රදායික තනු නිවැරදි ව ස්ථාපනය වී තිබේ දැයි සොයා බලන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සාමූහික ව, කණ්ඩායම් වශයෙන්, කේවල ව ගීතය මිහිරි ව ගැයූ සිසුන් හඳුනා ගෙන ඔවුන් අගය කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :** නෙළුම් ගී එකතුවක් කර, නිදහස් කාල පරිච්ඡේදවල දී ගුරුවරයාගේ සහාය ලබා ගෙන පුහුණුවන්න.

**අතිරේක උදවු :**

- 2009 - 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය
- සිංහල ජන කවි සංග්‍රහය
- ජන කවියෙන් හෙළි වන සිංහල ගෘහ ජීවිතය - අමරසිරි වික්‍රමසිංහ

- තෙල් ගාලා හිස පීරන් නෑනෝ - ඇටවැල ඇරගෙන බැඳැ ගන් නෑනෝ
  සේලේ ඉණවට ඇඳගන් නෑනෝ - ගොයම් නෙළන්නට යමු අපි නෑනෝ - යමු නෑනෝ
  තෙල් ගාලා හිස පීරාලා - තිලට තිලයි නෑනෝ
  ගෙල ලාලා ඇට වැල් මාලා - රුව සුදිලෙයි නෑනෝ
  සේලේ ඉණවට රැළි දීලා - නෙරිය දිලෙයි නෑනෝ
  ගොයම් නෙළන්නට කුඹුර බලා - යමු අපි රන් නෑනෝ
  තෙල් ගාලා .............
  කුඹුර මැදින් නියර දිගේ මල් පුබුදිනවා - මිණි මුතුයෙන් ළා තණ පත් සේල එළනවා
  රැන ගිරා රැන උඩින් වියන් බඳිනවා - බාල ලියන් සුබ නැකතින් කෙතට බහිනවා
  තෙල් ගාලා .............

ගායනය හා සංගීතය - සුනිල් ශාන්ත
රචනය - අරිසෙන් අහුබුදු

බෝගම්බර අපි නෙලුමට යනකොට
තිස් දෙන්නෙක් නෙලතෙයි තාලම් ......

බාල ළමාවරු නෙළුමට කැන්දන ඔමරි කතාවෙන් පසුවන්නේ
නෙළන්න සැරසී එන අඟනන්ගේ හිස පීරා මල් ගවසන්නේ
නෙළන්න බැරි අය කුමට ද එන්නේ දැත රිදෙන සේ පසුවන්නේ
ලජ්ජාවෙන් කවි සිංදු කියාගෙන නෙළුම එතෙක් කරලයි එන්නේ

# කමත් ගී ගායනය

**නිපුණතාව 1.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 1.1** : කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : කමත් ගී ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- කමත් ගී ගායනය කරයි.
- කමත් ගී පිළිබඳ ව විස්තර කරයි.
- කමත් ගී කඩිනම් ලයකින් ගයන බව පිළිගනියි.
- කමත් ගීවල සංස්කෘතික ලක්ෂණ විස්තර කරයි.
- කමත් ගීවල අඬහැර පෑම සුවිශේෂ අංගයක් ලෙස අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තමන් ලියූ දෘශ්‍යාධාර
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පොට
- අඬහැරයක් ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ගොයම් පෑගීමේ දී කමතෙහි ගයන ගීත විශේෂයකි. පිරිමි පමණක් මෙම කාර්යයට සහභාගි වෙති. අම්බරුවන් යොදා ගෙන රාත්‍රි කාලයේ ගොයම් පාගන විට ගයන මෙම ගීත සාමූහික බව, දනවන මෙහෙ ගී විශේෂයක් බව සිසුන්ට පහදා දෙන්න. පහත දැක්වෙන මෙම පාඩම සඳහා යොදා ගන්න

- ඉරු දෙවියෝ වැඩිය තැනේ - බොල් පිනි නොතිබෙයි එතැනේ<br>සඳ දෙවියෝ වැඩිය තැනේ - කළුවර නොතිබෙයි එතැනේ
- බුදුන් වඩින වේලාවයි - කිරි උතුරන වේලාවයි<br>කොළ මඩවන වේලාවයි - කමත පිරෙන වේලාවයි
- මේ කොතනින් ගෙනා ගොනා - දෙවුන්දරින් ගෙනා ගොනා<br>ඒ මොනවට ගෙනා ගොනා - කොළ මඩනට ගෙනා ගොනා

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- "ඔයිරයිරේ ඔයිරාමා" අඬහැරය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා අඬහැර පෑම කර පෙන්වන්න.
- ඒ පිළිබඳ ව සිසු අදහස් විමසමින් සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- කමත් ගීත ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය ගායනා කරන විට සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කඩිනම් ලය අනුව ගීත ගායනා කරවන්න.
- කමත් ගී පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් කරන්න.
- කමත් ගීවල නාදමාලා නිවැරදි ව ගායනය කරවන්න.

(මිනිත්තු 25)

**පියවර 03**

- පන්තියේ සිසුන් ප්‍රමාණය අනුව කමත් ගීත කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව ගායනයට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයාගේ සහාය වාදනයට අනුව රංගනය සමඟ ගායනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. අනිවාර්යයෙන් තාල වාද්‍ය භාණ්ඩයක් වාදනය කරන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් වශයෙන් හා කේවල ව ගීතය මිහිරි ව ගැයූ සිසුන් හා රංගනයත් සමඟ ගීත ගැයූ කණ්ඩායම් තෝරා අගය කරන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :** එදා සහ අද කමතේ සිදුවන ක්‍රියාවලිය විස්තර කරමින්, කමත් ගීත ද ඇතුළත් කරමින් ලිපියක් සකස් කරන්න.

**අතිරේක උදව් :**

- 2009 - 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය
- නැළවිලි ගි - ආනන්ද ජයසිංහ
- කමත් හැල්ල - ආචාර්ය කේ.එන්.ටී. ගුණදාස

**ක්‍රියාකාරකම 20**

# ගැමි ගීයේ විශේෂ ලක්ෂණ

**නිපුණතාව 1.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 1.1** : කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : ගැමි ගීයේ විශේෂ ලක්ෂණ

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ගැමි ගී යන්න නිර්වචනය කරයි.
- ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධක නම් කරයි.
- ගැමි ගීයේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ගැමි ගී, සේ ගී සංසන්දනය කරමින් ගැමි ගීයේ ලක්ෂණ තෝරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාවක්, තාලම්පොටක්
- ගැමි ගීය හා සේ ගීය ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

දේශීය සංගීතයේ අනන්‍යතාව පෙන්වන කැඩපතක් ලෙස ගැමි ගීය හඳුන්වා දිය හැකි ය. විවිධ කාර්යයන්හි නිරත වීමේ දී ගැමියන් විසින් ගැයූ ගීත ගැමි ගී නමින් හඳුන්වනු ලැබේ. පහත සඳහන් ශීර්ෂ ඔස්සේ පාඩම ඉගැන්වීම අපේක්ෂා කෙරේ.

- ගැමි ගීයට නිර්වචනයක්
- ගැමි ගීයේ භාෂාව, තනුව හා විශේෂ ලක්ෂණ

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- සකස් කරගත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගැමි ගීයක් හා සේ ගීයක් ගුරුවරයා ගායනා කර පෙන්වන්න.
- ගී වර්ග දෙක පිළිබඳ ව සිසු අදහස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 15)

**පියවර 02**
- එම ගීත ගුරුවරයා සමඟ සිසුන්ට ද ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඉන් ගැමි ගීයේ භාෂාව, තනුව හා විශේෂ ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කරුණු A4 කඩදාසියක සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- A4 කඩදාසියේ සටහන් කරගත් කරුණු නිවැරදි ව, සිසු අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- අභ්‍යාස පොතේ සටහන් කරගත් කරුණු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ව කරුණු ඉදිරිපත් කළ සිසුන් තෝරා අගයන්න. (මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : ''ගැමි ගීයේ සුවිශේෂී ලක්ෂණ'' මැයෙන් බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**අතිරේක උදවු** :
- ශ්‍රී ලංකාවේ ජන සංගීතය - මොඩියුලය, දූරස්ථ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

# දමිළ ගී ගායනය

**නිපුණතාව 5.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳව අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : දමිළ බසින් රචිත ගීතයක් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : දමිළ ගී ගායනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- දමිළ ගී ගායනය කරයි.
- දමිළ ගී ගායනයට කැමැත්තක් දක්වයි.
- වෙනත් භාෂාවකින් රචිත ගීත රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම අංක 1හි සඳහන් ගීත ලියන ලද දෘශ්‍යාධාරක
- ගීතය පටිගත කළ තාක්ෂණික උපකරණ (CD DVD PEN DRIVE)
- ස්වර වාද්‍ය භාණ්ඩයක්, හාර්මෝනියම්, තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

විදේශීය භාෂාවලින් ගැයෙන ගීත. රස විඳීම හා ගායනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. සිසුන්ගේ රසවින්දනය වැඩි දියුණු කිරීමටත් ගායන කුසලතාව වර්ධනය කිරීමටත් මෙම ගීත යොදා ගත යුතු ය. නිර්දේශ කර ඇති ගීත හෝ වෙනත් ගීත හෝ මේ සඳහා යොදා ගන්න. මෙයින් එක් ගීතයක් ප්‍රචලිත රෝජා (1992) නම් චිත්‍රපටයේ ගීතයකි. එම ගීතවල සරල සිංහල අදහස සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- සිසුන් දන්නා දමිළ ගීතයක් පිළිබඳ ව විමසන්න.
- එම ගීතයෙන් කොටසක් ගායනය කරවන්න.
- පළමු ද්‍රවිඩ ගීතය ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- පළමු ගීතය ගායනය කර පෙන්වන්න.
- ගීතය කොටසින් කොටස ගායනය කර පුහුණු කරවන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩයක් හා තාල වාද්‍ය භාණ්ඩයක් සමඟ ගායනය හුරු කරවන්න.
- සම්පූර්ණ ගීතය සාමූහික ව ගායනය කරවන්න.
- කාල වේලාව ප්‍රමාණවත් නම් ඒකල ව ගයවා නිවැරදි කරන්න

(මිනිත්තු 30)

**පියවර 03**
- ඇමුණුමේ දක්වා ඇති දෙවන ගීතය (චින්න චින ආසයි) ප්‍රදර්ශනය කර ගයා/වයා පෙන්වන්න. එහි සිංහල අර්ථය සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ගීතය සිසුන් සමඟ ගයමින් රස වින්දනයක යෙදෙන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒකල ව හා සාමූහික ව ගායනා කිරීමට සලස්වා ඇගයීමට ලක් කරන්න.
(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : නිදහස් කාලච්ඡේදවල දී දමිළ ගීත ගායනයට යොමු කරවන්න.

**අතිරේක උදව්** : • අන්තර්ජාලය ඇසුරින් දමිළ ගී ශ්‍රවණය කිරීමට සැලැස්වීම.

**ඇමුණුම 01**
**පළමු ගීතය**

**දමිළ ගීතය**

තනානේ තනානේ තනානේ තංගම් //
තයියුම් පෙරෙන්ද දමා
තංගම් පෝලින්ද දමා
නෙල්ලුම් විලෛයින්ද දමා
කේසම් මංගල්ද දමා
තනානේ තනානේ තනානේ තංගම් //

කුයිලෝ තොංජු දමා
කුලලොසෙයි කර්කු දමා
මෛල්පෝල් නඩපුරියුම්
මංගල පොංගලදු
තනානේ තනානේ තනානේ තංගම් //

ස්වර ප්‍රස්තාරය

සස- රිමග/ රිරි- ගරිස/ නි නි- සරිග/ රිස- ස--/
++ග පප-/පස්ස් ස්ස්-/++නි ධපම/පධනි ධප-/
++ධ ධධධ/ පධප මගරි/++ප මගරි/මගරි සස-/

**දෙවන ගීතය**
**දමිළ ගීතය - චින්න චින ආසයි**

Music: **A.R.Rahman** | Lyricist: **Vairamuthu** | Singers: **Minmini**

Chinna Chinna Aasai Siragadikum Aasai
Muthu Muthu Aasai Mudinthuvaitha Aasai
Vennilavu Thottu Muthamida Aasai
Ennai Intha Bhoomi Sutrivara Aasai
Chinna Chinna Aasai Siragadikum Aasai
Muthu Muthu Aasai Mudinthuvaitha Aasai
Vennilavu Thottu Muthamida Aasai
Ennai Intha Bhoomi Sutrivara Aasai
Chinna Chinna Aasai Siragadikum Aasai
Malligai Poovaai, Maarivida Aasai
Thendralai Kandu, Maalaiyida Aasai
Maegangalai Ellaam, Thottuvida Aasai
Sogangalai Ellaam, Vittuvida Aasai
Kaarkuzhalil Ulagai, Kattivida Aasai

Chinna Chinna Aasai Siragadikum Aasai
Muthu Muthu Aasai Mudinthuvaitha Aasai2
Vennilavu Thottu Muthamida Aasai
Ennai Intha Bhoomi Sutrivara Aasai
Chinna Chinna Aasai Siragadikum Aasai
Muthu Muthu Aasai Mudinthuvaitha Aasai
Saettru Vayalaadi, Naatru Neda Aasai
Meen Pidithu Meendum, Aatril Vida Aasai
Vaanavillai Kønjam, Uduthikølla Aasai
Panithulikkul Naanum, Paduthukkølla Aasai
Chithirathu Maelae, Šaelai Katta Aasai
Chinna Chinna Aasai Širagadikum Aasai
Muthu Muthu Aasai Mudinthuvaitha Aasai
Vennilavu Thøttu Muthamida Aasai
Ènnai Intha Bhøømi Šutrivara Aasai
Chinna Chinna Aasai Širagadikum Aasai
Muthu Muthu Aasai Mudinthuvaitha Aasai

## Pallavi

Chinna chinna aasai  siragadikkum aasai

s  g r  m g g  r r p m  g  g g

*G  C  G  C*

Muthu muthu aasai  mudindhu vaikka aasai
s g  r m  g g  r r  p  m  g  g g
*C  G  C*

VeNNilavu thottu muththamida aasai.i.i.i.i
p  p d p  d  d  d  d  n2d  n2n2  d n2d p
*C  Dm  Gm  C*

Ennai indha bhoomi.i.i.i  suttri vara aasai.i.i.i
p d  m g  m  m  g m rgr r  p  m g  g g  r s n

*F  G  C*

<Chinna chinna aasai...>

## Charanam

Malligai pooovaai  maarivida aasai
gp p p  g r s  s  r g m  rgr
*C  Dm  G*

Thendralai kaNdu  maalai ida aasai
gp  p  p  g rs  s  r  gm  rgr
*C  Dm  G*

MaegangaLayellam  thottu vida aasai....i
s  s  d p d  d  d  n  S R  S n  S
*C  Dm7  F  G  C*

SOgangaLayellam  vittu vida aasai....i
s s  d p d  d  d  n  S R  S n  S
*C  Dm7  F  G  C*

Kaarkuzhalil ulagai.i.i.i  thoTilida aasai.i.i.i
p  S n2 d  pd m  g m rgr r  p m g  g g  r s n

*C  F  G  C*

**ක්‍රියාකාරකම 22**

# පිය ගුණ වරුණ ගීතයක් ගායනය

**නිපුණතාව 5.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග හා පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2.1** : පිය ගුණ ගීයක් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : පිය ගුණ වරුණ ගීයක් ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- පිය ගුණ ගීයක් හැඟීම්බර ව ගායනය කරයි.
- ගී පද මාලාව අගය කරයි.
- පිය ගුණ ගීත නිර්මාණයට පෙලඹේ.

**ගුණාත්මක යෙදවුම්:**
- නිර්දේශිත ගීතය ලියූ දෘශ්‍යාධාරකය
- එම ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පිය ගුණ ගීතයක් ගායනයට පුහුණු කරවමින්, ගීතය රස වින්දනයට යොමු කරවීම මින් අපේක්ෂා කෙරේ. පියා සහ දරුවා අතර සහසම්බන්ධතාව වැඩි දියුණු කිරීම පිළිබඳ ව සිසුන් සමග කෙටි සාකච්ඡාවක් කරන්න.
පහත ගීත සූදානම් කරන්න.

- පියාණනී මා නැවත උපන්නොත්
- අම්මා සඳකි
- පිතු සෙනෙහේ පිදූ

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- පියගුණ ගීතයක් ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ට ඇසීමට සලස්වන්න. කිහිප වාරයක් ශ්‍රවණයට සැලැස්වීමෙන් පසු ව ගායනයට යොමු කරවන්න (මිනිත්තු 10)

**පියවර 02**
- ගීතයෙහි පදමාලාව, නාද මාලාව, සංගීත නිර්මාණය සහ ගායකයාගේ කටහඬ සුසංයෝග වී ඇති අයුරු සාකච්ඡා කරන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- ස්වර වාද්‍ය භාණ්ඩ යොදා ගනිමින් පෙර වාදන, අතුරු වාදන, සහිත ව වාදනය කරන්න.
- තනි තනි ව හෝ කණ්ඩායම් කර හෝ ගායනය කරවා සිසුන් අගය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ව අදහස් හා ගායනය ඉදිරිපත් කළ සිසුන් තෝරා අගයන්න.

**පැවරුම:** පිය ගුණ වරුණ නමැති මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට කවි පෙළක් නිර්මාණයට සලස්වන්න.
මෙම ගීත උදෑසන රැස්වීමේ දී , සාහිත්‍ය උත්සවවල දී ගායනය කළ හැකි බව පහදා දෙන්න.

**අතිරේක උදවු:** ගීත හා ප්‍රස්තාර ඇතුළත් පොත්.
පෙළ පොත

# නූර්ති ගීත ගායනය

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : නූර්ති ගීත ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ගායනය කරයි.
- නූර්ති ගීත ඉගෙන ගැනීමට කැමැත්ත දක්වයි.
- නූර්ති ගීත එකතු කිරීමට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ලියූ දෘශ්‍යාධාරකය
- ගීතය පටිගත කළ CD හෝ DVD පට
- සර්පිනාව, තබ්ලාව, වයලීනය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

හින්දුස්ථානී සංගීතය ඇසුරෙන් ගොඩනැගුණු නූර්ති ගී තනු රසවින්දනය සඳහා සාමාන්‍ය ජනතාව ද පොලඹවයි. මෙම ගීතවල ඇති මිහිරි බව හා ආකර්ශණීය බව නිසා පාසල් සිසුහු ද ගීත ඉගෙනීමට කැමැත්තක් දක්ව යි. මෙම පාඩමේ දී ''ශ්‍රී වික්‍රම රාජසිංහ'' නූර්තියේ එන ''ශ්‍රී ලංකා රජින්දා මේ'' ගීතය ඉගැන්වීම අපේක්ෂා කෙරේ.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- I වාරයේ ඉගෙන ගත් නූර්ති ගීය රංගනයන් සමඟ ඉදිරිපත් කිරීමට එක් සිසුවකුට හෝ සිසුවියකට හෝ අවස්ථාව ලබා දෙන්න.
- ඒ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 02**
- නූර්ති ගීතය ලියූ දාශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- CD පටයේ හෝ DVD පටයේ ඇති ගීතය ශ්‍රවණය සඳහා අවස්ථාව ලබා දෙන්න.
- කිහිප වාරයක් ශ්‍රවණය සඳහා පටය යොදා ගන්න.
- ගුරුවරයා ගීතය පියවරෙන් පියවර ගායනා කරවන්න.
- ස්ථායී, අන්තරා වශයෙන් නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- කේවල ව හා සාමූහික ව ගීතය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ගායනය කරන විට ගුරුවරයා වාදනයෙන් සහාය වන්න.
- සිසු අභ්‍යාස පෙතේ ගීතය ලියා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නිවැරැදි ශ්‍රැතියට, නිවැරදි නාදමාලාව ගායනය කළ කණ්ඩායම් තෝරා ඇගයීමට ලක් කරන්න.
- කේවල ව ගායනය සඳහා ද ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී ඔවුන්ගේ දක්ෂතා අගයන්න. (මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : පාසලේ සිංහල සාහිත්‍ය සමිතියට ප්‍රසංග අංකයක් ලෙස නූර්ති ගීතයක් ඉදිරිපත් කිරීමට පුහුණු වන්න.

**අතිරේක උදවු** : නිදහස් කාලච්ඡේදවල දී ප්‍රසංගාත්මක ව ඉදිරිපත් කිරීමට ගුරු සහාය ලබා ගෙන පුහුණු වන්න.

**ශ්‍රී වික්‍රම රාජසිංහ නූර්තිය**
**නීතීඥ ජෝන් ද සිල්වා**

සිරි ලංකා රජින්දා මේ //
කී සේ නික්ම යම් සන්තෝසේ //
සිරි ලංකා රජින්දා මේ

මේ රට වාසී - දෙත් ඔත්තු පේවී //
රාජකාරීයට මෙම දීපේ
පෙරළිය නැති කර - මම එහි ඔත්තු ගෙන //
බදු එවනෙමි - සිරි ලංකා රජින්දා මේ

මේ පුර ලක්ෂණෙන් තැබූ කල්හි
සිංහළුන්ට සිදු වෙයි නම්බූ
මහජන වැඩ ගැන - නරපති වෙහෙසෙන//
එක හොඳ ලකුණකි - ලංකා රජින්දා මේ

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | + | + | ස | රි | ග | -ග | - | රි | ස | නි | ධනි | පධ |
| | | | | + | + | සි | රි | ලං | sකා | s | ර | ජි | න් | දාs | ss |
| ස | - | - | - | - | - | ස | රි | ග | ගප | ග | රි | ස | නි | ධනි | පධ |
| මේ | s | s | s | s | s | සි | රි | ලං | sකා | s | ර | ජි | න් | දාs | ss |
| ස+ | ග | - | රි | ග | ප | ධ | සං | - | ධසං | -ධ | ප | ගප | ගරි | ස | - |
| මේ+ | කී | s | සෙ | නික් | ම | ය | මි | s | සන් | sතෝ | s | සේs | ss | s | s |
| + | ග | - | රි | ග | ප | ධ | ස | - | ධසං | -ධ | ප | ග | -රි / | ස | රි |
| + | කී | s | සෙ | නික් | ම | ය | මි | s | සන් | sතෝ | s | සේ | ss / | සි | රි |
| ග | ගප | ග | රි | ස | නි | ධනි | පධ | ස | - | - | - | - | - | - | - |
| ලං | sකා | s | ර | ජි | න් | දාs | ss | මේ | s | s | s | s | s | s | s |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| [[+ | ග | -ග | ග | ප | - | ධ | ප | - | ධසං | -සං | සං | සං | රිං | සං | සං |
| [[+ | මේ | sර | ට | වා | s | සී | s | - | දෙත් | ඔත් | තු | පේ | s | වී | s |
| + | ධ | -ධ | ධ | නි | - | ස | රි | - | නිසං | -ධ | - | ප | - | - | -]] |
| + | රා | sජ | කා | s | රි | ඇ | ත | - | මෙම | sදී | s | පේ | s | s | s |
| ස | රි | ග | ග | රි | ග | ප | ප | ග | ප | ධ | ධ | ප | ධ | සං | සං |
| පෙ | ර | ළි | ය | නැ | ති | ක | ර | ම | ම | එ | මි | ඔත් | තු | ගෙ | න |
| ගං | රිං | සං | ධ | ප | ග / | ස | රි | | | | | | | | |
| බ | දු | එ | ව | නෙ | මි / | සි | රි | | | | | | | | |

**ක්‍රියාකාරකම 24**

# නාඩගම් ගීත ගායනය

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- නාඩගම් ගීත ගායනය කිරීමේ කුසලතාව ලබයි.
- නාඩගම් ගීත වාදනය කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**:
- තෝරා ගත් නාඩගම් ගීතය ලියූ දෘශ්‍යාධාරයක්.
- තබ්ලාවක්, මද්දලයක් හෝ සර්පිනාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

නාඩගම් වශයෙන් සලකන ලබනුයේ අතිපැරණි ඇහැළේපොල, **බැලසන්ත, ඉයුජින්, බ්‍රම්පෝර්ඩ්, හුනුකොටුව, සුළඹාවතී, මරිගිදා, ස්ථාක්ති**, වැනි නාඩගම්ය. ඒවා කර්ණාටක සංගීතය ආශ්‍රයෙන් ගොඩ නැගී ඇත. මීට 30 වසරකට පමණ පෙරාතු ව මහාචාර්ය සරච්චන්ද්‍ර සූරීන් අතින් නිර්මිත මනමේ සිංහබාහු වැනි නව නාට්‍ය සඳහා පාදක කරගෙන ඇත්තේ මුලින් සඳහන් කළ පැරණි නාඩගම්හි ගී තනු හා නව ගී තනු ය. **වෙස්සන්තර** හා **කාලගෝල** චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ රචනා කොට නිෂ්පාදනය කළේ ය. ඔහුගේ යුගය වනවිට නාඩගම්වල උතුරු ඉන්දීය රාගධාරි සංගීතය මිශ්‍ර ව තිබුණු බව මහාචාර්ය සුනිල් ආරියරත්නයෝ සඳහන් කරති. මනමේ නාටකයේ එන **දුලා නෙතුපුලා, ලපනොමවන් සඳ** වැනි ගීත ඊට නිදසුන් ය. ගුණසේන ගලප්පත්ති සූරීන් විසින් පැරණි **සඳකිඳුරු** කවි නාඩගම ඇසුරින් අම්පෙ චාල්ස් ද සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේගේ උපදෙස් පිට නැවත සඳකිඳුරු නාඩගම නවීන වේදිකාව සඳහා සකස් කර ඇත. පුණ්‍යසේන ගුණසිංහ චාල්ස් ද සිල්වා ගුරුන්නාන්සේගේ පුතෙකි. ඔහු විසින් රචිත 'සිංහල නාඩගම් ගී සරණිය ' නම් පොතෙහි දික්තල කාලගෝල චාල්ස් ද සිල්වා ගුරුන්නාන්සේ විසින් නිර්මිත නාඩගමක් ලෙසට දක්වා ඇත. ඒ අනුව කාලගෝල නව නාට්‍යයක් ලෙසට හා නාඩගමක් ලෙසට යන අර්ථ දෙකින් ම දැක්විය හැකි ය. 8 ශ්‍රේණියේ සිසු/සිසුවියන්ගේ පරිණතිය, ඇල්ම සහ හැකියාව අනුව අති පැරණි නාඩගම් ගී ගායනයට වඩා ජනප්‍රිය කාලගෝල නාට්‍යයේ ගීත යොදා ගැනීම ඵලදායී වේ.

මේ සඳහා ගුරුවරයා විසින් පහත දක්වා ඇති නාඩගම් ගීත ලැයිස්තුවෙන් එක් ගීතයක් තෝරා ගන්න.

- අම්බරයේ සඳ
- අපි ගමට යමු
- රතදර සිරියා
- විසුවෙන් රැ සයනේ
- ඒ බුදු බව පතමින
- පායාලා අඹරේ
- ස්වර්ණා රන් පටසළු

කාලච්ඡේද 01ක් තුළ දී ඉහත ගීතවලින් එක් ගීතයක් ගායනා කිරීමට පුහුණු කරවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- ඉහත ගීත ලැයිස්තුවෙන් තෝරා ගත් නාඩගම් ගීතය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.
- තෝරා ගත් ගීතය ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයේ රංගනමය අවස්ථාව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- තෝරා ගත් ගීතය ගයා/වයා පෙන්වන්න.
- එය අනුකරණය කරමින් සිසුන්ට ගායනය කිරීමට පුහුණු කරවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**

- තනි තනි ව ඉදිරිපත් වන සිසුවකුට/සිසුවියකට ගායනයේ යෙදීමට අවස්ථාවක් ලබා දෙන්න.
- එහි නිවැරදිතාව පිළිබඳ ව ඔබ සැලකිලිමත් වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත් රසවත් ව ඉදිරිපත් කරන සිසුවා පන්තිය ඉදිරියට ගෙන අගය කරන්න.

**පසු අභ්‍යාස** : වාර අවසාන ප්‍රසංගය සඳහා මේ නාඩගම් ගීතය ප්‍රසංග අංගයක් ලෙසට යොදා ගන්න.

**අතිරේක උදවු** : නාඩගම් ගී සරණිය - පුණ්‍යසේන ගුණසිංහ

නාඩගම් ගී - ජයන්ත අරවින්ද

## නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායයන්හි ශෛලිය, සංගීතය හා විශේෂතා

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායන්හි ශෛලිය, සංගීතය හා විශේෂතා හඳුනා ගැනීම.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- රංග ශෛලීන් අනුව නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායයන් පිළිබඳ අවබෝධයක් ලබයි.
- නාඩගම් හා නූර්තිවල සංගීතමය වෙනස්කම් හා විශේෂ ලක්ෂණ හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**:
- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ සිංහල ගැමි නාටකය, පුණ්‍යසේන ගුණසිංහ මහතාගේ නාඩගම් ගී සරණිය යන ග්‍රන්ථ
- ඡායා පිටපත් කළ 2008 ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය 8 වන ශ්‍රේණිය පිටු අංක 132 - 136 (නාඩගම්) හා පිටු අංක 126 - 127 (නූර්ති) යන පිටු.
- ඡායාපිටපත් කරන ලද 5.1.3.5 කාර්ය පත්‍රිකාව
- නාඩගම් චරිත කිහිපයක හා නූර්ති නාට්‍ය චරිත කිහිපයක ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ලංකාවේ ප්‍රචලිත නාටක අතර නාඩගම්, නූර්ති රංගයට වඩා පැරණි වේ. ද්‍රවිඩ සංගීතඥයකුගෙන් බිහිවූ නාඩගම් හා බලිවාලා නාට්‍ය සම්ප්‍රදාය ඇසුරෙන් බිහිවූ නූර්ති රංග සම්ප්‍රදාය හා සංගීතය පිළිබඳ වත්, සිසුන් දැනුම් වත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. නාඩගම් හා නූර්ති චරිත පිළිබඳ රූප සටහන් සූදානම් කර ගන්න. නාඩගම් සම්ප්‍රදායයේ හා නූර්ති ශෛලියේ රංග වින්‍යාසයන් පිළිබඳ ව දැනුම්වත් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

- ඇඳුම් පැලඳුම්
- ගමන් තාල හා මද්දල් දෙකක් එකවර වාදනය කිරීම
- පොතේගුරා හා අත්වැල් ගායක කණ්ඩායම
- කර්ණාටක සංගීතයේ හා හින්දුස්තානි සංගීතයේ භාවිතයන්
- අදාළ සංගීත භාණ්ඩ

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- මීට පෙර ගයන ලද නාඩගම් ගීතයක් හා නූර්ති ගීතයක් ගයමින් පාඩමට ප්‍රවේශ වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- කියවීම් පත්‍රිකා හා ගවේෂණ උපදෙස් පත්‍රිකා සිසුන් අත බෙදා දෙන්න.
- සූදානම් කරගත් රූප සටහන් උපයෝගී කර ගනිමින් නාඩගම් හා නූර්ති ශෛලීන් පිළිබඳ ව විස්තර කරන්න.

- නාඩගම් හා නූර්ති පිළිබඳ කියවීම් පත්‍රිකාව ප්‍රයෝජනයට ගෙන ඇමුණුම 5.1.3.4 හා නූර්ති පිළිබඳ ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ එන කියවීම් පත්‍රිකාව හා මෙම පාඩමේ අග කොටසේ දක්වා ඇති ඇමුණුම් 5.1.3.5 දක්වා ඇති ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.
- පිටු අංක 126 - 127 (නූර්ති) යන පිටුවෙහි දෙබස ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- නූර්ති දෙබස සඳහා ඉදිරිපත් වන සිසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඇමුණුම්වල සඳහන් ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- නූර්ති දෙබස නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කළ සිසුන් අගයන්න.
- නාඩගම් හා නූර්ති පිළිබඳ ව කෙටියෙන් විස්තරයක් කිරීමට ඉදිරිපත් වන සිසු- සිසුවියන් අගය කරන්න.

**පසු අභ්‍යාස :** නාඩගම් හා නූර්ති පිළිබඳ ව සටහනක් පිළියෙළ කර සිසු-සිසුවියන්ට ලබා දෙන්න.

| | | |
|---|---|---|
| නූර්ති/නාඩගම් ආරම්භය | | |
| නූර්ති/නාඩගම් නිර්මාතෘවරු | | |
| ප්‍රචලිත නූර්ති/නාඩගම් | | |
| ගී තනු පිළිබඳ අදහස් | | |
| විශේෂ ලක්ෂණ 4ක් | | |
| යොදා ගත් සංගීත භාණ්ඩ | | |

**ක්‍රියාකාරකම 26**

# සඳැස් මත් සහ ගී මත්

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම** : සඳැස් මත් සහ ගී මත් හඳුනා ගැනීම.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- සඳැස් මත් හා ගී මත් යනු විස්තර කරයි.
  සඳස් මත් ගණන ගායනයේ දී වෙනස් විය හැකි බව පිළිගනියි.
- සඳැස මත්, ගීමත් ගණනය කරයි.
- අප අසන ගීවල ලිඛිත පද, ගායනයේ දී තාලයට අනුගත වන අයුරු විමසයි.
- ගායනයට උචිත වන සේ මාත්‍රා පිහිටුවා ගී පද නිර්මාණය කරයි.
- ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කිරීමේ දී සඳැස් මත්වල හා ගීමත්වල දැනුම ප්‍රයෝජනවත් වන අයුරු පිළිබඳව අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ''සඳැස් මත් සහ ගී මත් වෙනස දක්වන ලද දෘශ්‍ය උපකරණය
- ''කොබෝ කුරුලු වනේ ''පැදියක් ලෙස ලියූ දෘශ්‍ය උපකරණය සහ එම පැදිය ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණය.
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මෙම ශ්‍රේණියේ සිසුන් ලඝු, ගුරු, ප්ලුත, මාත්‍රා, ආදි සංකල්ප මීට පෙර පන්තිවල දී අධ්‍යයනය කර ඇත. එම දැනුම මෙම පාඩමේ දී වැදගත් වන බව සාකච්ඡා කිරීම ඵලදායී වේ. සඳැස් මත් හා ගීමත් යනු ගීතයක, පැදියක මාත්‍රා ගණනය කළ හැකි තවත් සංකල්ප දෙකකි. ගීත ප්‍රස්තාර කිරීමේ දී මෙම සංකල්පවල දැනුම ප්‍රයෝජනවත් වේ.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- කොබෝ කුරුලු වනේ පැදියක් ලෙස ලියූ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එය යති සහිත ව ගයා වයා ශ්‍රවණයට සලසන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- පැදියේ වචනවලට හිමි මාත්‍රා ගණනය කරවන්න.
- ගීයක් ලෙස ගායනයේ දී විභාග වන ආකාරයට පද ප්‍රස්තාර කරවන්න.
- මාත්‍රා ගණනය කරවන්න.
- සඳැස් මත් සහ ගී මත් පැහැදිලි කරමින් සටහනක් ගොඩනගන්න.

(මිනිත්තු 20)

**පියවර 03** තෝරා ගත් ජන ගී කිහිපයක් රසවත් ව ගයා වයා පෙන්වන්න.

එම ගීවල සඳැස් මත් ගී මත් ගණනය කරවන්න. ප්‍රස්තාරකරණයේ දී සඳැස් මත්වල සහ ගීමත්වල උපයෝගීතාව පැහැදිලි කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සඳැස් මත්, ගී මත් පිළිබඳ උදාහරණ දක්වමින් පැහැදිලි කිරීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :** ශ්‍රවණ මාධ්‍යයෙන් පැදි/ සරල ගීත ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

**අතිරේක උදවු :** හෙළ ගී මග - ඩබ්. බී. මකුලොලුව
ශ්‍රී ලංකාවේ ජන සංගීතය - ගුණපාල විතානගේ ( දූ.ගු.අ. මොඩියුලය)

**ඇමුණුම :**

- වචනවලට හිමි මත් ගණන සහ ගායනයේ දී ලැබෙන මත් ගණන වෙන් කර හඳුනා ගැනීමට හැකි වන සේ පහත දැක්වෙන ගී පද කළුලෑල්ලේ ලියා දක්වන්න.
  **කොබෝ - කුරුලු වනේ - සඳැස්මත් ගණන 09**

- පළමු හා දෙවන පද ගයා /වයා දැක්වීමෙන් පසු

- ගායනය කරන ආකාරය අනුව පද ප්‍රස්තාර කර දක්වන්න.
  **කොබෝ - / කුරුලු -/ වනේ -/ - - - / ගී මත් 12කි**

# යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාර

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම** : යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම ලබා ගනිමු.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- යතිය යනු පැහැදිලි කරයි.
- පැදියක යති යෙදෙන ස්ථාන පැහැදිලි කරයි.
- යතියක් යෙදීමේ වාසි දක්වයි.
- යති සහිත ගී පද ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්**:
- පද අග සහ පද මැදග යති සහිත පැදියක් ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණය.
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

යතිය යනු පැදියක සඳැස්මත් ගණනට වඩා වැඩි වූ මත් ගණන පිහිටන ස්ථානය යි. පැදියක යතිය පිහිටනුයේ පද අග ය. පද අග සහ පද මැද යතිය පිහිටන අවස්ථා ද ඇත. ගී මත් යනු පැදියක යතිය අනුව ඇදපැද ලෙළවා ගයන විට ලැබෙන සම්පූර්ණ මත් ගණන යි. ගීත ප්‍රස්තාර කිරීම සඳහා යතිය පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වේ. යතියට හිමි මාත්‍රා ගණන සීමා වනුයේ එම පැදියේ තාල ලක්ෂණ මත ය. යතියේ ප්‍රභේද වන සශබ්ද යති, නිශ්ශබ්ද යති, ස්ථායී යති, අස්ථායී යති ආදි විවිධතා පිළිබඳ මෙම ශ්‍රේණියේ දී සාකච්ඡා කිරීම අවශ්‍ය නැත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- යති සහිත පැදිය ලියූ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එය යති සහිත ව ගයා වයා ශ්‍රවණයට සලසන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- යතිය පිහිටන ස්ථාන නිරීක්ෂණය කරවන්න.
- යතිය සහිත ව පද ප්‍රස්තාර කරවන්න. යතිය පිහිටන අයුරු සාකච්ඡා කරන්න.
- යතිය පිහිටන ආකාරය අනුව මාත්‍රා ගණනය කරවන්න.
- යතිය පැදියක අග සහ මැදග යන අවස්ථා දෙකේ ම යෙදෙන අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.
- යතිය සහ යතියට හිමි මත් ගණන් පැහැදිලි කරමින් සටහනක් ගොඩනගන්න.

(මිනිත්තු 20)

**පියවර 03**

තෝරා ගත් ජන ගී කිහිපයක් රසවත් ව ගයා වයා පෙන්වන්න.
එම ගීවල සඳැස් මත් ගී මත් ගණනය කරවන්න. ප්‍රස්තාරකරණයේ දී සඳැස්මත්වල හා ගීමත්වල උපයෝගීතාව පැහැදිලි කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

(වාචික හෝ ලිඛිත හෝ ) සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් යතිය පිළිබඳ ව ඇගයීමක් කරන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :** යති සහිත පැදි ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

**අතිරේක උදවු :** හෙළ ගී මග - ඩබ්. බී. මකුලොලුව.
ශ්‍රී ලංකාවේ ජන සංගීතය - ගුණපාල විතානගේ ( දු.ගු.අ. මොඩියුලය)

# රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ මූලිකාංග විමසයි.

**ක්‍රියාකාරකම** : රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු අධ්‍යයනය කරමු.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු විස්තර කරයි.
- රේඛා මණ්ඩලය මත පිහිටන ස්වර ලකුණු කිරීම සඳහා යොදා ගන්නා සංකේත නම් කරයි.
- එක් එක් සංකේතයට අයත් මාත්‍රා සහ වටිනාකම් පැහැදිලි කරයි.
- රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර හත ස්වර ලකුණු කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- රේඛා මණ්ඩලය මත ස්වර ලකුණු කර සැකසූ දෘශ්‍ය උපකරණයක්
- 2010 වර්ෂයේ 8 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 160 සිට 164 දක්වා ඡායා පිටපත්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර සංගීත ප්‍රස්තාර කිරීමේ කුසලතාව පෙරදිග සංගීත විෂය හදාරන දරුවන් තුළ ද අද වර්ධනය කළ යුතු ව ඇත. ලෝකයේ එක් එක් රටවල දැනුම අනෙක් රටවලට සම්ප්‍රේෂණය කරන්නේ ද, වෙනත් රටක දැනුම තම රටට රැගෙන එන්නේ ද ඉංග්‍රීසි බස මඟින් ය. එක් එක් රටවල සංගීත නිර්මාණ හා සිද්ධාන්ත අනෙක් රටකට ගලා යන්නේ ඉංග්‍රීසි බස හා බටහිර සංගීත ප්‍රස්තාර මඟින් ය. අන්තර්ජාලය තුළ අඩංගු සංගීත ඥානය ද තවත් කෙනෙකුට පරිශීලනය කළ හැකි වන්නේ ඉංග්‍රීසි බස හා බටහිර සංගීත ප්‍රස්තාර මඟින් ය. උත්තර භාරතීය රාගධාරී සංගීතය ද අද අන්තර්ජාලය තුළින් ඉගෙනුමට ඉඩකඩ සලසා ඇති අතර ඒ සඳහා ද යොදා ගෙන ඇත්තේ ඉංග්‍රීසි බස හා බටහිර සංගීත ප්‍රස්තාර ක්‍රමවේදය යි. මේ නිසා බටහිර සංගීත ප්‍රස්තාර කිරීමේ කුසලතාව පෙරදිග සංගීත විෂය හදාරන දරුවන් තුළ ද වර්ධනය කළ යුතු ව ඇත. මෙහි දී ගැඹුරු බටහිර සංගීත සිද්ධාන්ත ඉගැන්වීම අපේක්ෂා නොකරන අතර පෙරදිග ප්‍රස්තාරයක් බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමටත්, බටහිර ප්‍රස්තාරයක් පෙරදිග ක්‍රමයට පෙරළා භාවිත කිරීමටත් හැකියාව ඇති කිරීම පමණක් මෙම පාඩම් මාලාවෙන් අපේක්ෂා කෙරේ.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- රේඛා මණ්ඩලය මත ස්වර ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එය ගයා වයා ශ්‍රවණයට සලසන්න.
- පෙරදිග ස්වර මඟින් එම ප්‍රස්තාරය ම ගයා වයා පෙන්වන්න.
- එහි ඇති සංකේත මඟින් අදාළ ගීතයේ තනුව ප්‍රකාශ වන අයුරු පැහැදිලි කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු කොටසින් කොටස පැහැදිලි කරන්න.

- රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර ලකුණු කරන්න.

(මිනිත්තු 15)

**පියවර 03** සසස/ රිරිරි/ ගගග/ මමම/ පපප/ ධධධ/ නිනිනි/ ස්--/ වැනි ස්වර ඛණ්ඩයක් රේඛා මණ්ඩලය මත සටහන් කිරීමට යොමු කරන්න. (මෙහිදී සෙමිබ්‍රීව් සංකේතය පමණක් යොදා ගන්න. ටයිම් සිග්නේචර් අවශ්‍ය නොවේ.)

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් (වාචික හෝ ලිඛිත) රේඛා මණ්ඩලය මත ස්වර පිහිටීම පිළිබඳ ව ඇගයීමක් කරන්න.


(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :** රේඛා මණ්ඩලය මත ස්වර අභ්‍යාසයක් ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

**අතිරේක උදවු :** 2010 වර්ෂයේ 8 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 160 සිට 164 දක්වා

ඇමුණුම :

පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය දෘශ්‍ය උපකරණයක් ලෙස ගොඩ නඟා ගන්න.



# බටහිර ප්‍රස්තාරයක දී ස්වර සඳහා යොදා ගනු ලබන විවිධ සංකේත සහ වටිනාකම්

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ මූලිකාංග විමසයි.

**ක්‍රියාකාරකම** : බටහිර ප්‍රස්තාරයක දී ස්වර සඳහා යොදා ගනු ලබන විවිධ සංකේත සහ වටිනාකම්

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- රේඛා මණ්ඩලය මත පිහිටන ස්වර පිළිබඳ විස්තර කරයි.
- බටහිර ප්‍රස්තාර ක්‍රමයට අනුව එක් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට භාවිත කරන සංකේත නම් කරයි.
- එම සංකේතවල එකිනෙක වෙනස්කම් පැහැදිලි කරයි.
- බටහිර ප්‍රස්තාර ක්‍රමය පිළිබඳ අවබෝධය ලෝක සංගීතය හඳුනා ගැනීමට අවශ්‍ය බව පිළිගනියි.
- රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර ඇතුළත් සරල ස්වර ප්‍රස්තාරයක් ලකුණු කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- රේඛා මණ්ඩලය මත ස්වර ලකුණු කර සැකසූ දෘශ්‍ය උපකරණයක්
- 2010 වර්ෂයේ 8 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 160 සිට 164 දක්වා ඡායා පිටපත්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර සංගීත ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබා දීම සඳහා ගොඩ නැඟෙන පාඩම් මාලාවේ රේඛා මණ්ඩලය සහ ඒ මත ස්වර පිහිටීම මේ වන විට මෙම ශ්‍රේණියේ දරුවන් අධ්‍යයනය කර ඇත. ඊට අදාළ ස්වර පෙන්වන අතර එක් එක් ස්වරයට හිමි මාත්‍රා ගණන ද ප්‍රදර්ශනය වේ. පෙරදිග ස්වර ප්‍රස්තාරයක දී ස්වරය ලියා ඊට නියමිත මාත්‍රා ගණන කඩ ඉරි කැබලි මඟින් දැක්වේ. එහෙත් බටහිර ප්‍රස්තාරයක එක් එක් මාත්‍රා සංඛ්‍යාවන්ට හිමි සංකේත වෙන වෙන ම දැක්වේ. එසේ වුව ද, එක් එක් තාලයේ දී ඊට හිමි මාත්‍රා සංඛ්‍යා වෙනස් වේ. මෙම තත්ත්වය තේරුම් නොගෙන බටහිර ප්‍රස්තාරයක් ලිවීමට හෝ කියවීමට හෝ නොහැකි ය. මෙම පාඩමේ දී එක් එක් මාත්‍රා සංඛ්‍යාවන්ට ගැළපෙන සංකේත හඳුනා ගැනීමට ඉඩ සැලසේ.

**පාඩම සංවර්ධනය :**

පියවර 01
- අමුණා ඇති ලෙස සකසා ගත් දෘශ්‍ය උපකරණය (පෙරදිග හා බටහිර ක්‍රමයට ප්‍රස්තාර සැකසූ දෘශ්‍ය උපකරණය) ප්‍රදර්ශනය කරන්න.
- එම ප්‍රස්තාර කොටස් අතර සම්බන්ධය සාකච්ඡා කරන්න. පෙරදිග ප්‍රස්තාරයක කඩ ඉරි මඟින් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වුව ද එක් එක් සංඛ්‍යාවන්ට ගැළපෙන සංකේත ඇති බව පැහැදිලි කරන්න.

(මිනිත්තු 10)

| | | |
|---|---|---|
| පියවර 02 | | • ප්‍රදර්ශනය කළ දෘශ්‍ය උපකරණයේ ඇති සංකේත එකිනෙකට වෙනස් සංකේත වෙන් කර සටහන් පොතේ ඇඳීමට යොමු කරන්න.<br>• අමුණා ඇති වටිනාකම් දක්වන දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර සිසුන් වෙන් කර ඇඳ ඇති සංකේත නම් කරවන්න.<br>(Semibreve, Minim, Crotchet, Quaver)<br>• වටනාකම් දක්වන ලද දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එකිනෙක සාකච්ඡා කරන්න. කාර්ය පත්‍රිකාව 01 වගුව සම්පූර්ණ කරවන්න.<br>• තිත් සහිත වටනාකම් (Dotted Notes) දක්වන ලද දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එකිනෙක සාකච්ඡා කරන්න.<br>• කාර්ය පත්‍රිකාව 02 වගුව සම්පූර්ණ කරවන්න.<br>(මිනිත්තු 10) |
| පියවර 03 | | • ඇමුණුමේ දක්වා ඇති බටහිර ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරවන්න.<br>• සුවඳ පත්ම වැනි ඇඳීම රහිත ගීතයක පළමු පාද කිහිපය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරවා ඉදිරිපත් කරවන්න.<br>(මිනිත්තු 10) |


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**


- මාත්‍රා 4 සහ 3 විභාග සහිත ස්වර ප්‍රස්තාර කොටස් ප්‍රදර්ශනය කර ඒවා රේඛා මණ්ඩලය මත ප්‍රස්තාර කරවා ඇගයීමක් කරන්න.
- කඳු පෙළ අතරේ තුරු වදුලේ වැනි සරල ස්වර ස්ථාපන ගීයක් බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරවා ඉදිරිපත් කරවන්න.

(මිනිත්තු 10)



| | | |
|---|---|---|
| පසු අභ්‍යාස | : | සිසුන් දන්නා ස්වර ස්ථාපන ගී ප්‍රස්තාර කිරීමට යොමු කරන්න. |
| අතිරේක උදවු | : | 2010 වර්ෂයේ 8 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 165 සිට 168 දක්වා |

**ඇමුණුම :**






**කාර්ය පත්‍රිකාව - 01 වගුව**

| | සංකේතය | සෙමිබ්‍රීව් | මිනිම් | ක්‍රොචර්ට් | ක්වේවර් | සෙමික්වේවර් |
|---|---|---|---|---|---|---|
| සෙමිබ්‍රීව් එකකට |  | එකයි | දෙකයි | හතරයි | අටයි | දහසයයි |
| මිනිම් එකකට |  | $\frac{1}{2}$ | එකයි | දෙකයි | හතරයි | අටයි |
| ක්‍රොචට් එකකට |  | $\frac{1}{4}$ | $\frac{1}{2}$ | එකයි | දෙකයි | හතරයි |
| ක්වේවර් එකකට |  | $\frac{1}{8}$ | $\frac{1}{4}$ | $\frac{1}{2}$ | එකයි | දෙකයි |
| සෙමි ක්වේවර් එකකට |  | $\frac{1}{16}$ | $\frac{1}{8}$ | $\frac{1}{4}$ | $\frac{1}{2}$ | එකයි |

ක්‍රියාකාරකම 30

# කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

**නිපුණතා මට්ටම 1.1** : ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ.

**ක්‍රියාකාරකම** : කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත හඳුනා ගනිමු.

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :
- කාෆි රාගයේ යෙදෙන ස්වර හඳුනාගනියි.
- සංගීත අධ්‍යාපනයේ ආධුනිකයකු ලෙස ස්වර ස්ථාපන ගී ගායනයේ වටනාකම පිළිගනියි.
- කාෆි රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.
- කාෆි රාගයේ ස්වර නිවැරදි ව ගයයි.
- රාගධාරී සංගීත අධ්‍යාපනයට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ''සිරිසාර අතිශාන්ත රමණීය හෙළ දීප'' ගීතය ප්‍රස්තාර කොට දක්වන ලද දෘශ්‍ය උපකරණය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

8 ශ්‍රේණියේ සිසුන් පළමු හා දෙවන වාරවල දී බිලාවල් සහ කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත අධ්‍යයනය කර ඇත. මෙම වාරයේ දී කාෆී රාගයේ ස්වර ස්ථාපනය සඳහා'' සිරිසාර අතිශාන්ත රමණීය හෙළ දීප '' යන ගීතය මෙම ශ්‍රේණියට යොදා ගත හැකි ය. මීට අමතර ව ප්‍රමාණවත් කාලයක් ඉතිරි ව ඇත්නම් ගුරුවරයා වශයෙන් ඔබට ද. කාෆි රාගධාරී පසුබිම සහිත ව නිර්මාණය කරගත් ගීත භූපාලි රාගයේ ස්වර ස්ථාපනය සඳහා යොදා ගත හැකි ය. යෝජිත ගීතය ඛඩප්තාල් මත රචනා වී ඇති ගීතයක් නිසා පාඩම සංවර්ධනයේ දී ඒ පිළිබඳ ව ද කෙටියෙන් සාකච්ඡා කළ යුතු වේ. කාෆි රාගයේ දී කෝමල ගනි ස්වර වෙනුවට ඉඳහිට ශුද්ධ ගනි ස්වර යෙදෙන බවත්, ඒ පිළිබඳ ඉදිරි පන්තිවල දී වැඩි දුර අධ්‍යයනයට ඉඩ සැලසෙන බවත් පහදන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- මීට පෙර අධ්‍යයනය කළ භූපාලි ස්වර ස්ථාපන ගීතයක් සිසුන් සමඟ ගායනය කරන්න. එහි ස්වර ප්‍රස්තාරය ද ගයවන්න.
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. භූපාලි රාගයේ යෙදෙන ස්වර සහ කාෆි රාගයේ යෙදෙන ස්වර අතර වෙනස පැහැදිලි කරන්න. බිලාවල්, භූපාලි , සහ කාෆි යන රාග අතර යෙදෙන ස්වරවල වෙනස සිසුන් සමඟ සාකච්ඡා කරන්න. මීට පෙර අධ්‍යයනය කර ඇති නම් පොතපත කියවා ගීතය සාමූහික ව ගයන්න.
- කාෆි ගීතයේ පද පිළිවෙළින් උච්චාරණය කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති ස්ථායි අන්තරා පද සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරමින් ගායනය හුරු කරන්න.

(මිනිත්තු 10)

- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති ස්ථායී අන්තරා ස්වර ප්‍රස්තාරය සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරමින් ගායනය හුරු කරන්න
  (ඔබ විසින් නිර්මාණය කර ගත් කාෆි රාගාශ්‍රිත ස්වරස්ථාපන ගීතය ද හුරු කළ හැකි ය.)

(මිනිත්තු 40)

**පියවර 03** කාෆි රාගයේ ස්වර ස්ථාපනය වී ඇත්ද යි විමසීමට විවිධ ක්‍රියාකාරකම්වල යොදවන්න. අධ්‍යයනය කළ ගීතයෙන් තෝරාගත් විශේෂ ස්වර සංගති කොටස් වෙන් කර ගනිමින් එම ස්වර සංගති ගායනය හුරු කරවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පුහුණු කළ ගීතයේ තෝරා ගත් කොටස් ගායනයට සලසා සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :
- නිදහස් කාලවල දී කාෆි ස්වර ගායනය කිරීමට යොමු කරන්න.
- ස්වර වේගවත් ව ගායනයට යොමු කරන්න.
- නිදහස් කාලවල දී බිලාවල් රාගයේ ස්වර සහ කාෆි රාගයේ ස්වර පිහිටන ස්ථාන සර්පිනාවක් හෝ යතුරු පුවරු භාණ්ඩයක් මඟින් සෙවීමට පොලඹවන්න.

**අතිරේක උදවු** :

ඇමුණුම

**ස්ථායි**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස | රි | ග | - | ම | ප | ප | ප | - | ස්̇ |
| සි | රි | සා | S | ර | අ | ති | ශා | න් | ත |
| නි | නි | ධ | - | නි | ධ | ප | ප | - | ප |
| ර | ම | ණී | S | ය | හෙ | ළ | දී | S | ප |
| ම | ප | ධ | ම | ප | ග | - | රි | - | රි |
| මෙ | ග | මැ | S | ණී | ය | නි | ප්‍රේ | S | ම |
| රි | ග | ම | රි | ග | ස | - | - | - | - |
| ඔ | බෙ | පා | S | ව | දි | ම් | S | S | S |
| | | | | | | | | | |
| ම | ප | නි | - | නි | ස්̇ | නි | ස්̇ | - | ස්̇ |
| සු | වි | නී | S | ත | ග | ති | හා | S | ම |
| නි | නි | ස්̇ | - | රි̇ | නි | ධ | ප | - | ප |
| ප | ර | තේ | S | ජ | ක | ළ | හී | S | න |
| ම | ප | ධ | ම | ප | ග | ග | රි | - | රි |
| නි | ති | වී | S | ර | ග | ති | පා | S | න |
| රි | ග | ම | රි | ග | ස | - | - | - | - |
| ඔ | බෙ | ශ්‍රී | S | වි | දි | ම් | S | S | S |

ස්ථායි

| | | | |
|---|---|---|---|
| ස - රි | ග - ම | ගම ප - | - - - |
| හෝ s s | හෝ s s | ගා s s | s s s |
| ප ම ග | ම ග රි | ස - - | - - - |
| රැ ල් ල | බි ඳෙ න | වා s s | s s s |
| ප ධ නි | ධ ප ම | ප ධ නි | ධ ප ම |
| ර ළ පි | ට ර ළ | පෙ ර ලි | පෙ ර ලි |
| ප ධ නි | ස̇ නි ධ | ප ම ග | රි ස නි |
| වෙ ර ළ | ට එ න | වා s s | s s s |

අන්තරා

| | | | |
|---|---|---|---|
| ම ම ප | ප නි නි | ස̇ ස̇ නි | ස̇ ස̇ - |
| නැ ග දි | ව එ න | ම හ ර | ළ ක ඳ |
| රි̇ ග̇ රි̇ | ස̇ රි̇ නි | ස̇ - - | නි ධ ප |
| වෙ ර ළෙ | හැ පෙ න | වා s s | s s s |
| ප ධ නි | ධ ප ම | ප ධ නි | ධ ප ම |
| වෙ ර ළෙ | හැ පී | සු ඳු පෙ | න ද ස |
| ප ධ නි | ස̇ නි ධ | ප ම ග | රි ස නි |
| අ ත වි | හි ඳෙ න | වා s s | s s s |

**ක්‍රියාකාරකම 31**

# දෙතිතට අයත් තිත් තාල පද

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** : දෙතිතට අයත් තිත් තාල පද හඳුනා ගනිමු.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- මිශ්‍ර මත් කැටි සහිත දේශීය තාල පද නම් කරයි.
- දෙතිතට අයත් තාල පද උඩ-පහත-සබරගමු වශයෙන් විවිධ වන අයුරු සහ වෙනස දක්වයි.
- දෙතිතට අයත් උඩ-පහත-සබරගමු තිත් තාල පද නම් කරයි.
- තාලය යන්න විශ්වයටම පොදු සංකල්පයක් බව පිළිගනියි.
- දෙතිතට අයත් තිත්තාල පද අතින් නිරූපණය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- දෙතිතට අයත් උඩ-පහත-සබරගමු තිත් තාල පද ප්‍රස්තාර කර දැක්වූ දෘශ්‍ය උපකරණයක්.
- ගැටබෙරය, දවුල, සහ පහත රට බෙරය වැනි අවනද්ධ භාණ්ඩ කිහිපයක්.
- ඇමුණුමේ දක්වා ඇති පරිදි දෙතිතට අයත් ලෙස ජන ගී පාද ප්‍රස්තාර කර දැක්වූ දෘශ්‍ය උපකරණයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මීට පෙර පාඩම්වල දී මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානී තාල පද සිසුන් අධ්‍යයනය කර ඇති නිසා මෙම පාඩමින් එම මාත්‍රා බෙදීම්වලට සමාන දේශීය තිත්තාල පද අධ්‍යයනයට යොමු කිරීම අපේක්ෂිත ය.

තිත්තාල පද දේශීය නර්තන කලාව හා සමඟ බැඳී පවතී. දේශීය නර්තන කලාව උඩරට-පහතරට සහ සබරගමු වශයෙන් ප්‍රභේද තුනකි. එ නිසා තිත්තාල පද රටාවල මාත්‍රා බෙදීම එකක් වුවත් බෙර පද එකිනෙකට වෙනස් ය. එසේ වනුයේ එම නර්තන සම්ප්‍රදායවල භාවිත වන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය පදනම් කරගෙනය. උඩරට දී ගැට බෙරයත්, පහත රට දී දෙවොල් බෙරයත්, සබරගමුවේ දී දවුලත් ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ වන නිසා ය. හින්දුස්ථානී තාල පද සියල්ල ගොඩ නැඟී ඇත්තේ තබ්ලාව පදනම් කරගෙන ය. එබැවින් එම තාල පදවල අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත් වන අක්ෂර වේ. එහෙත් දේශීය තිත් තාල පද අවනද්ධ වාද්‍ය භාණ්ඩ තුනක් මූලික කරගෙන ගොඩ නැඟෙන නිසා එක ම තිතක දී වුවත් බෙර පද එකිනෙකට වෙනස් වේ. මේ පිළිබඳ ව සරල ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එක ම මාත්‍රා ගණනකින් ගොඩ නැඟෙන තිත්තාල තනිතිත වශයෙන් ද, මිශ්‍ර මාත්‍රා කැටි දෙකක් එකතු වී ගොඩ නැගෙන තාල පද දෙතිත වශයෙන් ද ප්‍රභේද වන බව සරල ව පෙන්වා දෙන්න. පහත දැක්වෙන දෙතිතේ ප්‍රභේදවලට අයත් ජන ගී පිළිබඳ ගායන කුසලතාව මෙමෙ පාඩමේ දී ගුරුවරයාට වැදගත් වේ.

- මොර හිඹුටු දම් පනා - අඹ දඹ ද ඇටඹිනා
  පලුවීර දෙබරිනා - කඳ ලිවිලි කුන් ගෙනා

- උදුල තරුවැල වතළ සොඳු රූ - සැඳහැ කැලුමෙන නිබඳ අඳුරු
  පැලඳි නිලඹර නිසඹ බිසරු - මලුපු රතුපුල නිලුපු ලයුරු

- වන් නිල් ගෙල නිල් රල් වර ලින් තුල් බිඟු දැල්ලා
  වන් පුන්සඳ මෙන් රන් තඹරින් පුල්වත දුල්ලා
  කන් වැල් විදු සැල්මෙන් මිණි කැල්මෙන් ගත නිල්ලා
  සුන්දර පැරකුම් රජ දිගු බැල්මෙන් සිත ලොල්ලා

මෙම ජන ගී හෝ දෙතිතට අයත් ඔබ දන්නා ජන ගී හෝ මේ සඳහා යොදා ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- මාත්‍රා දෙක බැගින් හෝ තුන බැගින් හෝ හතර බැගින් හෝ විභාග වන ජන ගීයක් ගයා වයා ශ්‍රවණයට සලසන්න. ඊට අත්තැළීමට යොමු කරන්න. දෙතිතට අයත් ජන ගීයක් ද ගයා වයා පෙන්වන්න. එම ගී අතර වෙනස විමසන්න.

  තනිතිත සහ දෙතිත පිළිබඳ කෙටියෙන් සාකච්ඡාවක් කරන්න.
- තනිතිත යනු මාත්‍රා දෙක, තුන, සහ හතර බැගින් වන තනි වර්ගයක මත් කැටි එක් වී සැදෙන තාල පද බවත් දෙතිත යනු මාත්‍රා 2-3, 3-4 සහ 2-4 වශයෙන් මිශ්‍ර වී ගොඩ නැගෙන තිත්රූප තුන බවත් සරල ව පහදා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- ඇමුණුමේ දක්වා ඇති දෙතිතට අයත් තිත්රූප පිළිබඳ විෂය කරුණු දක්වන දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. එකිනෙක කොටස් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරමින් සටහන් කර ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු 15)

**පියවර 03**

- දෙතිතට අයත් ජන ගී ගයා වයා පෙන්වන්න. ඊට අත්තැළීමට යොමු කරන්න. වෙනස් කම් පහදා දෙන්න.

  දෙතිතට සමාන වන හින්දුස්ථානී තාල පද නම්කරන්න. සුළු-මහ දෙතිතට අයත් හින්දුස්ථානී තාල පදයක් නොමැති බවත්, එය දේශීය ජන සංගීතයේ විශේෂ අවස්ථාවක් බවත් පහදා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

දෙතිතට අයත් ලෙස රිද්ම රටා වාදනය කර ඒවා කුමන තිත් තාලයකට අයත් දැයි විමසා අගයන්න.

(මිනිත්තු 5)

**පසු අභ්‍යාස :** දෙතිතේ තිත්රූප තුනට අයත් ජන ගී රැස් කිරීමට යොමු කරන්න.

ඇමුණුම

## සුළුමැදුම් දෙතිත.

තිත් සංඥා :

/ ^ / ^

මාත්‍රා : 1 2 / 1 2 3 / 1 2 / 1 2 3 /

උඩරට බෙර පදය : දො ං / පී ං ත / ග ත / දො ං ත /

පහත රට බෙර පදය : ගු ං / දෙ ග ත / ග ත් / ත ගු ං /

සබරගමු බෙර පදය. : ජී ං / ජී මි ත / ත ත් / ත කි ට /

ජන ගී පාදයක් : මො ර / හි ඹු ටු / ද ම් / ප නා - /

## මැදුම් මහ දෙතිත.

තිත් සංඥා :

/ ^ / ^

මාත්‍රා : 1 2 3 / 1 2 3 4 / 1 2 3 / 1 2 3 4 /

උඩරට බෙර පදය : දො ං දො / පී ං ග ත / ජී ග ත / දො ං ත ක /

පහත රට බෙර පදය : ගු ං ද / ග දි ග ත / ග ත් ත / ගු ඳි ගු ඳ /

සබරගමු බෙර පදය. : ජී මි ත් / ත ත් කි ට / ත ක ට / ජී ං ත ක /

ජන ගී පාදයක් : උ දු ල / ත රු වැ ල / ව ත ල / සො ඳු රු - /

## සුලු මහ දෙතිත.

තිත් සංඥා :

/ ^ / ^

මාත්‍රා : 1 2 / 1 2 3 4 / 1 2 / 1 2 3 4 /

උඩරට බෙර පදය : දො ං / දො ං පී ං / ජී ං / ග ජී ග ත /

පහත රට බෙර පදය : දො ං / දො ං ග ත / ග ත් / දි ත් ත කු /

සබරගමු බෙර පදය. : ජී ං / ජී මි කි ට / ත ත් / ත රි කි ට /

ජන ගී පාදයක් : ව න් / නි ල් ගෙල / නි ල් / ර ල් ව ර /

ලි න් / තු ල් බි ගු / දූ ල් / ලා - - - /

# 6,8, Rhythm

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** : ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- ව්‍යවහාරයේ බහුල ව පවතින තාලයක් පිළිබඳ අදහස් දක්වයි.
- බටහිර සංගීතයේ භාවිත වන Six Eight ( 68) රිද්මයේ ස්වභාවය පැහැදිලි කරයි.
- Six Eight ( 68) රිද්මයේ ලයට සමාන අනෙක් තාල පද සසඳයි.
- තාලය යන්න විශ්වයට ම පොදු සංකල්පයක් බව පිළිගනියි.
- Six Eight ( 68) රිද්මයට අයත් ගීත ලැයිස්තු ගත කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- Six Eight ( 68) රිද්මයට බටහිර සහ පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කර දක්වූ ගී පාදයක් ඇතුළත් දෘශ්‍ය උපකරණයක්.
- අවනද්ධ භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මීට පෙර පාඩම්වල දී හින්දුස්ථානී තාල පද සහ දේශීය තාල පද කිහිපයක් සිසුන් අධ්‍යයනය කර ඇති නිසා මෙම පාඩමෙන් Six Eight ( 68) රිද්මය පිළිබඳ අධ්‍යයනයට ඉඩ සැලසීම අපේක්ෂිත ය. මෙහි දී බටහිර ක්‍රමයට තාලය හඟවන සංකේතයේ දක්වෙන අංක ( 68) මඟින් පිළිබිඹු වන අදහස් මෙම ශ්‍රේණියේ දී ඉගැන්වීම අවශ්‍ය නැත. ඒ පිළිබඳ 9 ශ්‍රේණියේ දී අධ්‍යයනයට ඉඩ සැලසේ. ඒ අනුව ඉතා සරල ව ( 68) රිද්මයේ ගති ලක්ෂණය පැහැදිලි කිරීම පමණක් ඉගැන්වීම ප්‍රමාණවත් ය. Six Eight (68) රිද්මයේ වේගවත් බව නිසා ඊට වේග රිද්මය වශයෙන් භාවිත වන බව, දේශීය සංගීතයේ දී කඩිනම් මැදුම් තනි තිත වශයෙන් සමහර අවස්ථාවලදී නම් කරන බව , බයිලා කපිරිඤ්ඤා ගීතවල දී මෙම රිද්මය බහුල ලෙස භාවිත වන බව සහ ස්වර ප්‍රස්තාර කිරීමේ දී ස්වර තුන බැගින් එකතු කරන බව ආදි කරුණු මෙම පාඩමේ දී ඉස්මතු කළ හැකි ය.

පහත දක්වෙන ගීත පිළිබඳ ගායන/වාදන කුසලතාව මෙම පාඩමේ දී ගුරුවරයාට වැදගත් වේ.

- අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ
- අහස උසට නැග ගියාට නැහැනෙ අහසෙ රැඳෙන්නේ
- කොටු වැටිච්ච පුංචි සරම ඇඳන් නටන මල්ලියා.
- යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැඟීලා - පරංගි
- කපන කොටන බිම පෙරළන ඇන ඇන එළවන තැන තැන.
- අහසට පිඹිනා එරන් කළේයා
- දන්න වංහුං අප කන්නසාමි රාජ ධුරයේ
- අයිරින් ජොසපින් රොසලින් ඇන්ජලින්
- අතුරු මිතුරු දඹදිවතුරු රාජ කපුරු සෙට්ටියා

මෙම ගී ලැයිස්තුව තුළ සරල ගී, ජනගී, බයිලා, සහ ළමා කාලයේ කෙළි සෙල්ලම්වල දී භාවිත කළ වචන සහිත ගීත එකතුවක් ද ඇතුළත් ය. ඉහත සෑම අවස්ථාවක දී ම පාහේ Six Eight ( 6/8) රිද්මය භාවිත වී ඇති බව සිසුනට පැහැදිලි කිරීමට උත්සාහ ගන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- ඉදිරි පිටුවේ දක්වා ඇති ලැයිස්තුවේ සඳහන් ගීත කොටස් ගායනය/වාදනය කරන්න. හැකි නම් නොනවත්වා එකිනෙක සම්බන්ධ කරමින් (Non Stop) ගයන්න. ඒ මත සිසුන්ට අත්තැළීමට යොමු කරන්න.
- මේ සෑම ගීතයක ම මතුවන රිද්ම ලක්ෂණය එකක් බව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

ඇමුණුමේ දක්වා ඇති Six Eight ( 6/8) රිද්මය පිළිබඳ විෂය කරුණු දක්වන දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. එහි ස්වභාවය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරමින් සටහන් කර ගැනීමට මඟ පෙන්වන්න. සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. සරල ගී, ජනගී, බයිලා, සහ ළමා කාලයේ කෙළි සෙල්ලම්වල දී භාවිත කළ වචන සහිත ගීත වශයෙන් කණ්ඩායම්වලට බෙදා නම් කරන්න. ඒ අනුව Six Eight ( 6/8) රිද්මයට ගැළපෙන ගීත ලැයිස්තුවක් සැකසීමට යොමු කරන්න.

(මිනිත්තු 10)

**පියවර 03**

කණ්ඩායම් වශයෙන් රැස් කළ ගීත ලැයිස්තු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. ඉදිරිපත් කරන ගීත කිහිපයක් ගයා/වයා පෙන්වන්න. නිවැරදි ගීත ලැයිස්තු අගය කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**


Six Eight ( 6/8) රිද්මයට ගැළපෙන රිද්ම රටා අවනද්ධ භාණ්ඩයකින් වාදනය කිරීමට සලසා අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස**

දෙතිතේ තිත්රූප තුනට අයත් ජන ගී රැස් කිරීමට යොමු කරන්න.

**ඇමුණුම:**



# වාද්‍ය භාණ්ඩ මගින් විවිධ ස්වර ඇතුළත් ගීත වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1.14** : වාද්‍ය භාණ්ඩ මගින් විවිධ ස්වර ඇතුළත් ගීත වාදනය

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :
- වාද්‍ය භාණ්ඩයන්හි ශුද්ධ කෝමල ස්වර පිහිටි ස්ථාන හඳුනා ගනියි.
- වාද්‍ය භාණ්ඩයෙන් විවිධ ස්වර සහිත ගීත වාදනය කරයි.
- තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනියි.
- ගීත වාදනය කිරීමේ හැකියාව ලැබීමෙන් ජීවිතයට වටිනාකම් ලබා ගනියි.
- තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- විවිධ ස්වර ඇතුළත් ගීත කීපයක ස්වර ප්‍රස්තාර සහිත පත්‍රිකා.
- සර්පිනාවක්
- ඔබ නිර්මාණය කර ගත් විවිධ ස්වර සහිත සංගීත ඛණ්ඩයක
- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසය ලියූ පත්‍රිකා
- සිසුන් විසින් සපයා ගනු ලැබූ වාද්‍ය භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ශුද්ධ කෝමල තීව්‍ර ආදි වශයෙන් විවිධ ස්වර යෙදෙන ගීත වාදනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. පළමුව ඇමුණුම 1හි දී ඇති ස්වර අභ්‍යාසය පුහුණු කරවන්න. දෙවනුව ගීත වාදනය කරවන්න. ඇමුණුම 1හි දී ඇති ස්වර අභ්‍යාසයට අමතර ව ගීත දෙකක් වාදනය කළ හැකිවන සේ පාඩම සංවිධානය කර ගන්න. ඔබට හුරු වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කර පෙන්වීමෙන් සිසුන් දිරිමත් කිරීම මගින් සිසු හදෙහි ඔබ පිළිබඳ ව තිබූ ගෞරවය හා විශ්වාසය වර්ධනය වනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ඔබ නිර්මාණය කර ගත් විවිධ ස්වර සහිත සංගීත ඛණ්ඩයක් සර්පිනාවෙන් වාදනය කර පෙන්වන්න.
- එම සංගීත ඛණ්ඩයෙහි ස්වර යොදා ඇති ආකාරය පිළිබඳ ව සිසුනට දැනෙන දෙය විමසමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 15)

**පියවර 02**
- ඇමුණුම අංක 1හි ස්වර අභ්‍යසය ලියූ කාර්ය පත්‍රිකාව සිසුන්ට බෙදා දී වාදනය කරවන්න.
- විවිධ ස්වර ඇතුළත් ගීත කීපයක ස්වර ප්‍රස්තාර සහිත පත්‍රිකා. සිසුන් අතට පත් කොට හෝ ප්‍රදර්ශනය කොට හෝ වාදනය කිරීමට පොලඹවන්න.
- සියලු ස්වර නිවැරදි ව වාදනය කිරීමට මග පෙන්වන්න
- ඔබට වාදනය කළ හැකි භාණ්ඩකින් සිසුන් සමඟ වාදනය කරමින් ආදර්ශ සපයන්න. (පළමු කාලච්ඡේදයෙන් මිනිත්තු 25/ දෙවන කාලච්ඡේදයෙන් (මිනිත්තු 40)

**පියවර 03**

- භාණ්ඩ අනුව කණ්ඩායම් කර හෝ තනි තනි ව හෝ වාදනය කිරීමට සලස්වන්න.
- ගීතයේ කොටස් භාණ්ඩ අනුව වෙන් කර දී සමූහ වාදනයක ස්වභාවයෙන් වාදනය කරවන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරමින් වාදනය කරවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ස්වර ස්ථානයන් නිවැරදි ව වාදනය කළ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :** නිවසේ දී අභ්‍යාස කිරීම සඳහා වෙනත් ගීත ප්‍රස්තාර ලබා දෙන්න. මේ සඳහා ඔබගේ නිර්මාණ ද භාවිත කළ හැකිය.

**අතිරේක උදවු :** ගීත ප්‍රස්තාර පොත්

# ස්වර පුවරුව මගින් ළමා ගීත වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : ස්වර පුවරුව මගින් ළමා ගීත වාදනය කරමු.

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :
- ස්වර පුවරුවෙන් ළමා ගීත වාදනය කරයි.
- තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනියි.
- ස්වර පුවරුවෙන් ගීත වාදනයට කැමැත්ත පළ කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ළමා ගීතයන්ගේ ස්වර ප්‍රස්තාර සහිත පත්‍රිකා
- ළමා ගී ඇතුළත් DVD VCD PEN DRIVE ආදි උපකරණ
- DVD VCD PEN DRIVE ක්‍රියා කිරීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර පුවරුවෙන් ළමා ගී වාදනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. 6 ශ්‍රේණියේ දී ගැයූ ඉරෙන් හඳෙන්............... සෙන්පතියන් ගැන....... බුදු සාදූ............ හිංචි පිංචි හාවා........ පේළි පේළි පේළි සැදී .......... යන ගීත අතරින් ඔබ පාසලේ සිසුනට ගැළපෙන ගීත දෙකක් මේ සඳහා තෝරා ගන්න. ළමා ගීත පිළිබඳ ව ඇල්මක් ඇති වන සේ මෙම පාඩම සැලසුම් කර ගත යුතු ය. තාල වාද්‍ය භාණ්ඩ සහිත ස්වර පුවරුවකින් තාලයක් වාදනය කොට ඒ සමඟ මෙම ගීත වාදනය කිරීමට හුරු කරවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ළමා ගීතයක් ශ්‍රවණයට සලස්වා පාඩමට පිවිසෙන්න.
- වර්තමානයේ ඇසෙන ගීත හා සසඳමින් ළමා ගීවල අගය පහදන්න.
- මිහිරි ව වාදනය කිරීම සඳහා දිනපතා අභ්‍යාස කළ යුතු බව අවධාරණය කරවන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- ළමා ගී සහිත ස්වර ප්‍රස්තාර ලබා දී වාදනය කිරීමට පොලඹවන්න.
- මුල් ගීතය කිසියම් උපකරණයක් මගින් වාදනය කොට ඒ සමඟ සිසුන්ට ද පුහුණුවීමට මඟ සලසන්න.
- සිසුන්ට උපදෙස් අවශ්‍ය වූ තැන දී පමණක් සහාය වන්න. (පළමු කාලච්ඡේදයෙන් මිනිත්තු 30/ දෙවන කාලච්ඡේදයෙන් මිනිත්තු 40)

**පියවර 03**
- සිසුන් අතැති ඕර්ගන්වලින් විවිධ භාණ්ඩයන්ගේ හඬ යොදා වාදක මණ්ඩලයක ස්වරූපයෙන් කොටස් වෙන් කර වාදනය කිරීමට යොමු කරන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කොට ඇගයීමට ලක් කරන්න. (මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ගීත මිහිරි ව හා නිවැරදි ව වාදනය කළ සිසුන් තෝරා ඇගයීමක් කරන්න. (මිනිත්තු 10)

**පසු අභ්‍යාස** : නිවසේ දී අභ්‍යාස කිරීම සඳහා වෙනත් ළමා ගීතයන්හි ස්වර ප්‍රස්තාර ලබා දෙන්න. තාල වාදනය සමඟ වැයීමට ද (ඕර්ගන් ඇති සිසුනට) උපදෙස් දෙන්න.

**අතිරේක උදවු** : ළමා ගීත පොත් හා ළමා ගීත සහිත CD හෝ DVD

# රවීන්ද්‍ර ගීත ගායනය

**නිපුණතාව 2.0** : සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 2.1** : භාරතීය ගීත ශෛල රසාස්වාදයට හුරු වෙයි.

**ක්‍රියාකාරකම** : රවීන්ද්‍ර ගීත ගායනය.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- රවීන්ද්‍ර ගීත ගායනය කරයි.
- රවීන්ද්‍ර ගීත ශ්‍රවණයට කැමැත්තක් දක්වයි.
- රවීන්ද්‍ර ගීත රසාස්වාදනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම අංක 1හි සඳහන් ගීතය ලියන ලද දෘශ්‍යාධාරකය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්, සර්පිනාවක්, තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

හින්දුස්ථානී සංගීතයට අයත් රවීන්ද්‍ර ගීත ශෛලිය තාගෝර්තුමා විසින් නිර්මිත ගීත ශෛලියකි. ඉන්දියාවේ වංග ප්‍රදේශයේ ප්‍රචලිත වූ මෙම ගීත ශෛලිය සරල තනු හා සරල තාල මත නිර්මිත යි. වංග ජන ගී ආශ්‍රයෙන් ගොඩනැගුණු රවීන්ද්‍ර ගීත, රබීන්ද්‍ර ගීත නමින් ද හැඳින්වේ. සමහර ගී තනු නිර්මාණයේ දී තාගෝර් තුමා බටහිර සංගීතයේ ශිල්පීය කොටස් ද ආශ්‍රය කරගෙන ඇති බැව් පිළිගත් මතයකි. සුනිල් සාන්ත හා ආනන්ද සමරකෝන් තම සරල ගී නිර්මාණයේ දී වංග සංගීතයේ ආභාසය ලබා ඇත. වංග ගීතවල ගායන ශෛලිය රවීන්ද්‍ර ගීත වල ද දක්නට ලැබේ. රවීන්ද්‍ර ගීතයක් ගායනය කිරීමත් රසාස්වාදනයට යොමු කිරීමත් මෙම පාඩමින් අපේක්ෂිත ය. සුදුසු ගීතයක් මේ සඳහා යොදා ගන්න.

පහත දැක්වෙන ගීත ද මේ සඳහා සුදුසු ය.

නම්රෙ කිසී බොලෝ රධා
ජොධිතෝර් ඩක්සුනෙ කෙව්
බ්‍රිජන් පොතේ ජයරෙ දනී.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- රවීන්ද්‍ර ගීත ඇසුරු කොට නිර්මාණය වූ සිංහල ගීයක් ගයා පෙන්වන්න.
  (මේ සඳහා ආනන්ද සමරකෝන් මහතාගේ හෝ සුනිල් සාන්ත මහතාගේ ගීතයක් යොදා ගත හැකි ය.) (මිනිත්තු 05)

**පියවර 02**
- තෝරා ගත් ගීතය ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය සම්පූර්ණයෙන් රසවත් ව ගායනය කරන්න.
- සිසුන් සමග ගායනයේ යෙදෙන්න.
- තාල වාදන භාණ්ඩයක් යොදා ගනිමින් ගායනය හුරු කරවන්න.
- ගීතය කොටසින් කොටස තනි තනි ව ගායනයට යොමු කරවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ඒකල ව හා සාමූහික ව ගීතය නිවැරදි ව හා මිහිරි ව ගැයූ සිසුන් අගයන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : විවිධ ප්‍රසංගයේ දී රවීන්ද්‍ර ගීතයක් ගායනයට යොමු කරවන්න.

**අතිරේක උදවු** : අන්තර්ජාලය ඇසුරින් රවීන්ද්‍ර ගීත ශ්‍රවණයට යොමු කිරීම.

1. බෙංගාලි ගී
ජොධිතෝර් ඩක්සුනෙ කෙව්
නා ආසේ තොබේ ඇක්ල චොලෝරේ
ඇක්ල චොලෝ////
ජොධි කෙව් ඔථනා කොයි
ඔරේ ඕරේ ඕ අභගා
කෙව් කොථනා කොයි
ජොධි සොභායි ථකේ මුක්හිරයේ
සොභායි කොරේ හෝයි//
තොබේ පොරාන් කුලේ... ඔතුයි
මුක්ෆුටෙ තෝර් මොනේර් කොටාර්
ඇක්ල බොලෝරේ...
ජොධි සොභායි ෆිරේ ජායි....
ඔරේ ඕරේ ඕ අභගා සොභායි ෆිරේ ජායි
ජොධි ගොභාන් පොතේ ජබාර් කලේ
කෙව් ෆිරනා ජායි
තොබේ පොතේර් කථා ඔතුයි
රොක්තො මතා චොරෝන් කලේ
ඇක්ල දොලොරේ...
ජොධි ඇලෝර් නාදොරේ
ඔරේ ඕරේ ඕ අභගා අලෝර් නාදොරේ
ජොධි ඣොර් බොදලේ අදාර් රතේ
දුයාර් දෙයි සොරේ....
තොබේ බොද්රොනොලේ - අපෝන්
හු කේර් පජාර් ජලියෙ නියේ
ඇක්ල ග්චොලෝරේ....

2. නම්රෙ කිසී බොලෝ රධා ජබොයි දෙකේ තී
අමිත ෂොදෝර් බෆොර් දියෝ බොලෝ දෙකෝ තී
බෝලෝ රාධා බොලො රාධා ජයති තිෆොර්
අමිතෂොදොර් ගයති මධූර් ගී - ගයති මධූර් ගී
එක්ම අධර් අයිද බොලෝ අයිද ඔම්රි යාද්, තෙරි
ජයති තිෂෝර් ජයති තිෂෝර් අයිද ඔම්රි යාද්
බෝලෝ රාධා...

# රවීන්ද්‍ර ගීත හා භජන් ගීත ශෛලීන්හි විශේෂතා

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 3.1** : භාරතීය ගීත ශෛලීන් රසාස්වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : රවීන්ද්‍ර ගීත හා භජන් ගී ශෛලීන්හි විශේෂතා

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- රවීන්ද්‍ර ගී ශෛලියෙහි ලක්ෂණ විස්තර කරයි.
- භජන් ගීත ශෛලියෙහි ලක්ෂණ විස්තර කරයි.
- රවීන්ද්‍ර ගීත සහ භජන් ගී ශ්‍රවණයට කැමැත්ත දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- භජන් ගීතයක් සහ රවීන්ද්‍ර ගීතක් ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- සර්පිනාවක්, තබ්ලාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

රවීන්ද්‍ර ගීත ශෛලියෙහි හා භජන් ගීත ශෛලියෙහි ලක්ෂණ පිළිබඳ සරල අවබෝධයක් ලබා දීම මෙම පාඩමින් අපේක්ෂිත ය. තාක්ෂණ උපකරණයක ආධාරයෙන් ගීත ශ්‍රවණය කිරීමට සලස්වා සාකච්ඡා කිරීම වඩාත් සුදුසු ය. ශ්‍රවණය කරන අතරතුර ශෛලිවල ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡාව යෙදෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- භජන් ගීතයක හා රවීන්ද්‍ර ගීතයක කොටසක් බැගින් ශ්‍රවණයට සලස්වන්න. එහි ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඇමුණුම් අංක 01 හි සඳහන් තොරතුරු පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම පත්‍රිකාවේ හිස්තැන් සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.
- තොරතුරු සම්පූර්ණ කළ පත්‍රිකාවට අදාළ පිළිතුර අනුව ශෛලි දෙකෙහි ලක්ෂණ පිළිබඳ ව සංසන්දනාත්මක සාකච්ඡාවක් මෙහෙයවීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 20)

**පියවර 03** සම්පූර්ණ කරන ලද පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු ශෛලී දෙකෙහි ලක්ෂණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම ක්‍රියාකාරකමේ දී සාර්ථක ව කරුණු ඉදිරිපත් කළ සිසුන් අගයන්න.
(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : ශෛලි දෙකෙහි ප්‍රචලිත ගීත 05 බැගින් ලැයිස්තුවක් සකස් කරන්න.

**අතිරේක උදව්** : අන්තර්ජාලය ඇසුරින් ගීත ශ්‍රවණයට යොමු කරන්න.

**ඇමුණුම් අංක 01**

| ශෛලියෙහි ලක්ෂණ | ශෛලිය |
|---|---|
| දෙවියන්ගේ ගුණ ගයයි. | භජන් ගීත |
| රවීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් නිර්මිත ය. | රවීන්ද්‍ර ගීත |
| සමූහ ගායනා ක්‍රමයකි. | .................... |
| එස්රාජය ප්‍රධාන වාද්‍ය භාණ්ඩයකි. | .................... |
| ගීත ආරම්භයේ මීන්ඩ් ලක්ෂණ ඇත. | .................... |
| ක්‍රමයෙන් ලය වැඩි වේ. | .................... |
| හින්දි සංයුතියෙන් රචනා වී ඇත. | .................... |
| වංග බසින් රචනා වී ඇත. | .................... |
| හින්දුස්ථානී තාල පද වාදනය කෙරේ. | .................... |
| කෝල් නමැති තාල වාද්‍ය භාණ්ඩය යොදා ගනී. | .................... |
| සරල තාල මත ගායනය කෙරේ. | .................... |
| සමහර ගීත රාග පදනම් කරගෙන නිර්මාණය වී ඇත. | .................... |
| බෙංගාල ............................................ ඇසුරු කොට ගෙන ඇත. | .................... |
| උත්තර භාරතයෙහි ප්‍රචලිත ය. | .................... |
| බෙංගාල ප්‍රදේශයෙහි ප්‍රචලිත ය. | .................. |
| සිතාරය, බටනළාව, ................................, වයලීනය, එස්රාජ් සාරංගි වැනි භාණ්ඩ සහාය වාදනයට යොදා ගනී. | .................... |
| කෙටි ස්වර ඛණ්ඩ, තාලය ගයයි. | .................... |
| මීරාබායි තුල්සිදාස් ගැන කියවේ. | .................... |

# කිතුනු බැති ගී ගායනය කරයි

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 3.3** : කිතුනු බැති ගී රසාස්වාදනයේ යෙදෙයි

**ක්‍රියාකාරකම** : කිතුනු බැති ගී ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- කිතුනු බැති ගීයක් ගායනය කරයි.
- කිතුනු බැති ගී ශ්‍රවණයට කැමැත්තක් දක්වයි.
- කිතුනු බැති ගී හා බොදු බැති ගී අතර වෙනස්කකම් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ලියන ලද දෘශ්‍යාධාරකය
- ස්වර වාද්‍ය භාණ්ඩයක් හා තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ක්‍රිස්තියානි ආගම හා බැඳුණු ගීත විශේෂයක් වන කිතුනු බැති ගීයක් ගායනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. බටහිර සංගීතයේ ආභාසය ලබා ඇති මෙම ගීතවල එම ලක්ෂණ දැකිය හැකි බැවින් ඒවා ද සිසුන් සමඟ සාකච්ඡා කළ හැකි ය. මේ සඳහා දෙවන් පහන් මිණි නගා යන ගීතය නිර්දේශ කර ඇත,

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- රොනට වඩින බිඟු ඔබයි යන ගීතය ගයන්න. ඒ පිළිබඳ අදහස් සිසුන්ගෙන් විමසන්න.

**පියවර 02**
- ගීතය ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න,
- ගීතය සම්පූර්ණයෙන් ගායනය කර පෙන්වන්න,
- ගීතය කොටසින් කොටස ගායනය හුරු කරවන්න.
- තාල වාද්‍ය භාණ්ඩයක් යොදා ගෙන ගායනය කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- ගීතය පාදයෙන් පාදය ගායනයට හුරු කරවන්න,
- කණ්ඩායමකට එක් කොටසකුත් තවත් කණ්ඩායමකට තවත් කොටසකුත් වශයෙන් ගායනයට යොමු කරන්න,

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

තනි තනි ව හා සාමූහික ව ගායනයට සලස්වා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම :** කිතුනු බැගි ගී එකතුවක් කිරීම සඳහා සිසුන් යොමු කරන්න.

**අතිරේක උදවි :** අන්තර්ජාලය ඇසුරින් කිතුනු බැති ගී ශ්‍රවණයට යොමු කිරීම.

කිතුනු බැති ගී

දෙවන් පහන් මිනි නගා වඩිනු සුදතුනේ හද පුරා වගුරුවා කිතු රැස් ඔබගේ
අසරණුන් ප්‍රියේ වඩිනු වරම් දෙන ප්‍රියේ සිතට එලිය ඔබ අනේ වඩිනු අප සොයා

# මවු ගුණ වරුණ ගීතයක් ගායනය

**නිපුණතාව 5.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග හා පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2.2** : මවු ගුණ ගීයක් ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : මවු ගුණ ගීයක් ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- මවුගුණ ගීයක් ගායනය කරයි.
- මවු සෙනෙහස පිළිබඳ අදහස් දක්වයි.
  තෝරාගත් ගීතයෙහි පද මාලාව අගය කරයි.
- පිය ගුණ ගීත නිර්මාණයට පෙලඹේ.

**ගුණාත්මක යෙදවුම්:**
- තෝරාගත් ගීතය සහිත දෘශ්‍යාධාරක
- එම ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

5.2.1 ක්‍රියාකාරකම සඳහා දෙන ලද උපදෙස් මෙම ක්‍රියාකාරකම සඳහා යොදා ගන්න.
පහත සඳහන් ගීත අතරින් ගීත දෙකක් තෝරා ගන්න.
- මිහිමඬලේ අඳුරු කුසේ
- සොම්නස හෝ සන්තාපය
- නැති බැරි මොහොතක

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- නැළවිලි ගීයක් ගායනය කරමින් පාඩමට පිවිසෙන්න. ඒ පිළිබඳ ව සිසු අදහස් විමසන්න.
  ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ට ඇසීමට සලස්වන්න.
  සිසුන් ගායනයට යොමු කරවන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- ගීතයෙන් කියවෙන අදහස පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. ජාතක කථා ඇසුරෙන් මවු ගුණ පිළිබිඹු වන අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කරන්න. ගීතයට යොදාගත් සංගීතයෙන් මවු සෙනෙහස කොතෙක් දුරට, උද්දීපනය වී ඇත්ද යන්න උදාහරණ සහිත ව ගීතයෙන් ගයා වයා පෙන්වන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- තෝරා ගත් ගීත වාදනය සහිත ව නාදමාලා ව තහවුරු වන තෙක් සිසුන් සමඟ ගායනය කරවන්න.
- තනි තනි ව කණ්ඩායම් කර සිසුන් අගයන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

හැඟීම් ප්‍රකාශ වන අයුරින් ගීතය ගායනය කරයි.
ගීතයෙහි පදමාලාව පිළිබඳ ව අදහස් දක්වයි.
මවු ගුණ ගීත රැස් කරයි.

(මිනිත්තු 05)

**පැවරුම:** මවු ගුණ කියවෙන පාද 4කින් යුත් පද්‍ය පන්තියක් නිර්මාණය කිරීමට සලස්වන්න.

**අතිරේක උදව්:** ගීත හා ප්‍රස්තාර ඇතුළත් පොත්.

# නූර්ති ගීත ගායනය

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : නූර්ති ගීත ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ගායනය කරයි.
- නූර්ති ගීත ශ්‍රවණය කිරීමට කැමැත්තක් දක්වයි.
- නූර්ති ගීත එකතුවක් කිරීමට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ලියූ දෘශ්‍යාධාරය
- හාර්මෝනියම්, තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

''සිරිසඟබෝ'' නූර්තියේ එන ''සිරි සංඝබෝධි මාලිගාවේ දී දැන්'' ගීතය ඉගැන්වීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ. මෙම නූර්තියට පාදක වූ කථා වස්තුව කතාන්තරයක් ලෙස ඉදිරිපත් කර ගීතය පිළිබඳ හැඳින්වීමක් කරන්න. ගුරුවරයාට දැන ගැනීම සඳහා කථා ප්‍රවෘත්තිය ඇතුළත් කර ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ''සිරිසඟබෝ ධර්මිෂ්ඨ රජකු බැවින් දීර්ඝායුෂ තිබේ. අන්ධ බමුණාගේ කීම කව දා නම් සැබෑ වේ ද? මහලු වෙලා මට රජකම් කුමට ද? එබැවින් සේනා රැස් කොට මාලිගා වටලා සිරිසඟබෝ මරා මුළු ලංකාද්වීපයට ම අග රජ වන්නෙමි.
- ගුරුවරයා මෙම දෙබස් ඛණ්ඩය නාට්‍යමය ජවනිකාවක් ලෙස ඉදිරිපත් කරන්න.
- සිසු අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙමින් සාකච්ඡාව මෙහෙයවන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- නූර්ති ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය ගායනා කරන විට, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පාදයෙන් පාදය ගායනය කරවන්න.
- විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රචාරය වන ප්‍රචලිත ගීතයක් බැවින් ගුරුවරයා වාදනය කරන විට සිසුන් ද අසා ඇති නිසා මෙම ගීතය ගැයීමට අවස්ථාව ලබා දෙන්න.
- නාද මාලාව තහවුරු වන තෙක් විවිධ ශිල්ප ක්‍රම භාවිත කරමින් පුහුණු කරවන්න. (මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව, හෝ ගීතය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- රංගනයක් සමඟ ගීතය ගායනයට සුවිශේෂ හැකියා ඇති සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මිහිරි ව ගායනය හා විශේෂ හැකියාවන් සමඟ (රංගනය සමඟ) ගීතය ඉදිරිපත් කළ සිසුන් තෝරා අගය කරන්න.
(මිනිත්තු 05)

**පසුවැඩ :** මෙම නූර්තිය සඳහා පාදක වූ කථා වස්තුව සිසු අභ්‍යාස පොතේ ලියා ගෙන ඒමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්:** ගීතය පටිගත කළ C.D. තැටි
නූර්ති ගීත ශතකය (ලයනල් ගුණතිලක)

# සිරිසඟබෝ කථා පුවත

සංඝතිස්ස, සංඝබෝධි හා ගෝඨාභය යන සහෝදරයන් තිදෙනා අනුරාධපුරයේ රජ කළ රජතුමා හමුවීමට යන අවස්ථාවේ දී පාලමක් ළඟ නැවතී සිටි අන්ධ බමුණෙක් ඔවුන්ගේ පියවර ශබ්දය අනුව තිදෙනා පිළිබඳ ව

- පළමු ව යන තැනැත්තා පළමුව රජ වේ.
- දෙවනු ව යන තැනැත්තා දෙවනු ව රජ වේ.
- තෙවනු ව යන තැනැත්තා තෙවනු ව රජ වේ.

යයි අනාවැකියක් කීය. ඔවු අනුපිළිවෙළින් සංඝතිස්ස, සංඝබෝධි සහ ගෝඨාභය වූහ. අන්ධ බමුණා කී ආකාරයට පළමු ව රජවූයේ සංඝතිස්ස යි. ඉක්මනින් රජවීමට බලාපොරොත්තු වී සිටින ගෝඨාභයගේ අරමුණ වූයේ සංඝතිස්ස මරා දැමීම ය.

සංඝතිස්ස ජම්බු කෑමට ගිජු බවක් දැක්වූ නිසා ජම්බුවලට වස දමා මරනයට පත් කරන ලදී. ගෝඨාභය සංඝබෝධිට රජකම බාර ගන්නා ලෙසට බල කරයි. ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ ද, නැවත ගෝඨාභයගේ බල කිරීම මත රාජ්‍යය බාර ගැනීමට සිදු විය. ධර්මිෂ්ඨ රට පාලනය කළ සංඝබෝධිගේ රාජ්‍ය සමයේ දී රටේ දරුණු නියඟයක් ඇති විය. රජතුමාගේ අධිෂ්ඨානශීලී බව නිසා වැසි ඇති විය.

නියඟයෙන් වූ පීඩාවට වඩා රක්තාක්ෂී නම් යකාගෙන් පීඩා ඇති විය. මෙය රටේ හුදී ජනයාගේ භීතියට හේතුවක් විය. රජතුමා යක්ෂයා කැඳවා මිනිසුන් මරා කන හේතුව විමසීය. ලදී. යක්ෂයා එක් දිනකට එක් මනුෂ්‍යයකු කෑමට ගන්නා බව කරණවැමියා රජතුමාට පවසා ඇත. එය ඇසූ රජතුමා තමාගේ අත කපා ගන්නා ලෙසට යක්ෂයාට අණ කළේ ය. යක්ෂයා එය ප්‍රතික්ෂේප කර යන්නට ගියේ ය.

දැහැමි රජ කෙනෙකු වූ සිරිසඟබෝ දීර්ඝ කාලයක් රජ වුවහොත් තමාට රජ වීමට නොහැකි වේය යන බිය නිසා රජු මැරීමට ගෝඨාභය තීරණය කරයි.

රජු මරන ආකාරය සැලසුම් කිරීම, සංඝබෝධි මාලිගාවේ දී ගයන ගීතයෙන් පැහැදිලි වේ.

මෙම කතා පුවත රසවත් ව කථාන්තරයක් ලෙස ගුරුවරයා සිසුන්ට ඉදිරිපත් කරන්න.

**සිරිසඟබෝ නූර්තිය**
**නීතිඥ ජෝන් ද සිල්වා**
**රාගය - පීළු**

සිරි සංඝබෝධි මාලිගාවේ දී මා
දැක ප්‍රාණේ හානි වෙන්ට බැටදෙන්
අල්ලා බන්දා රන්දා බින්දා
උන්දා කොන්දා ලාමී සින්දා
සැන්දෑ කාලෙ මාලිගාවේ ඉන්නවා සොයා

ධර්මේ ශීලේ රක්නා රාජා ලාමී දිවි නසා
කර්මේ වෙන්නේ පස්සේ හින්දා කිම්ද දෝෂය//
කෝලහාල සිද්ධ වෙන්න කාලෙ බෝ සොඳා
තේජසාර ශීලවන්ත ධර්ම සංඝබෝධි රාජ
භංගකර ලාමි නෑර මාලිගා සොයා

# මද්දලය හා මද්දල් පද

**නිපුණතාව 5.0** : රංග සම්ප්‍රදායේ විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ව ප්‍රායෝගික ව අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2.2** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් ඒවා අගය කරයි.

**ක්‍රියාකාරකම** : මද්දලය හා පද

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** : අවනද්ධ භාණ්ඩ අතුරින් මද්දලය වෙන් කොට හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්:** මද්දලයක් නැතහොත් මද්දලයක් වාදනය කරන රූප සටහනක්, පටිගත කරන ලද මද්දලය වාදනය කරන ලද නාඩගම් ගීතයක්, 2010 වසරේ 8 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 128 සිට පිටු 131 තෙක් ඡායා පිටපත් කළ කියවීම් පත්‍රිකාවක්, ව්‍යාවහාරික සංගීතාත්මක ගීතයක් අඩංගු සී.ඩී. පටයක් හෝ කැසට් පටයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

නාඩගම් ගීත ගායනයේ දී ඒ සඳහා ම වෙන් වූ අවනද්ධ භාණ්ඩයක් පිළිබඳ ව සඳහන් වී ඇත. සිසුන්ට මද්දලය පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබා දීම සඳහා මද්දලයක් සපයා ගැනිමට හැකි වේ නම් එය මහත් රුකුලක් වනුවා නොඅනුමාන ය . මද්දලය යනු දකුණු ඉන්දීය කර්ණාටක සම්ප්‍රදායෙන් මෙරටට හුරුපුරුදු වූ අවනද්ධ භාණ්ඩයකි.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- ව්‍යාවහාරික සංගීතාත්මක ගීතයක් අඩංගු සී.ඩී. පටය සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව සලසන්න.
- එහි තාල වාදනය සඳහා යොදා ගෙන ඇති වාද්‍ය භාණ්ඩය පිළිබඳ ව සිසු අදහස් විමසන්න.
- දෙවනු ව මද්දලය වාදනය කරන ලද නාඩගම් ගීතය ශ්‍රවණය සඳහා යොදා ගන්න.
- එම ගීතයේ මද්දලය වාදනය පිළිබඳ ව සිසුන් හා සාකච්ඡාවක යෙදෙන්න.
- මද්දලයේ ස්වභාවය, එය පිළිබඳ ඓතිහාසික තොරතුරු හා ශිල්පීය අංග පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදා ගන්න. කියවීම් පත්‍රිකාව සහ ඇගයීම් පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කියවීම් පත්‍රිකාවේ ඇතුළත් තාල පද උච්චාරණය කරමින් අතින් තාල තැබීමට උපදෙස් දෙන්න.
- ඇගයීම් පත්‍රිකාවේ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 15)

**පියවර 03**

- කණ්ඩායම් වශයෙන් තාල තැබීමට අවස්ථාව ලබා දෙන්න.
- අහඹු ලෙස කේවල ව තාල තැබීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇගයීම් පත්‍රිකාවට පිළිතුරු සැපයූ කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඇගයීම් පත්‍රිකාවේ ඇතුළත් ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයූ සිසුන් ඉදිරියට ගෙන අගය කරන්න.

(මිනිත්තු 05)

**පැවරුම:** මිතුරන් හා එක් ව මද්දල් වාදනය ගැන සාකච්ඡාවක් කරන්න.

**අතිරේක උදවු:** මද්දලය භාවිත කරන ව්‍යාවහාරික ගීත ශ්‍රවණය කරන්න.

පින් මන්ද රංග භූමියේ - සේනානායක වේරලියද්ද
ඔබ රුසිරියෙන් - එඩ්වඩ් ජයකොඩි
සඳ කිඳුරී මා - ඉන්ද්‍රාණි පෙරේරා

2010 වසරේ 8 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 131 සඳහන් ඇගයීම් පත්‍රිකාව මේ සඳහා ප්‍රයෝජනයට ගත හැකි ය.

# නව නාට්‍ය ගී ගායනය

**නිපුණතාව 5.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්‍ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2.2** : ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් ඒවා අගය කරයි.

**ක්‍රියාකාරකම** : නව නාට්‍ය ගී ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** : නව නාට්‍ය ගිත ගායනය කරමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්:** දීකිරි දීකිරි හා සත්සියක් කපුමල් යන ගීත පටිගත කළ CD හෝ VCD පට හා එම යන්ත්‍ර, තෝරා ගත් ගී පාද ලියන ලද දෘශ්‍ය පත්‍රිකාවක්, 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය. ස්වර පුවරුවක්,

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පළමු වාරයේ නාට්‍ය ගීත දෙකක් ගායනය කර ඇති 8 ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා ව්‍යවහාරයේ පවතින තවත් ජනප්‍රිය නාට්‍ය ගීත දෙකක් තෙවන වාරයට නිර්දේශ වී ඇත. රතු හැට්ටකාරී සහ කුවේණී නාට්‍යයවල දීකිරි දීකිරි ගීතය සහ සත්සියක් කපුමල් ගීතයන් අතරින් ගැළපෙන ගීතයක් තෝරා ගන්න.

| | |
|---|---|
| රතු හැට්ටකාරි නාට්‍යය | කුවේණී නාට්‍යය |
| නිෂ්පාදනය - ලූෂන් බුලත්සිංහල | නිෂ්පාදනය - හෙන්රි ජයසේන |
| සංගීතය - ඔස්ටින් මුණසිංහ | සංගීතය - එච්.එච්.බණ්ඩාර |
| ගී පද - ලූෂන් බුලත්සිංහල | |

**පාඩම සංවර්ධනය :**

**පියවර 01** තෝරා ගත් ගීතයට ගැළපෙන පරිදි ලංකාවේ ඓතිහාසික කථා පුවතක් වූ විජය කුවේණී සම්බන්ධය පිළිබඳ ව සිසුන්ගේ මතකය අවදි කරන්න. නැතහොත් රතු හැට්ටකාරී නාට්‍යය පිළිබඳ ව කෙටියෙන් විමසන්න. සම්පත් පරිහරණය කිරීමේ පහසුකම් ඇත්නම් තෝරා ගත් ගීතය ශ්‍රවණය කිරීමට හෝ රූප රාමු සහිත නම් නැරඹීමට හෝ සලස්වන්න. ගීතය අයත් නාට්‍ය, පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. ඒ සඳහා දායකත්වය සැපයූවන් පිළිබඳ ව විස්තර කරන්න. ගීතය හොඳින් ශ්‍රවණය කිරීමෙන් අනතුරු ව ස්වර පුවරුව හෝ වෙනත් සංගීත භාණ්ඩයක ආධාරයෙන් රසවත් ව ගායනය කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- පන්තිය කොටස් තුනකට බෙදන්න. එක් කණ්ඩායමක් ගායනය සඳහාත්, දෙවෙනි කණ්ඩායම රංගනය සඳහාත්, ගුරුවරයා සමඟ සහාය වාදනයේ යෙදිය හැකි සිසුවකු හෝ කිහිප දෙනෙකු හෝ තුන්වැනි කණ්ඩායම සඳහාත් බෙදා ගන්න.

- සමස්ත පන්තියට ම ගුරුවරයා විසින් ගායනය පුහුණු කරනු ලැබෙන විට රංගනය සඳහා තෝරාගත් කණ්ඩායමට ගී පද අරුතට ගැළපෙන ලෙස අංග චලන සකසා ගැනීමට උපදෙස් දෙන්න.

**පියවර 03** එක් එක් කණ්ඩායමට පැවරූ කාර්ය පිළිබඳ ව ඔවුන්ගේ අත්දැකීම් සමස්ත පන්තියට ම ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ව හා මිහිරි ව ගායනය කළ කණ්ඩායම් හා තනි තනි ව ගායනය කළ සිසු/සිසුවියන් පන්තියට හඳුන්වා දී අගයන්න.

(මිනිත්තු 05)

**පැවරුම:**

- වාර අවසාන විවිධ ප්‍රසංගය සඳහා මෙය යොදා ගැනීමට සිසුන් මෙහෙයවන්න.
- මේ ගීතය ගායනයේ සුවිශේෂී දක්ෂතා දක්වූ ළමයින් හඳුනා ගෙන ඔවුන් සංගීත තරග සඳහා යොදා ගැනීමට කටයුතු කරන්න.

**අතිරේක උදව්:** **රතු හැට්ටකාරී නාට්‍යය - නිෂ්පාදනයඃ- ලූෂන් බුලත්සිංහල**

දීකිරි දීකිරි ගෙනාවා දීකිරි - මිහිපිට කාටත් ගුණ දෙන දීකිරි
පැටියා මෝරපු දෙනගෙන් ගත් කිරි-හොඳ හැටි උණු කර හින්දා ගත් කිරි
නැවුම් මුට්ටියේ වත් කළ මේ කිරි - පණමට ලාභයි මං දෙන මේ කිරි
කිරි විකුණාලා කාසි සොයන්නයි - අනාගතේ මාලිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි -මගෙ මංගල්ලෙට ඔහෙලත් එන්නයි
හිස මගෙ දෙදරයි දෙපා රුදා දෙයි - රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පණමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි - මුට්ටිය බිඳුණොත් ඔක්කොම ඉවරයි.

**කුවේණි නාට්‍යය**

සත් සියක් කපුමල් රැගෙන මම - සත් සියක් සුදු කෙඳි රැගෙන මම
සත් සියක් කපු පිළි වියන මම - සත් සියක් දෙන පලඳිතේ //

සත් සියක් රත් මල් රැගෙන මම - සත් සියක් රත් හුය රැගෙන මම
සත් සියක් මල් දම් ගොතන මම - සත් සියක් ගෙල පලඳිතේ
සත් සියක් මායා බෙලෙන් මම - සත් සියක් බන්ධන බෙලෙන් මම
සත් සියක් සක්වළ සොයා මම - ගෙන්වූ කුමරුන් අද එතේ ...

# රිද්ම රටාවකට ස්වර යෙදීම

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි.

**ක්‍රියාකාරකම** : රිද්ම රටාවකට ස්වර යෙදීම

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- තනු නිර්මාණයේ සරල අවස්ථාවක යෙදී අත්දැකීම් ලබයි.
- සරිගමපධනි යන ස්වර ඇසුරින් කරන තනු නිර්මාණයක දී ''ස'' ස්වර අත්‍යවශ්‍ය බව පිළිගනියි.
- එක ස්වරයකින් වුවත් තනුවක් සෑදිය හැකි බව පිළිගනියි.
- තනුව ඇරඹීමේ දී කෙසේ වෙතත් අවසානයේ දී ''ස'' ස්වරයෙන් අවසන් වීම බොහෝ ගීතවල සම්ප්‍රදායය බව පිළිගනියි.
- සරල තනුවක් නිර්මාණය කර ආත්මාභිමානයක් ලබයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සරල රිද්ම රටා කිහිපයක් ලියූ ප්‍රදර්ශන පුවරු කිහිපයක්.
- සර්පිනාවක් හා තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සංගීත ඛණ්ඩයක් නිර්මාණය කිරීම සඳහා සංගීතය පිළිබඳ ව මනා පරිචයක් අවශ්‍ය වේ. එහෙමත් එම හැකියාව ලබා ගැනීමට නම් ඒ පිළිබඳ ව අත්දැකීම් අවශ්‍ය වේ. එම සරල අත්දැකීම ලබා දීම මෙම පාඩමේ අරමුණ යි. මෙහි දී තනුවේ මිහිරි අමිහිරි භාවය එතරම් වැදගත් කොට සැලකිය යුතු නැත. රිද්ම රටාවකට අනුකූල ව ස්වර යෙදීමේ මූලික ඉගි හඳුන්වා දීම ප්‍රමාණවත් ය.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- ඇමුණුම් අංක 01 පළමු වන ස්වර ප්‍රස්තාරය සර්පිනාවෙන් වාදනය කොට සිසුනට ඇසීමට සලස්වා තනුවක් යනු කුමක් දැයි සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නැවත ඇමුණුම් අංක 01හි ස්වර ප්‍රස්තාර වාදනය කරමින් සිසුනට ආඝාතය තැබීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒවායේ මාත්‍රා බෙදෙන ආකාරය සාකච්ඡා කොට මේ ආකාරයට විවිධ රිද්ම රටා ඔස්සේ තනු නිර්මාණය කළ හැකි බව වටහා දෙන්න.

(මිනිත්තු 15)

**පියවර 02**
- සිසුන් කණ්ඩායම් 3ට බෙදන්න.
- ඇමුණුම් අංක 02 රිද්ම රටා පත්‍රිකාව බැගින් එම කණ්ඩායම් 3ට බෙදා දෙන්න.
- කැමති ස්වරයකින් පටන් ගෙන තමන් කැමති අයුරින් ස්වර සටහන් කිරීමට ඔවුනට අවස්ථාව ලබා දෙන්න.
- තනුවක් අවසාන කිරීමේ දී ''ස'' ස්වරයෙන් අවසන් කිරීම සම්ප්‍රදායය බවත් ස්වර යෙදීමේ දී ඉතා විශාල පරතරයක් ඇති ව නොයොදන ලෙසත් (ස-රි / ග - ධ / ආදි වශයෙන්) උපදෙස් ලියා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03** සිසුන් විසින් කණ්ඩායම් වශයෙන් නිර්මාණය කරන ලද ස්වර ප්‍රස්තාර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 25)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

දක්ෂ ලෙස නිර්මාණය කළ කණ්ඩායම් තෝරා නැවත වාදනය කිරීමට උපදෙස් දී අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම** ශුද්ධ ස්වර මෙන් ම කෝමල, තීව්‍ර ස්වර යොදමින් තනු නිර්මාණය කළ හැකි බව පවසා ශුද්ධ ම වෙනුවට තීව්‍ර මධ්‍යමය යොදා තනුවක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න; යොදා ගැනීමට සිසුන් මෙහෙයවන්න.

### ඇමුණුම් අංක 01

01. ස - ස | ස ස - | ස ස ස | ස ස - |
ස - ස | ස ස - | ස - - | - - - |
රි - රි | රි රි - | ස - - | ස ස - |
රි - රි | රි රි - | ස - - | - - - |

02. ස රි ස | ස රි ස | රි - - | - - - |
රි ග රි | රි ග රි | ග - - | - - - |
ග ම ග | ග ම ග | ම - - | - - - |
ප ම ග | ම ග රි | ස - - | - - - |

03. ස රි ග ම | ග - - - | ග ම ප ධ | ප - - |
ප ධ නි ස̇ | ධ - - - | ප ම ග රි | ස - - |

### ඇමුණුම් අංක 01

01. X - | X X | X X | X - |
X X | X X | X - | - - |
X - | - X | X X | X - |
X X | X - | X X | X - |

02. X X X | X - - | X X X | X - - |
X X X | X X - | X X - | X - - |
X - - | X - X | X X X | X - - |
X - X | X - X | X - - | - - - |

03. X X X - | X X X - | X X X X | X - - - |
X X X - | X X X - | X - - - | - - - - |
X - X X | X X X - | X X X X | X - - - |
X - X - | X - X X | X X X X | X - - - |

**ක්‍රියාකාරකම 43**

# පද කොටස්වලට තනු යෙදීම

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.
**නිපුණතා මට්ටම 1.1** : ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි.
**ක්‍රියාකාරකම** : පද කොටස්වලට තනු යෙදීම
**කාලච්ඡේද සංඛ්‍යාව** : 03
**ඉගෙනුම් පල** :
- ගීතයකට තනු නිර්මාණය කිරීමේ මූලික කුසලතා වර්ධනය කර ගනියි.
- ගීතයක් පද ප්‍රස්තාර කිරීමට පෙලඹෙයි.
- ගීතයක පදවලට ස්වර යෙදීමට පෙලඹෙයි.
- ගීතයට, සරල තනුවක් නිර්මාණය කොට සතුටක් ලබයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාවක්
- ඇමුණුම් අංක 01හි කාර්ය පත්‍රිකා 03
- ඇමුණුම අංක 02හි කාර්ය පත්‍ර 03
- ඇමුණුම අංක 03හි දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මෙහි දී සිසුන් ඉතා සරල ව ගී පද පේළි කිහිපයකට තනුවක් නිර්මාණය කිරීම අපේක්ෂාව යි. තනුවේ මිහිර එතරම් වැදගත් නොවේ. අවශ්‍ය වනුයේ ගීතයකට තනුවක් නිර්මාණය කිරීමේ මූලික ප්‍රවේශය සිසුන් හට ලබා දීමයි. එහෙත් ගී තනුවක ඇති ලක්ෂණ පිළිබඳ ව සිසුන් දැනුම්වත් කිරීම වැදගත් වේ.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ඇමුණුම් අංක 03හි ගීතය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය ගායනය කර සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- මෙය ස්වර 2කින් නිර්මාණය කරන ලද ගී තනුවක් බව සාකච්ඡා කරන්න.
- ගීතයට තනුවක් නිර්මාණය කිරීමේ දී මුලින් ම ගී පද ප්‍රස්තාර කළ විට පහසු බව පවසන්න. (මිනිත්තු 15)

**පියවර 02**
- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ඇමුණුම 01හි කාර්ය පත්‍රිකා බෙදා දී එම ගී පාදවලට ස්වර යෙදීමට උපදෙස් ලබා දෙන්න.
- පළමු ගීතයට ''සරිගමප'' යන ස්වර පමණක් ඇසුරු කරගෙන ස්වර යොදන ලෙස අංක 01 කණ්ඩායමට උපදෙස් ලබා දෙන්න.
- දෙවෙනි ගීතයට මධ්‍ය සප්තකය පමණක් ඇසුරු කරමින් ස්වර යොදන ලෙස අංක 02 කණ්ඩායමට උපදෙස් ලබා දෙන්න.
- තුන් වන ගීතය ගීතයට කෝමල <u>ග</u>, <u>නි</u> ඇසුරු කර ගනිමින් තනුවක් නිර්මාණය කිරීමට අංක 02 කණ්ඩායමට උපදෙස් ලබා දෙන්න.
- ඇමුණුම අංක 02 කාර්ය පත්‍රිකාව පොදුවේ කණ්ඩායම් 3ට ම බෙදා එම ගීතයේ පද ප්‍රස්තාර කිරීමට උපදෙස් ලබා දෙන්න.
- පද ප්‍රස්තාර කරන ලද ගීතයට තනුවක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. (මිනිත්තු 65)

**පියවර 03** සිසුන් කණ්ඩායම් වශයෙන් හා පොදුවේ නිර්මාණය කරන ලද තනු, ගුරුවරයා සර්පිනාව යොද ගෙන ගායනය කරන්න. (මිනිත්තු 70)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- කණ්ඩායම් වශයෙන් නිර්මාණය කළ මිහිරි තනු වයමින් අගයන්න.
- පද ප්‍රස්තාරය සම ගින් යෙදූ තනු විමසා නිර්මාණාත්මකව යෙදූ සිසුන් තෝරා අගයන්න. (මිනිත්තු 10)

**පැවරුම** නිදහස් කාලච්ඡේදවල දී ගී තනු නිර්මාණය කිරීමට උපදෙස් ලබා දෙන්න.

**ඇමුණුම් අංක 01**

01.

| | | | |
|---|---|---|---|
| ර ළ | පෙ ළ | සු සු | දු s |
| න ට | න ට | දූ ග | ලූ s |
| වෙ ර | ළ ට | පෙ ර | එෑ s |
| සු දු | පෙ න | බු බු | එෑ s |

02.

| | | | |
|---|---|---|---|
| ස ඳ එ | ළි යේ s | කො ඳ පි | බි ඳේ s |
| නී s ල | ජ ලේ s | රැ ස් පැ | ති රේ s |
| කොඳපි | ස හ ම | නා s සු | ළ ගේ s |
| සු ව ඳි | න් ද ස | අ ත නැ | හැ වේ s |

03.

| | | | |
|---|---|---|---|
| අම්මේ s | ඔබගේ s | බිවු කිරි | කඳුළේ s |
| මු දු ර ස | සුවඳේ s | වෙළෙනෙමි | නිබඳේ s |
| දෙසවන් | පිනවූ s | නැළැවිලි | ගී s යේ s |
| සුමුදුස | රින්මා s | ග ත සි ත | නැහැවේ s |

**ඇමුණුම් අංක 02**

01. සමනොළ මුදුනින්
පැන ආ ගඟුලේ
මුදු බඳ නළවා
කොහෙ දෝ යන්නේ

02. මී මැස්සෝ මී මැස්සෝ
උදේ රැයින් අවදි වෙලා
මල් රොන් සුනු සොය සොයා
යනවාදෝ පියාඹලා

**ඇමුණුම් අංක 03**

(1)

| | | | |
|---|---|---|---|
| ස -- සසස | ස -- සසස | රි-- රිරිරි | ස-- - - - |
| ගී ss ගයන | මේss කුරුළු | යාss එවන් | හාss sss |
| රි-- සසස | රි-- සසස | රි-- සසස | රි--- --- |
| මේss අහසෙ | පා ss වෙන්න | බැss අපට | බැss sss |
| ස-- සසස | ස-- සසස | රි-- රිරිරි | ස-- --- |
| කෝss එවන් | පියාs පත්s | නැss අපට | නැss sss |
| ස-රි සස- | සසරි සස- | රි-- රිරිරි | ස-- --- |
| යාsළු වනේs | පියාs ඹන්න | ආss දරය | දී ss sss |

(2)

| | | | |
|---|---|---|---|
| වෙ ර | ළ ට | පෙ ර | එෑ s |
| සු දු | පෙ න | බු බු | එෑ s |

# වාර්ෂික විවිධ ප්‍රසංගය

**නිපුණතාව 3.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන හා ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.4** : ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි.

**ගුණාත්මක යෙදවුම්:**
- එක් එක් ප්‍රසංග අංකයට ගැළපෙන ලෙස සකස් කර ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- වාද්‍ය භාණ්ඩ

**ඉගෙනුම් පල:**
- ප්‍රාසංගික අත්දැකීම් ලබමින් සතුටු වෙයි.
- සංගීත විෂය ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- වේදිකාව පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- විවිධ පෞරුෂ ගුණාංග වර්ධනය කර ගනියි.
- ගායන වාදන තනි ව ඉදිරිපත් කිරීමට පෙලඹෙයි.
- මෙතෙක් උගත් ගායන වාදන හැකියා ප්‍රාසංගික ව ප්‍රදර්ශනය කරයි.
- ඉදිරිපත් වීම, සංවිධානය හා මෙහෙයවීම වැනි ගුණාංග ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

8 ශ්‍රේණියට නියමිත ක්‍රියාකාරකම් ඇසුරෙන් විවිධ ප්‍රසංගය සඳහා පාසල් වේදිකාවට ගැළපෙන ලෙස ප්‍රසංග අංක සැලසුම් කරගන්න.